# බුදුසරණ

ධර්ම භාණ්ඩාගාරයක් - සාරධර්ම සංග්‍රහයක් | www.budusarana.lk | Email:budusarana@lakehouse.lk

ශ්‍රී බුද්ධ වර්ෂ 2565 ක් වූ වප් පුර පසළොස්වක පෝද 2021 ඔක්තෝබර් 20 බදාදා BUDUSARANA WEDNESDAY OCTOBER 20, 2021

ප්‍රවෘත්ති පත්‍රයක් වශයෙන් ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කරන ලදී. 56 වන කාණ්ඩය, 17 වන පත්‍රය , පිටු 36 ආරම්භය 1965 - 06 - 13 මිල රු. 40.00




බුදුරජාණන් වහන්සේ තව්තිසා දෙව් ලොව සිට සංකස්ස පුරයට වැඩමවීම



# චීවර මාසය ඇරඹෙන අසිරිමත් වප් පොහෝදා

**වස් සාර මාසයේ අවසාන මාසය ආරම්භ වන්නේ වප් පුර පසළොස්වක පොහොය දිනයෙනි. කඨින චීවර පොහොයෙන් ඇරඹෙන හෙයින් මේ මාසය චීවර මාසය ලෙස ද ව්‍යවහාරයට එක්ව ඇත. කඨිනය හැර වෙනත් ඕනෑම බෞද්ධ පූජෝත්සවයක් වර්ෂයේ නියම කර ගත් අභිමත් දිනක දී හෝ, වර්ෂයේ කිහිප අවස්ථාවක දී ම හෝ සිදු කළ හැකි ය. එහෙත් කඨින චීවර පූජා පුණ්‍ය මහෝත්සවයක් සිදු කළ හැකි වන්නේ එක් වසරක් තුළ, එක් තැනෙක දී, එක් වරක් පමණෙකි.**




### දේවාවරෝහණය

සත් වැනි වස් කාලය තව්තිසා දිව්‍ය ලෝකයෙහි ගත කළ බුදුරජාණන් වහන්සේ සංකස්ස නගර ද්වාරයට වැඩම කළේ ද වප් පුර පසළොස්වක පොහොය දිනෙක ය. එදා මහා පිරිසක් සංකස්ස නගර ද්වාරයට එක්රැස් වූ හ. දිව්‍ය බ්‍රහ්ම සමූහයාගේ පංචතූර්ය වාදනයන් ය. දසත පැතිරුණු සාධු නාදයන් ය. මේ අසිරිමත් සිදුවීම් මැද අප්‍රමාණ බුද්ධ ශ්‍රීයෙන් තථාගතයන් වහන්සේ සංකස්ස නගර ද්වාරයට වැඩම කළහ. ඒ අසිරිය දුටු සියල්ලෝ ම මතු බුදු වන්නට ම ප්‍රාර්ථනා කළහ. දේවාවරෝහණ නම් වූ මෙම මහා පූජෝත්සවය දැකීමෙන් හා බුදුරදුන් හා සැරියුත් මාහිමියන් අතර වූ ප්‍රශ්න විසඳුම් සාකච්ඡාව ශ්‍රවණය කිරීමෙන් අපමණ ප්‍රසාදයට පත් මෛත්‍රෙය බෝසතාණන් වහන්සේ අප ගෞතම බුදුරජාණන් වහන්සේගේ සසුනෙහි පැවිදි බවට පත් වූයේ ද වප් පොහොය දිනෙක ය.

> “මේ අසිරිමත් සිදුවීම් මැද අප්‍රමාණ බුද්ධ ශ්‍රීයෙන් තථාගතයන් වහන්සේ සංකස්ස නගර ද්වාරයට වැඩම කළහ. ඒ අසිරිය දුටු සියල්ලෝ ම මතු බුදු වන්නට ම ප්‍රාර්ථනා කළහ.”

### දූත පිරිසක් දඹදිවට

අනුබුදු මිහිඳු මහරහතන් වහන්සේගේ නියමයෙන් දේවානම් පියතිස්ස රජුගේ සංදේශයත්, තුටු පඬුරුත් රැගෙන ලක්දිව අරිට්ඨ කුමරු ප්‍රමුඛ රාජකීය දූත පිරිසක් දඹදිව පැළලුප් නුවර සිටි ධර්මාශෝක අධිරාජයා වෙත පිටත්කොට හැරියේ ත් වප් පොහොය දිනෙක ය. එම දූත චාරිකාවෙහි අරමුණ වූයේ සංඝමිත්තා මහරහත් තෙරණිය සිරිලකට වැඩම කරවා ගෙන ලක්දිව පැවිද්ද බලාපොරොත්තුවෙන් සිටි අනුලා දේවිය ප්‍රමුඛ කුල කතුන් සසුන්ගත කරවීම යි.



**ඌරුගමුවේ අස්සජී හිමි**

### ථූපාරාම විනය සංගායනාව

අනුබුදු මිහිඳු මහරහතන් වහන්සේ ප්‍රමුඛ මහා අරිට්ඨ මහරහතන් වහන්සේ ඇතුළු මහ රහතන් වහන්සේලා සැට අට නමක් දහසක් භික්ෂූන් වහන්සේලා ද සමඟ ථූපාරාම විහාර මධ්‍යයට රැස්වූහ. එහිදී වප් පුර පසළොස්වක පොහෝ දා විනය සංගායනාව ආරම්භ කළ හ. මෙම ථූපාරාම විනය සංගායනාව පැවැත්වීමට කටයුතු සූදානම් කළේ දේවානම්පියතිස්ස මහ රජු ය.

### වස්සාන සමය

දඹදිව සමාජ පරිසරය තුළ ඉතා ඈත අතීතයේ පටන් ම හේමන්ත, ගිම්හාන හා වස්සාන යනුවෙන් වසරකට ඍතු තුනක් පැවතිණි. වසන්ත ඍතුවක් ද මීට එක්කොට ඇතැම් තැනෙක ඍතු සතරක් ලෙස ද දැක්වෙයි. වස්සාන ඍතුවේ වැසි සාර මාසය අතුරෙන් මුල් මාස තුන තුළ උපසපන් භික්ෂූන් වහන්සේලා වස් සමාදන් ව වැඩ සිටිති. සෑම වසරක ම ඇසළ පොහෝ දා සිට වප් පොහෝදා දක්වා යෙදෙන වස් කාලය සැදැහැවතුන්ගේ පුණ්‍ය කාලය යි. වස් පින්කම් මාලාව අවසන් වනුයේ කඨින චීවර පූජා පුණ්‍ය මහෝත්වසයෙනි. වප් පුර පසළොස්වක පොහෝ දා සිට ඇරඹෙන කඨින මහා පින්කම් සිදු කළ හැකි අවසාන දිනය වනුයේ ඉල් පුර පසළෙ ාස්වක පොහොය දිනය යි.

### පරම අවිහිංසාවාදය

බුද්ධ කාලීන දඹදිව සමාජ පරිසරය තුළ විවිධ ආගම් හා දර්ශනවාදයන් ඉගැන් වූ ආගමික නායකයින් විශාල සංඛ්‍යාවක් දැකගත හැකි විය. ඒ සියලූ ඉගැන්වීම් කැටිකොට ගත් කල දෙ සැටක් මිත්‍යා දෘෂ්ටීන් පැවතිණ. එකී ආගමික නායකයින් අතර වඩාත් ප්‍රකට ව හා පිරිස් බලයක් සහිත ව සිටියේ ෂට් ශාස්තෘවරුන් ය. ඔවුන් අතර ද වඩාත් ම ඉදිරියෙන් සිටියේ නිගණ්ඨනාථපුත්තතුමා ය. ඔහු ගේ ප්‍රධාන ඉගැන්වීම වූයේ “පරම අවිහිංසාවාදය“යි.

ගහකොළ මත සේ ම තණකොළ මත ද ඒකීන්ද්‍රිය ප්‍රාණයක් ඇතැයි ඔහු ඉගැන්වී ය. ගස්වල අතු රිකිලි පවා කඩා දැමීම පාපයක් යැයි සැලකී ය. එසේ ම ජලය තුළ ද ක්ෂුද්‍ර ජීවීන් සිටින බව පහදා දුන් ඔහු වැසි ජලය හා තණ කොළ පයින් පෑගීම ද බලවත් පාපයක් සේ දුටුවේ ය. මෙම ඉගැන්වීම තුළ නිගණ්ඨනාථපුත්තතුමා ස්වකීය ශ්‍රාවකයන්ට හා අනුගාමිකයන්ට අධික වැසි සහිත වස්සාන සමය තුළ ගමන් බිමන් තහනම් කොට තිබිණ. මෙම පරම අවිහිංසාවාදී ඉගැන්වීම එකල දඹදිව වැසියන් ගේ සිත් තුළට තදින් ම කිඳා බැස තිබූ හෙයින් මෙකී ප්‍රතිපත්ති ඔවුහු ඇඩි ව අනුගමනය කළහ.

### වස්සානයේත් ධර්ම චාරිකා

බුදුරජාණන් වහන්සේ ස්වකීය ශ්‍රාවකයන්හට දේශනා කර තිබුණේ ජීවිතයේ පරම සංසඳීම වූ නිවන සාක්ෂාත් කර ගැනීමට සේ ම අන් ජනතාවට ද එම මාර්ගය කියාදීම සඳහා අප්‍රමාදී ව ක්‍රියා කරන ලෙස යි. ප්‍රථම රහතන් වහන්සේලා සැට නම අරහයා දුන් ‘චරථ භික්ඛවෙ චාරිකං...‘ යනාදී එක් උදාහරණයකි. මෙම අවවාදය මැනවින් ක්‍රියාත්මක කළ භික්ෂූන් වහන්සේලා අව්ව, වැස්ස, රාත්‍රිය, දවාල සහ වෙහෙස මහන්සිය ගැන නොතකා අතර හේමන්තය ද, ගිම්හානය ද, වස්සානය ද යන කරුණු කෙරෙහි ද සැලකිල්ලක් නො දැක්වූහ. ඒ අනුව වස්සාන සමය තුළ දී භික්ෂූන් වහන්සේලා වැසි ජලය හා තණකොළ පාගමින් ගම්, නියම්ගම් හා නගර සිසාරා ධර්ම දූත චාරිකාවෙහි නිරත වූ හ. මෙම ක්‍රියාව පරම අවිහිංසාවාදී ප්‍රතිපත්තියකින් යුක්තව ජීවත් වූ ජනතාවක ගේ ඇඩි විමතියකට හේතු වුණි.

මෙම කරුණු මත පිහිටා ඇතැම් හු භික්ෂූන් වහන්සේලාට අවමන් කළ හ. නින්දා කළ හ. දෙස් කීහ. දිගින් දිගට ම මෙම බස් කන වැකීමත් සමගම භික්ෂූන් වහන්සේලා බුදුරජාණන් වහන්සේට මෙය සැළකර සිටිය හ.

ඉතිරිය 34 පිටුවට ...

# සතුටින් ජීවත්වීමට නිවැරැදි ව ලෝකය දකින්න



**පේමතෝ ජායතී සෝකෝ –**
**පේමතෝ ජායතී භයං**
**පේමතෝ විප්පමුත්තස්ස –**
**නත්ථි සෝකෝ කුතෝ භයං**

සමාජයේ ජීවත්වන බොහෝ අය විවිධ කරුණු මුල් කොට ශෝකයෙන් කල් ගෙවති. එසේත් නොවේ නම් බියෙන් පසු වෙති. මෙය දුප්පත් පොහොසත් ආදී භේදයන්ගෙන් තොර ව බොහෝ දුරට සිදුවන දෙයකි.

බුදුරදුන්ගේ ප්‍රධාන දායිකාව වූ විශාඛා උපාසිකා මාතාවට දත්තා නම් මිනිබිරියක් වූවා ය. විශාඛාවන්ගේ අවවාද නිරන්තරයෙන් ලබා ජීවත් වූ ඒ මිනිබිරිය බුදුරදුන්ටත්, සංඝයා වහන්සේටත් මහත් ගෞරවයෙන් හා සැදැහැ සිතින් ඇප උපස්ථාන කරමින් සිටියදී හදිසියේ ම කලුරිය කළාය. එයින් ඇති වූ දුක් වේදනාව ඉවසා ගත නො හැකි වූ විශාඛාව හඬා වැලපෙමින් බුදුරදුන් වෙත ගොස් ඒ පුවත දැන්වූවා ය.


ඉහත සඳහන් කරුණ නිමිති කොට බුදුරදුන් දේශනා කොට වදාළ ගාථාව මෙහි ආරම්භයෙහි සඳහන් විය. ප්‍රේමය හෙවත් ප්‍රිය භාවය හේතු කොට ගෙන ශෝකය හා බිය උපදින බවත්, ඒ ප්‍රිය භාවයෙන් යම් කෙනකුට මිදිය හැකි නම් බිය පමණක් නොව ශෝකය ද නැති කොට සතුටින් ජීවත් විය හැකි බවත් එයින් පැහැදිලි කොට දුන්හ.

එදා විශාඛාව දුක් වූයේ තම මිනිබිරිය නැති වීම නිසා ය. සියලු සම්පත් ඇතිව ජීවත් වූ කොසොල් රජතුමා දිනක් බුදුරදුන් වෙත කුඩා ළමයකු මෙන් අඬමින් පැමිණියේ අවුරුදු එකසිය විස්සක් ආයු විඳ මිය ගිය තම මිත්තනිය නැති වීමේ දුක ඉවසා ගැනීමට නො හැකි වීම නිසා ය. පටාචාරා තම මවුපියන් ඇතුළු දරුවන් නැති වීමෙන් බලවත් ලෙස දුක් වූවා ය. අනිත්ථිගන්ධ කුමාරයා නොකා, නොබී මහත්සේ දුක් වූයේ තම දෙ ඇසින් කිසි විටකත් නො දුටු තමා හා අතිනත ගැනීමට සිටි කාන්තාව නැති වීම නිසා ය.

වර්තමාන සමාජයෙහි රිය අනතුරු වැනි හදිසි විපත් නිසා හෝ රෝගාබාධයන් නිසා හෝ වයසට පත්වීම නිසා හෝ තමන්ගේ කෙනකු මිය ගිය කල්හි හෝ මහත් දුකට පත් වී සිටින අයට එදා බුදුරදුන් විශාඛාවන් සමඟ කළ සාකච්ඡාව සිහියට ගත හොත් තම වේදනාවන් බොහෝ දුරට තුනී කර ගත හැකි වෙයි.


විශාඛාවෝ සත් හැවිදිරි වියෙහි දී ම සෝවාන් භාවයට පත් වූ ආදර්ශ සම්පන්න ප්‍රබුද්ධ කාන්තාවකි. දත්තා නම් මිනිබිරිය නිමිති කොට අඬා වැළපුනු අවස්ථාවෙහි සැවැත් නුවර ජනගහණය කොපමණද?යි බුදුරදුන් ඇසූ පැනයට කෝටි සතක් පමණ යැයි ඇය පිළිතුරු දුන්නා ය. ඒ සැම දෙන මිනිබිරිය හා සමාන වන්නේ නම් කැමති ද?යි බුදුරදුන් ඇසූ ප්‍රශ්නයට ඇගේ පිළිතුරු වූයේ තමා මහත් සේ සතුටු වන බවයි. මේ නුවරදිනකට කී දෙනෙක් කලුරිය කෙරෙත්ද?යි ඇසූ ප්‍රශ්නයට බොහෝ දෙනෙක් මිය යන බව ඇය සඳහන් කළා ය. විශාඛාවනි, එසේ වූ කල්හි මෙ නුවර වාසය කරන සැම දෙනා ම දත්තා මිනිබිරිය හා සමාන වන නිසා ඔබට දිනපතා මේ අන්දමට අඬා වැළපෙමින් කල් ගත කිරීමට සිදු වන බව බුදුහු අවබෝධ කොට දුන්හ.

සසර ගමන ගැන සලකන විට නෑ නොවූ කෙනකු මේ තුන් ලොව නො මැති බව බුදු පියාණෝ වරක් පෙන්වා දුන්හ. මේ අනුව අපේ අය නැතිවීම ගැන කොපමණ බිය විය යුතුද? ශෝක කළ යුතුද? යන්න සිතා බලා ‘අපේය’ යි ගන්නා තද බැඳීමෙන් සිත මුදවා ගෙන කටයුතු කිරීම සැනසිලිදායක ජීවිතයකට මඟ බව සිතට ගන්න.



කොළඹ ආනන්ද විද්‍යාලයේ
විශ්‍රාමික සහකාර විදුහල්පති
සද්ධර්ම කීර්ති ශ්‍රී ත්‍රිපිටකාචාර්ය
**දිවියාගහ යසස්සි නා හිමි**


පාණදුර - ගොරකාන ශ්‍රී ගංගාතිලක පුරාණ විහාරස්ථ පුණ්‍ය භූමියේ ඉදිකෙරෙන



ශ්‍රී ලංකාවේ ගර්භය තුළට පිවිසිය හැකි ප්‍රථම, ඓතිහාසික
ගොරකාන
“සීවලි මහා සෑයට” ඔබත් දායක වන්න.

පින්වත් ඔබගේ පුණ්‍යාධාර “සීවලි මහා සෑය අරමුදල” නමින් පහත ඇති බැංකු ගිණුමකට බැර කළ හැකිය. එලෙස බැංකු ගිණුමකට ඔබේ පුණ්‍යාධාරය බැර කොට ඇති බව සනාථ කිරීම පිණිස එම බැංකු ලදුපත හෝ එහි පැහැදිලි පිටපතක් සමඟ, ඔබේ නම, ලිපිනය සහ දුරකථන අංකය පැහැදිලි අකුරින් ලියා පහත ලිපිනයට තැපැල් කරන්න. එහි විනිවිදභාවය සඳහා පුණ්‍යානුමෝදනා පතක් තැපැල් මගින් ඔබ වෙත එවනු ලැබේ. විහාරස්ථානයට පැමිණෙන පින්වතුන් හට “සීවලි මහා සෑය අරමුදල - කාර්යාලයය” ට පුණ්‍යාධාර ලබාදිය හැක.

*තෙරුවන් සරණයි !*


ගිණුමේ නම : සීවලි මහා සෑය අරමුදල

සම්පත් බැංකුව ගිණුම
1151 6100 4890

මහජන බැංකුව ගිණුම
148-2-001-6-0038551

ලංකා බැංකුව ගිණුම
8 5 5 7 7 4 3 9

සෙලාන් බැංකුව ගිණුම
0400-13126762-101




සියලු විමසීම් :
ගරු සභාපති, පූජ්‍ය ලියන්ගහවත්තේ නන්ද ස්ථවිර,
සීවලි මහා සෑය අරමුදල,
ශ්‍රී ගංගාතිලක පුරාණ විහාරය, ශ්‍රී ධම්මානන්ද මාවත, ගොරකාන, කෙහෙල්වත්ත 12550.

විහාරස්ථානය :
☎ - 038 22 97 914

නායක හිමි :
071 250 44 46

*තණ්හාය ජායතී සොකො*
*තණ්හාය ජායතී භයං*
*තණ්හාය විප්පමුත්තස්ස*
*නත්ථි සොකො කුතො භයං*

# අද ඇති දේ හෙට නැති වෙනවා ලෝ දහම තේරුම් ගන්න



පින්වතුනි,

**බුදුරජාණන් වහන්සේ පන්සාළිස් වසක් පමණ වූ තම සම්බුද්ධ ජීවිතය පුරාවට ම හේතු සම්පත් ඇති විවිධ පුද්ගලයන් උදෙසා ධර්මය දේශනා කළහ. මෙම භයංකාර වූ සසර කතරින් සත්වයන් එතර කිරීමට අප්‍රමාණ කැප කිරීම් සිදු කළ ඒ උතුම් ශාස්තෘවරයාණන් වහන්සේ ඇතැම් පුද්ගලයන්ට ධර්මය දේශනා කිරීමට යොදුන් ගණන් පයින් වැඩම කළහ.**

එක වරක් පමණක් නොව දෙතුන් වරකට වඩා එකම පුද්ගලයා වෙත වැඩම කළ අවස්ථා ද ත්‍රිපිටක ග්‍රන්ථ පරිශීලනය කිරීමෙන් දැක ගත හැකි ය. තථාගතයන් වහන්සේ ඉහත ගාථාව මුල් කර ගත් ධර්ම දේශනාව සිදු කරන්ට යෙදුනේ ද අවස්ථා ගණනාවක් ම එම බමුණා හමුවීමට වැඩම කරමිනි.

සැවැත්නුවර අසල වෙසෙන එක් බමුණෙක් ගඟක් අසල යම් කිසි ප්‍රදේශයක කුඹුරක් වැපිරීමට සූදානම්ව සිටියේ ය. බමුණා තම කුඹුර වැපිරීමට පටන් ගත්දින බුදුරජාණන් වහන්සේ ඔහු වෙත පැමිණ "බමුණ, ඔබ කුමක් කරන්නේ ද?" යි

විමසූහ.

"ස්වාමීනි, මා කුඹුර වැපිරීමට සූදානම් වනවා".

බමුණා පැවසීය. මෙලෙස බුදුරජාණන් වහන්සේ කුඹුර වපුරන කලට, ගොයම් පැසුන කලට, ආදී වශයෙන් කිහිප වතාවක් පැමිණ බමුණා සමග සංවාද ගොඩනැඟී ය. මේ අතර බමුණා බුදුරජාණන් වහන්සේ සමග මිතුදමක් ඇති කර ගත්තේ ය. මිතුරකු ලෙසින් දිනපතා පැමිණ තමාගේ සුව දුක් සහ සිදු කරන කාර්යය පිරික්සා බලන බුදුරදුන් වෙනුවෙන් ගොයම් කැපූ පසු මුල් ම කොටස පිරිනැමීමට අදහසක් බමුණා තුළ ඉස්මතු විය. කෙමෙන් කාලය ගෙවී ගියේ ය. අස්වැන්න නෙළා ගැනීමේ දින ළං විය. අස්වනු නෙළා ගැනීමට පළමු දින රාත්‍රියේ මහවැසි වැස්සේ ය. මහා වතුරට මුලු ගොයම ම විනාශ විය. ගොවියා පසුදා උදෑසන ම කුඹුරට ගියේ ය. විනාශ වී ඇති කුඹුර දෙස බලා තමන්ගේ බලාපොරොත්තු සියල්ල ම සුන් වූ බව දැක නැවත නිවස බලා ආවේ ය. සයනය මත වැතිරී සොවින් පෙළෙමින් සිටියේ ය. කුඹුර විනාශ වී අස්වනු පාළු වූවාටත් වඩා බමුණා ශෝක වූයේ බුදුරදුන් වෙනුවෙන් පිදීමට තිබූ අස්වනු කොටස විනාශ වූ නිසා ය.

මේ සිදුවීම දුටු බුදුරජාණන් වහන්සේ මිසදිටු බමුණාගේ නිවසට වැඩම කළ සේක. සොවින් තැවෙමින් දුක සේ කාලය ගත කළ බමුණා අමතා බුදු හිමියන් ඉහත ගාථාව දේශනා කළ සේක. ගාථාව දේශනා කළ උන්වහන්සේ ශෝකයට හේතුව දන්නේ දැයි බමුණාගෙන් විමසීය. තමන් එයට හේතුව නොදන්නා බව බමුණා කීවේ ය.

"ඔබ වහන්සේ එයට හේතුව දන්නේද?" යි බුදුරජාණන් වහන්සේගෙන් ඇසුවේ ය. තමන් වහන්සේ එයට හේතුව දන්නා බව පෙන්වා දෙමින් බමුණාට එම ධර්ම කාරණය විචිත්‍ර ආකාරයට අවබෝධ කරවූහ.

තමන් දැඩි ලෙස කුඹුර කෙරෙහි ආශාවෙන් සිටීම ( තණ්හාව ශෝකයට මුල බව ) දුකට හේතු වූ බව අවබෝධ විය. බුදු හිමියන්ගේ ධර්ම දේශනාව අවසානයේදී පාළුවී ඇත්තේ කෙත නොව තමන්ගේ සිත බව අවබෝධවීමත් සමග සෝවාන් ඵලයට පැමිණීමට ඔහුට හැකි විය.


තණ්හාව හේතු කොට ශෝකය හට ගනී. තණ්හාව නිසා භය හටගනී. එම තණ්හාව නැති කළ පුද්ගලයාට එබඳු කිසිම ශෝකයක් නොමැත. එසේවී නම් භයක් හටගන්නේ ද නැත. මේ ගාථාවේ සරල අදහස මෙම ධර්ම කාරණා සමග සැසඳීමෙන් ඔබට අවබෝධ වේ. සත්වයා සංසාර සාගරයට තල්ලු කර දමන ප්‍රධාන හේතුව තණ්හාව ය. නැවත නැවත ඉපදෙමින් සසර පුරාවට ම සත්වයා ගමන් කරන්නේ මේ තණ්හාව නිසා ය. තණ්හාව හේතුව බව දන්නවා නම් එය නැති කිරීමට හේතු සෙවිය යුතු ය.

"ඵලමිච්ඡන්ති වනස්මිං වානරෝ"

වනාන්තරයේ සිටින වානරයකු ගෙඩි කෑමේ ආශාවෙන් ගසෙන් ගසට පැන යයි. එමෙන් තණ්හාව නිසා සත්වයා භවයෙන් භවයට ගමන් කරන බව බුදුහිමියෝ උපමාවක් මඟින් පෙන්නුම් කොට වදාළහ.

පංච ඉන්ද්‍රියයන් පිනවමින් කාලය ගත කිරීමට දැඩි අශාවක් සත්වයන්ට තිබෙන අතර, වර්තමානය වන විට එවැනි පුහු ආශාවන් සඵල කර ගැනීමට නොකරන දෙයක් නැති තරම් ය. එහෙත් දැඩි ආශාවන් නිසා අවසානයේ එහි ඇති

> "මහා වතුරට
> මුළු ගොයම ම
> විනාශ විය.
> ගොවියා පසුදා
> උදෑසන ම කුඹුරට
> ගියේ ය. විනාශ
> වී ඇති කුඹුර
> දෙස බලා
> තමන්ගේ
> බලාපොරොත්තු
> සියල්ල ම සුන් වූ
> බව දැක නැවත
> නිවස බලා ආවේ ය."



මහනුවර මල්වතු මහා විහාරවාසී, ඓතිහාසික දන්තුරේ රාජමහා විහාරය, කඳුලව මැදිරිය රාජමහා විහාරය ප්‍රමුඛ තදනුබද්ධ විහාර ගණයේ අධිපති කර්මවාගාචාර්ය ධර්මාචාර්ය

**දන්තුරේ විපස්සි නාහිමි**

ප්‍රතිවිපාක ද විඳීමට ලැබෙන්නේ තමන්ට ම ය.

අනේපඬු සිටුතුමා, මිගාර මාතාව වැනි අග්‍ර දායකයින් සියලු සැප සම්පත්වලින් සපිරි සේනාසන පූජා කළ ද බුදුරජාණන් වහන්සේ කිසිම දෙයකට ආශා කළේ නැත. කෙලෙසුන් ප්‍රහීන කළ උන්වහන්සේ ගස් මුල් අසල සේ ම අසීරුවෙන් අටවා ගත් කුඩා සේනාසන වල ද වැඩ විසූහ. එය සම සිතින් ඉවසා වදාළහ. බුද්ධ චරිතයෙන් අප ඒ ආදර්ශය ගත යුතු ය. අද කෙනකුට නැති දෙයක් හෙට ලැබෙන්නට පුළුවන. තව කෙනකුට තියෙන දෙයක් හෙට නැති වෙන්නට පුළුවන. එය අවබෝධ කර ගත යුතු ය.

සංස්කාර ධර්මයන්ගේ අනිත්‍ය බව ප්‍රඥාවෙන් යුතු ව තේරුම් ගෙන පංචඉන්ද්‍රියයන් දමනය කර ගනිමින්, සැම විටම දෙයක් අල්ල ගන්නවාට වඩා එහි ඇති වේදනා බව දැක අවබෝධයෙන් මේ මනුස්ස ජීවිතය ගත කළ යුතු ය. පෘතග්ජන පුද්ගලයින් වශයෙන් අප මේ සසරට බිය විය යුතු ය. එම නිසා සැම විටම ධර්මයට අනුව අටලෝ දහමින් කම්පා නොවී ජීවිත් විය යුතු අතර, එය ගිහි පැවිදි දෙපාර්ශවයටම දුක නැති කිරීමට පහසුවක් වේ.

# කඨින චීවර පූජාවේ ගැඹුර

**කඨින යන වචනය උච්චාරණය වන්නේ ම ගැඹුරු හඬකින්. කඨින යන වචනයේ තේරුමත් එ පමණට ම ගැඹුරු වූවක්. ඉතින් මොකක් ද මේ ගැඹුර, එහෙම නැති නම් බරපතළකම කියන එක යි අද මෙහි දී අප විසින් විමසුමට ලක් කරන්නට කල්පනා කළේ. අපේ රටේ පමණක් නො ව ලෝකයේ මහත් ජනතාවට කඨින පින්කම කියන ක්‍රියාව ඉතා වැදගත් වන්නේ එහි ඇති ආනිසංසය බලවත් නිසා ම බව එක්වර ම පැහැදිලි වන කරුණක්.**



> වස්තුන් මාසය අවසන් වන විට එළඹෙන්නේ දායක පක්ෂයට ඉදිරි චීවර මාසය තුළ තමන් ක්‍රියා කළ යුතු ආකාරය පිළිබඳ කාල සටහනක් සකස් කර ගැනීම යි.

එසේ දවූවත් එය බරපතළ කර ගැනීමේ කාර්යය නම් සුළු කොට තකන්නට බැහැ. මෙය ඉතා ම පැහැදිලි කරුණක්. ඉතින් එවැනි කඨින පින්කමක් අංගසම්පූර්ණ වශයෙන් කර ගැනීමට ලැබෙන්නේ ත් කරුණු කිහිපයක් සම්පූර්ණ කර ගත්තොත් පමණ යි. එහි දී දායක පක්ෂය වගේ ම කඨින චීවර ප්‍රතිග්‍රාහක පක්ෂයේත් අවශ්‍ය කාරණා සම්පූර්ණ විය යුතු යි. මෙහි ගැඹුර බලවත් වීමට එක හේතුවක් නම්, පින්කම් අතර පිළිගත් මතයක් වී තිබෙනවා කඨින පින්කම අටමහා කුසල් අතර පළමු වැනි පින්කම බවට. ඒ වගේ ම කඨින පින්කමේ ආනිසංස ගැන කතා කරන විට කිසියම් අයෙක් පංචානන්තරිය පාප කර්මයක් කර ගෙන නොමැති නම්, ඒ අය ඊළඟට ලබන භවය තුළ අනිවාර්යයෙන් ම විපාක ලැබීමට තරම් බලවත් වූ පින්කම ද මේ කඨින පින්කම බවට ද මතයක් තිබෙනවා. අපි හැමවිට ම පින්කම් කරන්නේ සිත පිරිසුදු කර ගැනීමට යි. අකුසල සිතිවිලි යටපත් කර, කුසල සිතිවිලි දියුණු කර, සසර ගමන කෙටි කර ගැනීමට යි. ඉතින් පින්කමක් කරලා අකුසල් සිත් වැඩි දියුණු වෙනවා නම් ඒ පින්කම නො කරන එක තමා වැඩිය හොඳ වන්නේ. මොක ද ඒ ආකාරයේ පින්කම් පින්කමක ස්වරූපයෙන් පෙනුණත්, එයින් ඒ පින්කම සිදු කරන දායක පක්ෂයේ ප්‍රභූත්වය කියා පෑමට හෝ වෙනත් ගරු නම්බු අපේක්ෂාවෙන් එවැන්නක් කරන විට සිදු වන්නේ ආශාව තෘෂ්ණාව වැනි අකුසල සිතිවිලි බලවත් වී සසර ගමනට බාධා ඇති වීම පමණයි. මෙය අප ඉතා අරපරිස්සමෙන් තේරුම් ගත යුතු කරුණක් . ඉතින් ඒ විදිහට බලන කොට අද සිදුවන කඨින පින්කම් සැබෑ අරුතෙන් ම කඨින පින්කමේ ආනිසංස ඒ ආකාරයෙන් ම අත් කර ගත හැකි ඒවා ද යන්න කල්පනා කර බැලිය යුතු යි.

දායකයන් මෙන් ම කඨින චීවර ප්‍රතිග්‍රාහක පක්ෂය ද මේ තත්වය මනාව තේරුම් ගෙන ක්‍රියා කරනවා නම් අපට හැබෑ කඨින පින්කමක කොටස්කරුවන් බවට පත් වෙන්නට හැකියාව තිබෙනවා. ඉතින් දායක පක්ෂය වස් කාලය ආරම්භ වීමට පෙරාතුව සිට ම ඒ ගැන පුණ්‍ය සහගත ප්‍රසාද ජනක සිතිවිලි ඇති කර ගෙන, නියමිත දවසේ උපසම්පන්න භික්ෂූන් වහන්සේ වෙත ගොස් ඉදිරි වස් තුන් මාසය තුළ වස්විසීම පිණිස ආරාධනා කළ යුතු යි. මෙම වස් කාලය ආරම්භ වන සම්මත දිනය වන්නේ වර්ෂයේ ඇසළ පුර පසළොස්වක දිනය යි. එතැන් සිට වප්පුර පසළොස්වක දක්වා බලවත් වන වස් කාලය තුන් මාසයකට සීමා වෙනවා. ඉතින් මේ කාලය තුළ පෙර වස් විසූ භික්ෂූන් වහන්සේ එම තුන් මාසය අවසන් වූ පසුව පොහොය සීමාවට රැස් වී වස් පවාරණය සිදු කරනවා. ඉතින් වස් විසූ භික්ෂූන් වහන්සේ එම කාලය තුළ මහත් වෙහෙසක් දරමින් තම දිගු සසර ගමනට බාධා වන කිසිවක නිරත නො වී, මනා ලෙස සිහිය පිහිටුවාගෙන ක්‍රියා කිරීම බරපතළ අවශ්‍යතාවක්. ඉතින් ඒ කාලය තුළ භික්ෂූන් වහන්සේ උදේ, දවල්, හා රාත්‍රී යන තුන් අවස්ථාවේ දී ශ්‍රද්ධාව දියුණු වන ආකාරයෙන් බුද්ධ වන්දනාව, විවේකයක් ලද අවස්ථාවේ දී ම මෛත්‍රී කර්මස්ථානය වැඩීම, විදර්ශනා භාවනාවෙහි යෙදෙමින් පංච උපාදානස්කන්ධයෙහි නොතිර බව මෙනෙහි කිරීම, නියමිත අවස්ථාවේ ආචාර්ය උපාධ්‍යයන් වහන්සේලාට වත්පිළිවෙත්, ඇප උපස්ථාන සිදු කිරීම, ආචාර්ය, උපාධ්‍යායයන් වහන්සේලා අත් නොහැර ධර්මානුධර්ම ප්‍රතිපත්තියෙහි යෙදීම, නියමිත කාලසටහනක් පිළියෙළ කර ගෙන සිවුපසයෙන් තමන් වහන්සේලාට උපස්ථාන කරන දායක පක්ෂයට අවශ්‍ය ධර්මානුශාසනා, ධර්ම සාකච්ඡා පැවැත්වීම, දායක පක්ෂයට මේ කාලය තුළ සතිය පිහිටුවා විශේෂ වශයෙන් දවස ගත කිරීමේ අගය වටිනාකම අවබෝධ වන ආකාරයෙන් ම එම ධර්ම සාකච්ඡා ආදිය පවත්වා ඒ හැම දෙනා ම බුද්ධ මාර්ගයෙහි ගමන් කරවීමට කටයුතු කිරීම, අඩමසක් පාසා නො වරදවා ම පොහොය සීමාවට රැස් ව ඇවැත් දෙසාගෙන විනය කර්ම සිදු කොට ආයති සංවරයෙහි පිහිටමින් කල් ගත කිරීම මේ කටයුතු අතර මූලික වෙනවා.


වස්තුන් මාසය අවසන් වන විට එළඹෙන්නේ දායක පක්ෂයට ඉදිරි චීවර මාසය තුළ තමන් ක්‍රියා කළ යුතු ආකාරය පිළිබඳ කාල සටහනක් සකස් කර ගැනීම යි. ඒ වගේ ම ඊට පෙර ගත කරන වස් තුන් මාසය තුළ දායක පක්ෂය ද අතිශය හික්මීමෙන්, නිති පන්සිල් ආරක්ෂා කරමින් පඤ්ච දුෂ්චරිතයෙන් වැළකී පොහොය දිනවල අෂ්ඨාංග ශීලාදිය ද සමාදන් විය යුතුයි. වස් කාලය තුළ තම ආරාධනාවෙන් වස් වැඩ වසන භික්ෂූන් වහන්සේගේ සුවදුක් සොයා බලමින්, විවේක අවස්ථාවේ කිසියම් දින චරියාවක් සකසා ගෙන විහාරස්ථානයට යමින් එමින් ආගමික වත්සිරිත් හා තෙරුවන් වන්දනා ආදී කටයුතුවල ද නිරත වෙමින් හැම ඉරියව්වක් ම පැවැත්වීමේ දී සිහිය පිහිටුවා ගෙන කල් ගතකළ යුතුයි. ධර්ම දේශනා ශ්‍රවණය කරමින්, ධර්ම සාකච්ඡා පවත්වමින් වස් තුන් මාසය හා චීවර මාසය අවසන් වී ආපසු හැරී ගත වූ භාර මාසය දෙස විමසා බැලීමේ දී හැබෑවට ම තමන් සැබෑ වස් කාලයක් ගත කර, සසර ගමන කෙටි කර ගැනීමට අවශ්‍ය ආකාරයෙන් ගත කළා කියා හිතේ සතුට, ප්‍රීතිය ඇති වන ආකාරයෙන් ක්‍රියා කළා කියා හැඟීමක් ඇති කර ගත යුතු තත්වයට පත්වෙනවා.

චීවර මාසය ආරම්භයත් සමඟ එළඹෙන්නේ කඨින පින්කම අරුත්බර ව සිදු කර ගැනීමේ අවස්ථාව යි.

කඨින සිවුරක් කර ගැනීමට අවශ්‍ය වස්ත්‍රය හෙවත් කඨින දුස්සය සිවුරක් බවට පත් කර ගැනීම පිණිස භික්ෂූන් වහන්සේට භාර දෙන්නේ දායක පක්ෂය විසින්. ඉතින් එම වස්ත්‍රය තෝරා ගැනීම නම් අද සිදු වන්නාක් මෙන් පහසු කරුණක් නොවෙයි. ඊට අදාළ වන චාරිත්‍ර රැසක් දායක පක්ෂය විසින් ඉටු කරන්නට අවශ්‍ය වෙනවා. ඒ වගේ ම විහාරස්ථානයක වැඩ වාසය කරන භික්ෂූන් වහන්සේට මෙම වස්ත්‍රය ගෙනවුත් භාර දෙන්නේ ඒ වෙනුවෙන් තෙමසකට වැඩි වන කාලයක් තුළ දැහැමි ලෙස ජීවත් වෙමින් පිළිවෙත් පිරූ, වස්කාලය තුළ සිත දියුණු කර ගනිමින් සතියෙන් යුක්තව කල් ගෙවූ දායක පක්ෂ ය යි. මේ දායක පක්ෂය කඨින පින්කම ඔවුනොවුන් සම්මුඛ වී කතා බස් කර ගෙන තීන්දුවකට පැමිණ විහාරස්ථානයේ තම ආරාධනාව පිට වස්වසා වැඩ වාසය කරන භික්ෂූන් වහන්සේට භාර දෙන අවස්ථාව හරි ම අසිරිමත් සිදුවීමක් බවට පත්වෙනවා. මොක ද වස් විසූ භික්ෂූන් වහන්සේට ඒ පිළිබඳ කල්තබා දැනුවත් වීමකුත් තිබෙන්නට හැකියාවක් නැහැ. එය සඳහන් වන්නේ හදිසියේ අහසින් කඩා පාත්වුණු සිදුවීමක් ලෙසයි උන්වහන්සේ දැනුවත් වන්නේ. ඉතින් එහෙම නිසා භික්ෂූන් වහන්සේ මේ හිමිදිරි පාන්දර ශබ්ද පූජා ආදිය සහිත ව හෝ සෙනඟ එක්රැස් වෙලා විහාරස්ථානයට පැමිණියේ පින්කමක් පිණිස දැයි අර එන දායක පක්ෂයෙන් අසා දැන ගත යුතු වෙනවා. ඉතින් එහෙම දැන ගෙන අර දුස්සය හෙවත් වටිනා වස්ත්‍රය භාර ගෙන එදින ම සිවුරක් බවට පත් කර දෙන්නට භික්ෂූන් වහන්සේ බාර ගන්නවා. එම වස්ත්‍රය සිවුරක් බවට පත් කරනවා කියන කරුණත් සුළුපටු නොවෙයි. අද මෙන් නොව එය භික්ෂූන් වහන්සේලා කීපනමක් එකතු වී විනායානුකූල ව කඩකපා සකස් කර ගන්නට ඕන නිසාත්, වෙහෙසකර ව මසා ගන්නට ඕන නිසාත් භික්ෂූන් වහන්සේලා කීපනමක් එකතු වී එම වස්ත්‍රය සිවුරක් බවට පත් කරනවා.

පළමුවෙන් ම මෙහි වැදගත්ම කරුණ වන්නේ කඨින පින්කමක් කර ගැනීමට අවශ්‍ය කරන පෙරවස් විසූ භික්ෂූන් වහන්සේ කොතන ද? වැඩ වාසය කරන්නේ එය අප මනා සිහියකින් තේරුම් ගත යුතු වෙනවා.

ඉතිරිය 34 පිටුවට ...



මහනුවර අස්ගිරි මහා විහාරයේ
කාරක සංඝසභික
හා උපාධ්‍යාය ධුරන්ධර
වයඹ පළාතේ ප්‍රධාන සංඝනායක
මහාචාර්ය
**තුඹුල්ලේ
ශ්‍රී සීලක්ඛන්ධ නාහිමි**



# දිනුමත් පැරදුමත් තීරණය කරන්නේ සිත යි

**සිත පුදුමාකාර යි. මොහොතක් මොහොතක් පාසා වෙනස් වනවා. විවිධ අරමුණු වෙත දිව යනවා. එහාට මෙහාට දුවනවා. දඟලනවා. කුඩා දරුවකු සේ සිත එක අරමුණක රඳවා තබා ගැනීම දුෂ්කර යි. ඒ නිසාම සිත චපල යි. නොයෙක් තැන්වලින් වැට කඩාගෙන කුඹුරට පැමිණ ගොයම් කන කුළු හරකකු වගේ සිත ආරක්ෂා කර ගැනීමත් අසීරු යි. ඇස්, කන්, නාසා දී ඉන්ද්‍රියන් මඟින් විවිධ දුෂ්චරිතයන්ට යොමුවන සිත එයින් වළක්වා ගැනීමත් අසීරු යි.**

බුදුරජාණන් වහන්සේ සැවැත්නුවර ජේතවනාරාමයෙහි වැඩ වෙසෙන සමයෙහි එක් කුල පුත්‍රයෙක් උන්වහන්සේගෙන් දහම් අසා පැහැදී සංඝරක්ඛිත නමින් පැවිදි වුණා. සංඝ රක්ඛිත හිමි බොහෝ වීර්ය වන්ත යි. භාවනා වඩා රහත් බවට පත්වුණා. උන්වහන්සේගේ නැගණියට පුතෙක් සිටියා. සංඝරක්ඛිත රහතන් වහන්සේ වෙත පැමිණ ඔහු ද පැවිදි වුණා. බෑණනුවන් යන අර්ථයෙන් 'භාගිනෙය්‍ය' යන වචන ය ද මුලට යොදා 'භාගිනෙය්‍ය සංඝරක්ඛිත' යන නමින් වුණා. එක් වස් කාලයක මේ හිමියන් වස් වසන්නට ආසන්න ගමකට වැඩම කළා. වස් සමාදන් වන දවසේ පූජා වශයෙන් උන්වහන්සේට වැසි සළු දෙකක් ලැබුණා. එක් වැසි සළුවක් ප්‍රමාණයෙන් රියන් හතයි. අනෙක් වැසි සළුව රියන් අටයි. මම මෙයින් රියන් අටක් වූ වැසි සළුව මාගේ ගුරු හාමුදුරුවන්ට පූජා කරනවා යැයි භාගිනෙය්‍ය සංඝරක්ඛිත හාමුදුරුවෝ සිතුවා. වස් අවසානයේ ගුරු හාමුදුරුවන් හමුවීමට පැමිණියා. ඒ වෙලාවේ උන්වහන්සේ විහාරයෙහි වැඩ සිටියේ නැහැ. පිණ්ඩපාතය සඳහා වැඩම කරලා. උන්වහන්සේ නැවැත වඩින තුරු ගෝල හාමුදුරුවෝ මලුපෙත් හැමද පිරිසිදු කළා. ආසනයක් පනවා පා දෝවනයට පැන් බඳුනක් ද පිළියෙල කළා. ගුරු හාමුදුරුවො පන්සලට වැඩම කළ පසු පා සිවුරු පිළිගෙන පා දෝවනය කළා. තමන් වහන්සේ ගෙන ආ වැසි සළුව පූජා කළා. ගුරු හාමුදුරුවො එය ප්‍රතික්ෂේප කළා. දෙවනුවත්, තෙවනුවත් එය පිළිගැන්වුවත් බාර ගත්තේ නැහැ. භාගිනෙය්‍ය සංඝරක්ඛිත හාමුදුරුවන්ට ඒ ගැන බොහොම දුකයි.

උන්වහන්සේ, අවන් පතින් ගුරු හාමුදුරුවන්ට පවන් සලන්නට පටන් ගත්තා. ඒ අතරේ මෙහෙම සිතුවා. "ගුරු හාමුදුරුවො මම පිරිනමන දේ බාර ගත්තෙ නැහැ. මා සමඟ අමනාපයෙන් වත් ද? එහෙම නම් මම ඉන්නේ නැහැ. සිවුරු හැර යනවා. ඒ ගිහින් මොනවද කරන්නෙ, ගිහි ජීවිතය බොහොම අසීරුයි. මම මේ වැසි සළුව විකුණනවා. ඒ මුදලින් එළු දෙනක් මිලට ගන්නවා. ඇය පැටවුන් බිහි කළා ම කිරි විකුණනවා. ඒවායින් මට ආදායමක් ලැබේවි. භාගිනෙය්‍ය හාමුදුරුවො තවමත් ගුරු හාමුදුරුවන්ට පවන් සලනවා . තවදුරටත් මෙහෙම හිතනවා. ඒ ආදායමෙන් මම ගෙයක් හදනවා. විවාහයකුත් කර ගන්නවා. ටික කාලයක් යන විට මට පුතෙකුත් ලැබෙයි. මගේ බිරිඳත් , පුතත් සමඟ කරත්තයෙන් ගුරු හිමියන් බැහැ දකින්නට යනවා. යන අතර මගදී දරුවා මගේ තුරුලට ගන්නට ඕනෑ. ඒත් මගේ බිරිඳ දරුවා ඇගේ උකුළෙහි ම තබාගෙන සිටිනවා. ටික දුරක් යනවා. බිරිඳගේ ඇකයෙන් ගිලිහුණු දරුවා බිමට වැටෙනවා. අනේ මගේ පුතා කරත්තයේ රෝදයට හසුවෙනවා. කෙවිට අරගෙන මගේ බිරිඳට පහර දෙනවා කියා දිගටම පහර දුන්නා. භාගිනෙය්‍ය සංඝරක්ඛිත හාමුදුරුවො තවමත් ඉන්නෙ ඒ සිතිවිල්ලෙ ම යි. ඒත් උන්වහන්සේගේ දෑත ක්‍රියාත්මකයි. අවන්පතින් ගුරු හාමුදුරුවන්ට පහර පිට පහර දෙනවා. ඒත් භාගිනෙය්‍ය හාමුදුරුවන්ට ඒ ගැන අවබෝධයක් නැහැ. සිරුර එහි තබා උන්වහන්සේ සිතින් බොහෝ දුර ගිහින්. කරත්තයට හසුවූ දරුවා ගැන තැවෙනවා. සංඝරක්ඛිත රහතන් වහන්සේ ගෝල හාමුදුරුවන්ගේ සිත නුවණින් දුටුවා. "භාගිනෙය්‍ය ඔබ බිරිඳට ගසන පහර මට වැදෙනවා" යනුවෙන් පැවසූවිට උන්වහන්සේට බොහෝ ලජ්ජා හිතුණා. එතැනින් දිවයන්නට සැරසුණා. ඒත් ඒ විහාරයෙහි අනෙක් තරුණ හිමිවරු එක්වී උන්වහන්සේ අල්ලාගෙන බුදුහිමියන් වෙත රැගෙන ගියා. බුදුරජාණන් වහන්සේ ඒ මොහොතේ මේ සිත ක්‍රියාත්මක වන ආකාරය පිළිබඳ ව දේශනා කොට වදාළා

"දූරංගමං ඒකචරං –
අසරීරං ගුහාසයං
යේ චිත්තං සඤ්ඤමෙස්සන්ති,
මොක්ඛන්තිමාරබන්ධනා"


සිත බොහෝ දුරට ගමන් කරනවා. සීමාවක් නැහැ. ඕනෑම තැනකට යනවා. තනිව ගමන් කරනවා. සිතට ශරීරයක් නැහැ. භෞතික ස්වරූපයක් නැහැ. ඒ නිසාම අල්ලන්නට බැහැ. හැඩයක් ,වර්ණයක් නැහැ. පඨවි, ආපෝ, තේජෝ , වායෝ යන සතර අංගයන්ගෙන් සැදුණු ශරීරය නැමැති ගුහාවේ හදවත ඇසුරු කොට සිත පවතිනවා.

මඩ ගොහොරින්, කැළි කසළින් අපවිත්‍ර නොවූ නිල්දිය පිරි පියුමෙන් සුසැදි විලක් හරිම ප්‍රසන්න යි. නිල්වන් ජලය මතින් එහි පතුළ හොඳින් පෙනෙනවා. බලන්නට ප්‍රියයි. එහෙත් මහ වැසි වැස්සේ නම් කුණු කසළ සේ ම මඩ වතුර ද ගලාවිත් ඒ විල අපිරිසුදු වෙනවා. ජලය බොර පැහැ වෙනවා. අලංකාරය නැති වෙනවා. අපේ සිතත් ඒ වගෙයි. සිත අපිරිසුදු කරන කැළිකසල ගෙන එන මාර්ග පහක් තිබෙනවා. ඇස, කන, නාසය, දිව, ශරීරය ඒ අංග පහයි. ඒවාට කැළි කසල හසුවුණොත් සිත අපිරිසුදු වෙනවා. දූෂ්‍ය වෙනවා. එයට කෙලෙස් සහගත සිතක් යැයි කියනවා. එවැනි සිත සසරදිගු කරනවා. එයට කළ යුත්තේ කුමක්ද? මෙසේ සිතන්න . නිල්දිය පිරුණු පොකුණ වටා ශක්තිමත් බැම්මක් බැන්දෙත් අපිරිසුදු වතුර ගලා එන්නේ නැහැ. විල ආරක්ෂා වෙනවා. පිරිසුදු වතුර ආරක්ෂා වෙනවා. සිතත් ඒ වගෙයි. සිත අපවිත්‍ර කරන දේ රැගෙන එන අංග පහ එනම් ඇස, කන,නාසය, දිව, ශරීරය ආරක්ෂා කර ගන්නට ඕනෑ. එවිට නරක හැඟීම් ඇති වන්නේ නැහැ. සිත පවිත්‍ර වෙනවා. මහා ශක්තියක් ඇතිවෙනවා. අපගේ ජයග්‍රහණයත්, පරාජයත් රඳා පවතින්නේ ඒ මතයි.

මේ කතා පුවතෙහි වැදගත් කරුණක් පෙන්නුම් කරනවා. කවර මොහොතක කවර කාර්යයක නියැළෙන්නේ ද ඒ ගැන සිහිය පිහිටුවා ගත යුතු බවයි. පවන් සලමින් වෙනත් දෙයක් ගැන සිතනවා නම් එතැන සිහිය පිහිටුවා ගැනීමක් නැහැ.

භාගිනෙය්‍ය සංඝරක්ඛිත හාමුදුරුවෝ තම බිරිඳ ගැන මනඃකල්පිත සිතුවිලි මවා ගෙන ඇයට කෙවිටෙන් පහර දෙනවා යැයි සිතා සිය ආචාර්යයන් වහන්සේගේ හිසට පවන් පතින් පහර දුන්නේ ඒ නිසයි. සෑම කාර්යයක දී ම සිහිය හෙවත් සතිය ඉතාම වැදගත්, පාඩම් කරන දරුවෙක් එය සිහියෙන් නොකළේ නම් සිත බොහෝ දුර යන්නට පුළුවන්. වෙනත් දේ ඔලුවට එනවා. පොතේ වචන කියැවෙනවා. පේළි කියැවෙනවා. පාඩම කියවා අවසන් වෙනවා. ඒ වුණාට ඒ කිසිවක් මතකයේ නැහැ.

අවධානය ගිලිහුණු තැන කරන කාර්යය නිෂ්ඵලයි. බණ භාවනාවේ දී මෙන් ම ඔබ කරන සියලු කාර්යයන් හිදී පසුව ඔබට පසුතැවිල්ලක් ඇති නොවේ. ඒ අනුව ඔබේ ජීවන ගමන සාර්ථක වනු ඇත.



බළංගොඩ ශ්‍රී ධර්මානන්ද පිරිවෙන් විහාරාධිපති
**කරගොඩ උයන්ගොඩ මෛත්‍රීමූර්ති මහා නා හිමි**

# බුදුරජාණන් වහන්සේ

# මිසදිටුවන්ගේ සැක දුරු කළ සේක



**අප භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ ලොව්තුරා බුද්ධත්වයට පත් වීමෙන් 12 වැනි වසර උදාවිය. උන්වහන්සේ පන්සියයක් මහ සඟන පිරිවරා ජනපදයෙන් ජනපදයට චාරිකාවෙහි හැසිරෙමින් අනුපිළිවෙලින් වේරඤ්ජා නුවරට වැඩම කළ සේක.**

එසේ වේරඤ්ජා නුවරට වැඩම කළ බුදුරජාණන් වහන්සේ “නළේරු“ නමැති දුටුවන් පහදවන සිත්කලු සුවිසල් කොසඹ ගසක් මුල වැඩ හුන් සේක.

එම නුවරෙහි වේදය ආදී බමුණු දහමෙහි පරතෙරට පත් උදය නම් වූ ධන ධාන්‍යයෙන් වත්පොහොසත් බ්‍රාහ්මණයෙක් විසීය. අප බුදුරජාණන් වහන්සේ තමන් වසන නගරයට වැඩම කළ පුවත ඇසූ වේරඤ්ජා හෙවත් උදය බමුණා උන්වහන්සේ වෙත පැමිණියේ ය.

බුදුරජාණන් වහන්සේ ඔහු අමතා බ්‍රාහ්මණය. ඔබ සුව සේ වසන්නේ ද යනාදී වශයෙන් පිළිසඳර කතාව කළහ. එයින් සතුටට පත් වූ නමුත් උදය බ්‍රාහ්මණ ආගන්තුකයකු වූ ද, වැඩිහිටියකු වූ ද, තමන්ට වයසින් අඩු බුදුරජාණන් වහන්සේ විසින් හැරිහැටි ගරුසරු කිරීමක් නොකළේ යැයි ද අදහසක් උපදවා ගෙන මෙබඳු ප්‍රශ්නයකින් සංවාදයක් ආරම්භ කළේ ය.

උදය බමුණා – භවත් ගෞතමයෙනි ඔබ වහන්සේ වැඩිමහලු බමුණන්ට වඳින්නේ නැත. ඔවුන් එන විට අසුනින් නැගිට පෙර ගමන් කිරීම ද, අසුනක් පැනවීම ද කරන්නේ නැත. ස්වාමීනි මෙය සුදුසු නැ නේද?

බුදුරජාණන් වහන්සේ –මම ලොව්තුරා බුදු බවට පැමිණියේ වෙමි. එම නිසා ම විසින් වැඳිය යුතු අයෙක් මිනිසුන් අතර හෝ දෙවියන් අතර හෝ මාරයන් අතර හෝ බ්‍රහ්මයන් අතර හෝ නොමැත. එම නිසා ඔබ මගෙන් වැඳ පිළිගැනීම් ආදිය බලාපොරොත්තු නොවන්න.

මක්නිසාද, තථාගතයන් වහන්සේ යමෙක් හට වැන්දෙත්, නැගිට පෙර ගමන් කළොත්, අසුන් පවරා දුන්නොත් ඒ පුද්ගලයාගේ හිස නටුවෙන් ගිලිහුණු තල් ගෙඩියක් මෙන් බෙල්ලෙන් ගැලවී බිම වැටෙන්නේ ය.

බුදුරජාණන් වහන්සේ විසින් කළ පැහැදිලි කිරීමෙන් සෑහීමට පත් නොවූ උදය බමුණා බුදුරජාණන් වහන්සේගේ ජ්‍යෙෂ්ඨ භාවය තේරුම් ගත නොහැකි ව තවත් ප්‍රශ්න මාලාවක් මෙසේ ඉදිරිපත් කළේ ය.

> “තථාගතයන් වහන්සේ යමෙක් හට වැන්දොත්, නැඟිට පෙර ගමන් කළොත්, අසුන් පවරා දුන්නොත් ඒ පුද්ගලයාගේ හිස නටුවෙන් ගිලිහුණු තල් ගෙඩියක් මෙන් බෙල්ලෙන් ගැලවී බිම වැටෙන්නේ ය.”

උදය බමුණා –

භවත් ගෞතමයෝ රස විරෝධී නොවේ ද?

ලෝකයෙහි වැඳිම් ආදි සාමග්‍රී රසය නැති බැවින් සාමග්‍රී රස විරෝධී නොවේ ද?

මේ ප්‍රශ්නය ඇසූ පසු බමුණාගේ සිත මොලොක් කරනු පිණිස මෙසේ පිළිතුරු දුන්හ.

බුදුරජාණන් වහන්සේ – බමුණ, මා සාමග්‍රී රස විරෝධි යැයි කීම සත්‍යයකි. මක්නිසාද පෘතග්ජනයන් බැඳෙන රූප, ශබ්ද, ගන්ධ, රස, ඵොට්ඨබ්බ යන රසයන් ආස්වාදය කිරීම ප්‍රහීණ කළ හෙයිනි. මුදුන සිද දැමූ තල් රුකක් නැවත පහළ නොවන්නාක් මෙන් එකී රසාස්වාදය සහ මුලින් ම විනාශ කළෙමි. එහෙයින් මම රස විරෝධී වෙමි. අභිවාදන ආදී සාමග්‍රී රස කරනයට නුසුදුසු ම වෙමි.

අරසරූපවාදය මෙසේ ප්‍රතික්ෂේප වූ නිසා වයසින් වැඩී ගිය අයට අභිවාදනය කිරීම නමැති සාමග්‍රී පරිභෝජනය නොමැති නිසා දෙවැනිව ද ප්‍රශ්නයක් විමසයි.

උදය බමුණා –

භවත් ගෞතමයෝ පරිභෝග රහිතයෝ වෙද්ද?

බුදුරජාණන් වහන්සේ – බමුණ රූප ශබ්ද, ගන්ධ, රස, ඵොට්ඨබ්බ යන මේවා කෙරෙහි ඇති ඡන්දරාගය පරිභෝගයන් ම විසින් ප්‍රහාණය කළ හෙයින් පරිභෝග රහිත වෙමි.

උදය බමුණා – ලෝකවාසීහු වැඩිමහල්ලන්ට වන්දනා මානනාදි කුල සමුදාචාර ක්‍රියා කරති. ඔබ වහන්සේ එසේ නොවෙති.

භවත් ගෞතමයෝ අකිරියවාදී වෙද්ද?

බුදුරජාණන් වහන්සේ – එසේ ය. ඔබ කියන්නේ සත්‍යයකි. මම අකිරියවාදී වෙමි. ඒ ඔබ යෝජනා කරන අරුතින් නොවේ. මම, ප්‍රාණඝාතාදී කාය දුශ්චරිත නොකරන්න, මුසාවාදා දී වාග් දුශ්චරිත නො කරන්න, අභිධ්‍යාදී මනෝ දුශ්චරිත නොකරන්න, යනුවෙන් අකිරියාවාදයක් දේශනා කරමි. එසේ ම සෙසු ලාමක අකුසල ධර්ම නොකිරීමට ද කියමි. ඒ නිසා මම අකිරියවාදී වෙමි.

උදය බමුණා – අකිරියවාදය මෙසේ ප්‍රතික්ෂේප වීම නිසා වෙනත් වාදයක් එනම් වැඩිහිටියන් නැමදීම ආදිය කිරීමෙන් ලෝ සිරිත් සිඳි බිඳි යන බව පෙන්වා දෙමින් 4 වන ප්‍රශ්නය විමසයි.

උදය බමුණා –

භවත් ගෞතමයෝ උච්ඡේදවාදී වෙද්ද?

ඔබ වහන්සේ උච්ඡේදවාදී යයි කියමි. එය එසේ ද?

බුදුරජාණන් වහන්සේ– මම උච්ඡේදවාදී වෙමි. ඒ ඔබ සිතන අයුරින් නොවේ.

එසේ ය ඔබ කියන්නේ සත්‍යයකි. මම රාගය නැසීම පිණිස, ද්වේශයන් නැසීම පිණිස හා මෝහය නැසීම පිණිස දේශනා කරමි. සක්කාය දිට්ඨි ආදී ලාමක අකුසල ධර්ම සෝවාන් ආදී සිවු මගින් සිඳියාම දේශනා කරමි. ඒ නිසා මම උච්ඡේදවාදී වෙමි.

දැන් උච්ඡේදවාදී චෝදනාව ද නිශ්ප්‍රභ විය. එහෙත් උදය බමුණා වයසින් වැඩිහිටියන්ට නැමදීම් ආදී කුල සිරිත් පිළිකුල් කරන බව හඟමින් මෙසේ අසයි.

උදය බමුණා – ඔබ වහන්සේ අභිවාදනාදී කුල සිරිත් පිළිකුල් කරන සේක් ද?

බුදුරජාණන් වහන්සේ – එසේ ය. බ්‍රාහ්මණය මම ජේගුච්ඡී වෙමි. ඒ ඔබ සිතන අයුරින් නොව මම කාය දුශ්චරිත තුන, වාග් දුශ්චරිත සතර සහ මනෝ දුශ්චරිත තුන යන පාපකර්ම දහය ගූථයක් මෙන් පිළිකුල් කරන්නෙමි. ඒ නිසා මම ජේගුච්ඡී වෙමි.

උදය බමුණා නැවතත් චෝදනාවක් මෙසේ ගෙන එයි. මොලාව ජ්‍යෙෂ්ඨයන්ට පිළිපැදිය යුතු ධර්ම ලෝක චාරිත්‍ර විනාශ කරන්නේ ය. ගෞතමයන් හික්ම විය යුතු ය. නිග්‍රහ කළ යුතුය යැයි අදහස් කරමින් වැනි වූ ප්‍රශ්නයක් ද විමසයි.

උදය බමුණා –

භවත් ගෞතමයෝ විනාස කරන්නෙක් නොහොත් හික්මෙන්නෙක් වේ ද?

බුදුරජාණන් වහන්සේ – බ්‍රාහ්මණය එසේ ය. මම වේනයික (වේනයිකෝ) වෙමි. ඒ ඔබ අදහස් කරන අරුතින් නම් නොවේ. මම රාග ද්වේශ මෝහයන්ගේ විනාය පිණිස, සන්සිඳිම පිණිස, විනය පිණිස ධර්ම දේශනා කරමි. එම නිසා වේනයික නම් වෙමි.

උදය බමුණා – තපස්සී භවං ගෝතමෝ?

භවත් ගේතමයෝ අනුන් සන්තාපයට පත් කරන්නේ වේ ද?

බුදුරජාණන් වහන්සේ – එසේ ය. බ්‍රාහ්මණය, මම කාය දුශ්චරිතය, වාග් දුශ්චරිතය, මනෝ දුශ්චරිතය තැවිය යුතු යැයි දේශනා කරමි. මම තැවිය යුතු ලාමක අකුසල ධර්ම ප්‍රහීණ කළ තැනැත්තාට තපස්සී යැයි කියමි. මම ද තැවිය යුතු අකුසල ධර්ම සහමුලින් වැනසූ හෙයින් අනුන් සන්තාපයට පත් කරන්නෙක් වෙමි.

උදය බමුණා සත්වැනි ප්‍රශ්නය නොහොත් චෝදනාව ව්‍යර්ථ වූ හෙයින් අවසාන වශයෙන් අටවැනි ප්‍රශ්නයක් ද නගයි. එනම් වැඩිහිටියන් පිදීම දෙව්ලොව උපත ලබා දෙන බවත්, ගෞතමයන් විසින් එසේ නොකිරීමෙන් මතු දෙව්ලොව ඉපදීමට සුදුසු නැත. භාග්‍යවතුන් වහන්සේ මවු කුසක පිළිසිඳ ගන්නට නොවටී යන චෝදනාව ක්‍රෝධයෙන් නගමින් අවසාන ප්‍රශ්නය අසා සිටී.

**ඉතිරිය 34 පිටුවට ...**



**පත්බේරියේ විමලඤාණ නාහිමි**

බුදුසරණ

35, ඩී. ආර්. විජයවර්ධන මාවත, ලේක්හවුස් - කොළඹ.
ටැලිෆෝන් - 2429598, 2429429 ෆැක්ස් - 2429329, 2449069

වප් පුර පසළොස්වක 2021-10-20

## පෙර විමසුම

ඒබ්‍රහම් ලින්කන් ජනතාව අතර වඩාත් ප්‍රසිද්ධ වූයේ සතුටින් සිටින නායකයෙක් ලෙසට ය. දිනක් මාධ්‍යවේදියෙක් ඔහුගෙන් ප්‍රශ්නයක් ඇසුවේ ය. ඒ, නිතරම සතුටින් සිටීමේ රහස කුමක්ද යනුවෙනි. එවිට ඔහු දුන්නේ අපූරු පිළිතුරකි. ඒ, අනුව මේ ජන නායකයා උදෙන් ම නැගිටින්නේ කරුණු දෙකක් පිළිබඳ අවධානය යොමු කරමිනි. එනම්, අද දිනයේ තමන් සතුටින් සිටිනවා ද, අසතුටින් සිටිනවා ද යනුවෙනි. හැමදාමත් ඔහු තෝරා ගත්තේ සතුටින් සිටීම ය. එ පමණින් ම ඔහු තමන් වෙත ඉබේ සතුට ළඟා වන තුරු බලා සිටියේ නැත. ඒ වෙනුවෙන් තෝරා ගත යුතු මඟ හැඳින, ඒ අනුව කටයුතු කළේ ය.

සතුටින් සිටින කෙනෙක් සාමාන්‍යයෙන් සමාජයේ අන් අයගේ සතුට උදුරා ගන්නේ නැත. අනුන්ට දුකක් වන ලෙස කටයුතු කරන්නේ ද නැත. එයට හේතුව ඇඩි ලෝභය, පාලනය කර ගත නොහැකි තරම් වන ද්වේෂය, අසීමිත මෝහය ආදී සිතිවිලිවලින් ඔහුගේ සිත පිරී නැති බැවිනි. එසේ නම්, පවුලකට, රටකට ඕනෑ සතුටින් සිටින මිනිසුන් ය.

බොහෝ දෙනෙක් සතුට බලාපොරොත්තු වුව ද එය ළඟා වන ආකාරයට ජීවන පැවතුම් හසුරුවා ගන්නේ නැත. තවත් කෙනකුට, තමන්ගේ සතුට බලාපොරොත්තු වූ ව ද අනුන්ගේ සතුට දකින්නට සිත හදා ගන්නට නොහැකි ය. එවැනි පුද්ගලයාට කවර නම් සතුටක් ද? සතුට කුමක් ද යන්න පිළිබඳ ව ම ඔහුට ඇත්තේ මුළාවකි.

සතුට ලබා ගැනීමේ අපූර්ව මාවතක් තථාගතයන් වහන්සේ අපට දේශනා කොට වදාළහ. ඒ දහම් මඟට අනුව අප යමක් කරන්නට කියන්නට පෙර හොඳින් සිතා බැලිය යුතු ය. එය තමන්ට අහිතකර ද, අනුන්ට අහිතකර දැයි සිතා දෙපසට ම අහිතකර නම්, නුසුදුසු නම් එයින් වැළකිය යුතු ය. අපගේ ගෙදර පරිසරයේ සිට ජීවිතයේ සෑම අවස්ථාවකට ම එය පොදු ය. වැඩි දෙනෙක් තමන් කරන කියන දේ පිළිබඳ ව පසුවට පසුතැවිලි වෙති. එහෙත් ගිය නුවණ ඇතුන්ලවා වත් ඇද්ද විය නොහැකි ය. හොඳම දෙය පෙර විමසුම ය.

යහපත් ව ජීවත් වන පුද්ගලයාට දහමට අනුව ධර්මයෙන් ම රැකවරණය ලැබෙන්නේ ය. මේ අන් කවරදාටත් වඩා අපට රැකවරණය ලැබිය යුතු කාලයකි. ඒ සොබා දහම විසින් ලෝකයට ම ඇඩි දඬුවමක් දී ඇති බැවිනි. ඒ කොරෝනා වසංගතය යි. ඒ දඬුවමට කිසිදු භේදයක් නැත. එහෙයින් සොබාදහම කෙරෙහි පවා අප හිතෛෂී විය යුතු ව ඇත.

යමක් කිරීමෙන් පසු දුක් විපාක ලබා දෙන දෙයින් වැළකිය යුතු ය. හැසිරීම් හසුරුවා ගත යුතු කිසිවකුගේ දෝෂාරෝපණයක් නො ලැබෙන ලෙසට ය. පොලීසියට, උසාවියට, හිර ගෙදරට යන්නට වන්නේ අප නිවැරැදි නොවූ විටය. සතුට පතන අය මේ කරුණු හොඳින් ධාරණය කර ගත යුතු ය.

විශේෂයෙන් සම්බුදු මඟ යන අපට වගකීමක් ඇත. ඒ ගෙවා පැමිණි ජීවිතය දෙස ආපසු හැරී බලනවිට මානසික වශයෙන් තැවුලට පත් නොවීම ය. මරණින් පසු අපායගාමී නොවීම ය.



# Vap Full Moon Poya day Message

Vap full moon poya day is considered as the day to end the rainy retreat season (Vas Kalaya) which goes on for a period of three months. As we are aware during the rainy retreat season venerable monks mostly spend their valuable time developing their morality, concentration and wisdom whilst lay followers gather merits by taking care of those monks and learning the Dhamma , dedicating their time to practice the Dhamma preached by the Buddha . After properly ending the rainy retreat on Vap full moon poya day, the lay followers will offer the Kathina Robe (Kathina Cheewara) to the venerable monks up until il full moon poya day, which is the next full moon poya. This month is thus named "Cheewara Masaya" or "Month of Kathina Robes".

Once, during Buddha's time when he was living in the city of Savasthi , a group consisting of thirty Monks started walking to the city of Savasthi from the city of Paveyya with the intension of meeting the Buddha. The journey was arduous, since it was during a rainy season. Hence the Monks decided to stay in the city of "Saketha" until the rainy season ended. Thereafter, they started their journey towards the city of "Savasthi" and arrived at the Buddha. When they arrived, they we in wet robes and it was obvious that they had experienced much difficulty due to heavy rains and wind. The Buddha then permitted the Monks to accept an extra robe called "Kathina Cheewara" which is to be used in situations of this nature.

This became a tradition in India and then in Sri Lanka and continues to this day, as a very important annual religious event. The merits of offering the "Kathina Robes" to venerable monks are explained extensively in Dhamma. Mainly, one who offers a Kathina Robe may not be born in hell and the possibility of them being born in heaven and human world is greater, unless they commit one of the five Heinous Deeds (Panchananthariya Kamma). It is further preached that, the graveness of any bad kamma can be softened by the merits of offering a "Kathina Cheewara". Furthermore, when confidence (saddha), effort (veerya), mindfulness (Sathi), concentration (Samadhi) and wisdom (Pragna) become well-developed during the rainy retreat season it automatically helps one to walk in the eight fold path which ends in enlightenment, supreme bliss of Nirvana.

Thus, it is well understood that the offering of a "Kathina Robe" starting from the Vap full moon poya day and attending to religious activities during the "Month of Robes" is helpful for the spiritual development of both monks and lay society.



**Dr. Mirisse Dhammika Thero**



# පිඬු සිඟා වඩින භික්ෂූන් වහන්සේ ගිහියාට නිධානයකි

**ජීවිකාවන් අතර පහත් ම යැපීම් ක්‍රමය සිඟාකෑම යි. දෑත දෙපා තිබිය දී රැකියාවක් කොට තමා ම යමක් උපයා සපයා නොගැනීම හා අන්‍යයන් මත යැපීම පිළිකුල් සහගත ය. එහෙත් සසුන් වන් කුල පුත්‍රයන්ට ඒ කාරණය එලෙසින් ම ගැලපිය නොහැක. භික්ෂුවගේ ආහාරය පිණ්ඩපාත භෝජනය යි. රජ සැප අතහැර දමා පැවිදිව උතුම් බුදු පදවිය ලැබූ අප මහා ගෞතම බුදුරජාණන් වහන්සේ පවා ගෙන් ගෙට පිඬුසිඟා දිවි වැටුම සිදුකොට වදාරමින් පිණ්ඩපාත චර්යාවේ ඇති පූජනීය බව පෙන්වා වදාළහ.**

පිඬුසිඟා ලද ආහාරයෙන් උදරය පුරවා ගැනීම හීන ක්‍රියාවක් වුව ද භික්ෂූන් සඳහා එවන් ප්‍රතිපදාවක් අනුදැන වදාළ බුදුරදුන් එමගින් ආරක්ෂා කරන ලද්දේ ගිහි පැවිදි උභය පාර්ශවය ම ධර්ම මාර්ගයේ පිහිටුවා ලීම යි. පරප්‍රතිබද්ධ ජීවිතයක් තමාට ඇති බව භික්ෂුව විසින් නිතර සිහි කළ යුතු ය. තමා පොරවන චීවරය, වළඳන ආහාරය, වැඩසිටින කුටිසේනාසනය හා පරිහරණය කරනු ලබන බෙහෙත් පිරිකර ගිහි ජනතාව විසින් පූජා කරනු ලබන්නේ ලෞකික ලෝකෝත්තර සැනසීම ලැබීමේ අපේක්ෂාවෙනි. ඒ කරුණු මෙනෙහි කරන පැවිද්දා ගිහි ප්‍රජාවගේ එකී බලාපොරොත්තු ඉටු කරදීම වෙනුවෙන් කටයුතු කළ යුතු ය. එනම් සීලාදී පිළිවෙත් ධර්මයන්හි මනාව පිහිටමින් සමථ විදසුන් භාවනාවේ යෙදී වාසය කළ යුතු ය.

පිඬුසිඟා ජීවත් වුව ද පැවිද්දා සිඟමන් යදින යාචකයකු මෙන් අසරණයෙක් නොවේ. උසස් චාරිත්‍ර වාරිත්‍ර විධි සමුදායයක් ඇති බ්‍රහ්මවිහාරාදී ගුණයන්ගේ නවාතැනකි. සමාන්‍ය යාචකයකු යමක් ඉල්ලා ගැනීම පිණිස මුණගැසෙන සියලු දෙනාට ම අතපාමින් බැගෑපත් වේ. එහෙත් පිණ්ඩචාරික භික්ෂුව කිසිවකු ඉදිරියේ බැගෑපත් නොවන අතර, හමුවන සියල්ලන් වෙත සිව්පසය සඳහා නො එළඹේ. වචනයෙන් හෝ ඉරියව්වකින් පවා කිසිවක් නො ඉල්ලමින් "උද්දිස්ස අරියා තිට්ඨන්ති" යනුවෙන් වදාළ ආකාරයෙන් සුදුසු නිවෙස් දෙරකඩට පැමිණ නිහඬ ව සුලු වේලාවක් කල් යවා යමක් ලැබුණේ ද, නොලැබුණේ ද මෛත්‍රියෙන් පිටව යයි. භික්ෂූන්ගේ පිඬු සිඟමන භාවනාවක් වන අතර, එය ගිහි ජනතාව කෙරෙහි සිදුකරනු ලබන උදාරතර මෙහෙවරක් ද වේ.

භික්ෂුවගේ යැපීම් ක්‍රමය කෙතරම් අහිංසක වුව ද තමා කෙරහිත්, සසුන් පිළිවෙත කෙරෙහිත් ගෞරවයක් නොමැති ගිහියන් වෙත ගොස් බැගෑපත් විය යුතු නොවේ. අංගුත්තර නිකායේ කුල සූත්‍රයට අනුව පැවිද්දකු විසින් යම් කුලයකට එළැඹීමේ දී සැලකිය යුතු කරුණු කිහිපයක් දැක්වේ. භික්ෂුවක් ඉදිරියේ යම් ගිහියෙක් තමා වාඩිවී සිටින ආසනයෙන් නොනැඟිටියි නම් එවැනි පිරිසක් වෙත සිව්පස පිණිස නොයා යුතු බව බුදුරජාණන් වහන්සේ එහි දී පෙන්වා වදාළහ. තමාට වඩා සීලාදී ගුණයෙන් උසස් වුවත් ඉදිරියේ හුනස්නෙන් නැඟිටීම ප්‍රාථමික ආචාර ධර්මයකි. එබඳු ගුණයක් හෝ නොමැති කුලයක් වෙත භික්ෂුව යම් හේතුවකින් එළැඹියේ නම් නැවත එහි නොයා යුතු ය. පැවිද්දකු දුටු විගස ගෞරවනීය ආකාරයෙන් යුතුව තමා හුන් ආසනයෙන් නැගිට ඉඩ දේ නම් එවැනි පිරිසක් වෙත එළැඹීම යෝග්‍ය වේ.

ඕනෑවට එපාවට නොව පසඟ පිහිටුවා සාදර ගෞරවයෙන් පැවිද්දන්ට වන්දනා කිරීම ආර්ය චාරිත්‍රයකි. යමකු කෙරෙහි ඒ ගුණය නොවේ නම් එවැන්නකු හෝ එවැනි කුලයක් වෙත නොයා යුතු අතර පැවිද්දාට නිසි ගෞරවය දී වැඳුම් පිදුම් කරන්නන් වෙත පමණක් පිඬුසිඟා යා යුතු ය.

තම නිවසේ ඇති වටිනා ආසනයක් මත සුදු වස්ත්‍ර එලා ඉතා ඕනෑකමින් යුතුව පැවිද්දාට අසුන් ගැන්වීමට සැලැස්වීම සැදැහැති ගිහියාගේ ලක්ෂණයකි. එහෙත් එසේ නො කරන ගිහි ගෙවල් වෙත පිඬුසිඟා යාම අවශ්‍ය නොවේ. පැවිද්දන් හැල්ලුකොට සලකන ගිහියන් වෙත බුදු පසේ බුදු මහරහත් උතුමෝ නොවඩිති. සම්බුදු කරුණාව ලැබීම පිණිස පෙර කළ පින් ඇතිව සිටින, එහෙත් පාප මිත්‍ර ඇසුර නිසා නොමඟ ගිය අසරණයන් බේරා ගැනීම උදෙසා බුදුරජාණන් වහන්සේලා වැඩම කරන අතර පුරාකෘත පින්බලයක් නොමැති උදවිය වෙත නො වඩිති.

ඇති දේ සැඟවීම හා පැවිද්දන් රැවටීම ද හීන ධර්මයකි. යම් ගිහියකු කෙරෙහි එකී දුර්ගුණ වේ නම් ඔහු වෙත නොයා යුතු වේ. දායකයාගේ වත් පොහොසත්කම අනුව ඔහුගේ අතහැරීම වෙනස් වේ. බොහෝ ධනය ඇති පුද්ගලයෙක් ඉතා සොච්චමක් පරිත්‍යාග කොට ඒ පිළිබඳ උදම් අනයි නම්, ඔහු දාන පාරමිතාව ගැන හරිහැටි නොදනී. තමාගේ ශක්ති ප්‍රමාණය අනුව හැකි උපරිමයකින් සිව්පස පූජා කරන ගිහි ප්‍රජාව වෙත එළැඹෙන පැවිද්දා අරියවංස ප්‍රතිපදාව අනුව පිළිපදියි නම් දායක ග්‍රාහක යන උභය පාර්ශවයට ම යහපතක් සැළසේ.

ප්‍රණීත දේ සඟවා අප්‍රණීත දේ හෝ, ඉවතලන දේ හෝ දෙන්නා වූ ගිහියන් ද දුරින් ම දුරු කළ යුතු ය. පිඬුසිඟා වඩින භික්ෂුව යනු සැප කැමති ගිහියාට අක්ෂය නිධානයකි. පැහැදුණු සිතින් පැවිද්දකු දෙස බැලීම පවා අපමණ පින් වැඩෙන ක්‍රියාවක් වේ. එවැන්නකු වෙත තමා සතු ප්‍රණීතම ආහාරපානාදිය ලබා දීම මඟින් රැස්වන පුණ්‍යස්කන්ධය මෙතෙකැයි කිව නොහැක.


යමක් පූජා කිරීමේ දී කිසිදු ගෞරවයක් නොමැති ව, ගණන් ගැනීමක් හෝ තැකීමක් නො කරයි නම් එවැනි ගිහියන් ද වර්ජනය කළ යුතු ය. දන් හැන්දක් බෙදීමේ දී එය සිදුකරන ආකාරයෙන් ම ගිහියාගේ ශ්‍රද්ධාදී ස්වභාවයන් ගැන වැටහේ. යටහත් පහත් ව සාධු කියමින් අපගේ දන් පිළිගන්නා සඟරුවන සුවපත් වේවා යන අදහසින් යුතුව යම් උවසු – උවැසියන් දානාදී පූජාවන් සිදු කරයි නම්, ඔවුන් වෙත භික්ෂූන් වහන්සේලා එළැඹිය යුතු අතර මගහැර යාමක් කිසිසේත් ම නො කළ යුතු ය.

යම් ගිහියෙක් සුදුසු කල්හි දහම් ඇසීම පිණිස භික්ෂුවගේ සමීපයේ නො හිඳියි නම් එවැනි ගිහියන් වෙත ද පැවිද්දා නොයා යුතු ය. ආමිසයෙන් භික්ෂුවට උවටැන් කරන ගිහියන් වෙත බුදුබණ කියා දීම පැවිද්දන්ගේ වගකීමක් වේ. එහෙත් දහම් ඇසීමට නො පැමිණෙන උදවිය ධර්ම ගෞරවයෙන් තොර වූවන් වන නිසා එවැන්නන් වෙත සිව්පස සඳහා යාම බුදුරජාණන් වහන්සේ විසින් තහනම් කොට වදාළහ.

දහම් ඇසීම පිණිස එළඹුණත් කන් යොමා ගරුසරු ඇතිව ශ්‍රවණය නොකරයි නම්, එවැනි ගිහියන් ද සැදැහැතියන් නොවේ. ආමිස දානයට ප්‍රත්‍යුපකාරයක් ලෙස ධර්ම දානය ලබා දීම භික්ෂුවගේ යුතුකමකි. එහෙත් දායකයා ධර්ම ශ්‍රවණය කොට භාෂිත ධර්මයේ අර්ථ රස විඳිමින් සතුටු නොවේ නම්, ධර්මකාමියෙක් නොවේ. ඔහුට තමා විසින් සිදු කළ යුතු යහපත ගැන නො වැටහේ. ධර්ම ගෞරවය ඇති ව ඇසූ ධර්මයෙහි අර්ථ රසය විඳිමට සමත් ගිහි පින්වතුන් වෙත පමණක් සිව්පසය සඳහා එළඹෙන පැවිද්දා නිසා කිසිවකුටත් අලාභයක් නොවේ.

ශක්තිමත් ගිහි පැවිදි සබඳතාවක් ඇති බව සාසන මාර්ගයෙහි දියුණුවකි. ප්‍රතිග්‍රාහක භික්ෂුව හා දායක ගිහියා අතර අන්‍යෝන්‍ය අවබෝධයක් පැවතීමත් තම තම භූමිකාව හඳුනාගැනීමත් හේතුවෙන් සාසන බ්‍රහ්මචරියාව දිගු කලක් පවතිනු ඇත. ගිහියන්ගේ සහයෝගය නො ලබා සසුන් ප්‍රතිපදාව පැවැත්විය නොහැකිවාක් මෙන් පැවිද්දන්ගේ උපකාර නො ලබා ගිහි ප්‍රතිපදාවන් ද පැවැත්විය නොහැක. ගිහියා භික්ෂුවට ගරු නොකිරීම හා අවනත නොවීම නිසා උභය පාර්ශවයන් ම ඔවුනොවුන්ගෙන් ඈත් වී යයි.

**ඉතිරිය 34 පිටුවට ...**



බෙලිහුල්ඔය සීලසමාහිත යෝගාශ්‍රමවාසී,
ත්‍රිපිටකාචාර්ය, ත්‍රිපිටක විශාරද,
අභිධර්මය පිළිබඳ කථිකාචාර්ය,
ශාස්ත්‍රපති, රාජකීය පණ්ඩිත,
**බලංගොඩ රාධ හිමි**



# දහම් පාසල් යන දරුවා හැඩගැසෙන්නේ හෙළ කුල සිරිතට අනුවයි

**දහම් පාසල යන වචනය කන දැවටෙන විට ගෞරවණීය හැඟීමක් සිතට දැනෙයි. එයට හේතුව වන්නේ දහම් පාසලත් පන්සලත් එක්ව බැඳුණු දහම් අධ්‍යාපනයේ ගුණාත්මක භාවයයි. දහම් පාසල් අධ්‍යාපනය ආරම්භ වී දැනට වසර එකසිය විසිගණනක් ඉකුත් වී ඇති නිසා, අද මෙරට ජීවත් වන බොහෝ දෙනෙක් දහම් පාසල් අධ්‍යාපනය ලැබූ අය වෙති. නැතහොත් ඒ පිළිබඳ දැනුවත් බවක් ඇති පිරිසක් වෙයි.**

නොකඩවා දීර්ඝ කාලයක් මුළුල්ලේ නිස්සරණාධ්‍යාසයෙන් යුක්තව ධර්ම ඥාණය ලබා දෙමින් ගුණ නැණ බෙලෙන් යුතු පුරවැසියන් පිරිසක් ඇයට දායාද කිරීමට කැපවූ මහා සඟරුවනටත් ගුරු මණ්ඩලයටත් පළමුව ජාතියේ ප්‍රණාමය හිමි වේ.

දහම් පාසල් අධ්‍යාපනයේ මූලික අරමුණ වන්නේ සදාචාර සම්පන්න සමාජයක් ගොඩනැංවීමයි. එය බෞද්ධ ප්‍රතිපදාවේ දැක්වෙන මූලික අරමුණට අනුගත වූවකි. එසේම දෙමාපියන්ගේ මූලික අභිලාෂයක් වන්නේ ද දහම් පාසල් සෙවණේ වැඩුණු ගුණ නැණ බෙලෙන් යුතු සාදාචාර සම්පන්න දරුවන් දායාද කිරීමයි. මෑත අතීතය දක්වා දරුවන් තුළ ඉරුදින දහම් පාසල් යාමට පෙර මනා සූදානමක් දක්නට ලැබුණි. පෙරදිනයේ හවස මල් වට්ටියක් පිළියෙළ කර පිනි වැස්සට නිරාවරණය කර තබා පසුදින දහම් පාසලට ගෙන යයි. නැතහොත් හිමිදිරියේ මල් වට්ටියක් සූදානම් කර ගනියි. එසේ ම වේලාසනින් ම සිය දහම් පාසල් ඇඳුම පිරිසුදු කර තබා ගනියි. බුදුන් වහන්සේගේ ඡායාරූපයක් සහිත දහම් පාසල් පොත ද ගෞරවයෙන් තැන්පත් කර තබා රැගෙන යයි. දරු දැරියෝ ඉරු දින සුදු වතින් පිළිවෙලට සැරසී වෙල්යාය මැදින් වැටී තිබුණු අඩිපාර ඔස්සේ හෝ ගුරු පාරදිගේ පන්සලට සාමූහික ව පිවිසෙති. මෙසේ දහම් පාසල් ගිය දරුවන් තුළ වැඩුණු ශක්තිමත් ධර්ම අධ්‍යාපනය වූ නිසා පසුකලෙක එම දරුවන් වැඩිහිටියන් වුව ද එම හැදියාව ඔවුන්ගේ ජීවිතවල දක්නට ලැබේ. ඔවුන් විසින් සිදු කරන ආගමික කටයුතුවලදී පිරිසිදු බව, පෙර සූදානම හා පිළිවෙලට කටයුතු කිරීම වැනි ගුණාත්මක ලක්ෂණ දක්නට ලැබේ. එනිසා දහම් පාසල් අධ්‍යාපනයත් සමග දරුවන්ට ලැබෙන ශික්ෂාකාමී බව, හික්මීම, ආචාරශීලි බව, යහපතෙහි යෙදීම වැනි ගුණාංග සමුදායක් ජීවිතයට එක්වෙයි. එනිසා ළමා, තරුණ හා වැඩිහිටි සියලු දෙනා ම එක පවුලක් වශයෙන් සහයෝගයෙන් සාමූහිකත්යෙන් හා පරහිතකාමීත්වයෙන් දිවි ගෙවති.

වර්තමානයේ ඇතැම් දහම්පාසල් දරුවන් තුළ එබඳු ගුණාත්මක පසුබිමක් දක්නට නොලැබීම ඛේදයට කරුණකි. එයට හේතු වන්නේ දහම් පාසලෙන් ලැබෙන ශික්ෂණය හා ආචාරශීලි බව නොසලකා හැර තරඟකාරී විභාග මානසිකත්වයකින් හා අන්තර් දහම් පාසල් තරග ජයග්‍රහණයන් නිසා උද්දාමයට ගිය දුර්වල මානසිකත්වයකින් පසුවීමයි. නැතහොත් ඇතැමෙක් දහම් පාසල් අධ්‍යාපනය තවත් සහතිකයක් එකතු කර ගැනීමේ අරමුණින් නිරත වෙති.

දහම් පාසල යනු ගුණවත්කමින් අනූන සදාචාර සම්පන්න දරු පිරිසක් බිහි කරන ස්ථානයකි. එම දරුවන් සමාජයේ ජීවත් වන විට කැපීපෙනෙන ගුණාංග පෙන්නුම් කරයි. එබඳු සදාචාර සම්පන්න පිරිසක් සමාජයක ජීවත් වන විට ඔවුන්ගෙන් සෙසු පිරිසට සහනයක් ලැබේ. එසේම දෙමාපියෝ ද සිය දරුවන්ගේ හැදියාව, චර්යාව නිවැරැදි මගකට යොමු කරමින් ගුණවත් දුවෙක් පුතෙක් හදා ගැනීමට අපමණ වෙහෙසක් ගනිති. එබඳු ගුණවත් දුවෙක් පුතෙක් වෙසෙන පවුල් ජීවිත සුන්දර ය. එසේ ම දෙමාපියන්ගේ හිතට සැහැල්ලුව හා සතුට ඇති කරයි. පවුලේ සියලු දෙනා සාමූහිකත්වයෙන් බැඳී ජීවත් වෙති. දහම් පාසල් යන දරුවෝ දෙමාපියන්ට, ගුරුවරුන්ට, නෑදෑයන්ට හා අසල්වාසීන්ට සලකති. පන්සලේ හාමුදුරුවන් වහන්සේගේ බහට අවනත වෙති. එම දරුවෝ සමාජයේ කුදු මහත් කටයුතුවල දී නොපැකිල ව ඉදිරිපත් වී කැපවීමෙන් යුක්ත ව කටයුතු කරති. මෙනිසා දහම් අධ්‍යාපනය මෙරට සමාජය යහපත් කිරීමට අත්‍යවශ්‍ය වූ ම ආයතනයකි.

> “ දහම් පාසල් යන දරුවෝ දෙමාපියන්ට, ගුරුවරුන්ට, නෑදෑයන්ට හා අසල්වාසීන්ට සලකති. පන්සලේ හාමුදුරුවන් වහන්සේගේ බහට අවනත වෙති. එම දරුවෝ සමාජයේ කුදු මහත් කටයුතුවල දී නොපැකිල ව ඉදිරිපත් වී කැපවීමෙන් යුක්ත ව කටයුතු කරති. ”

දහම් පාසල් යන දරුවා බෞද්ධ සාහිත්‍යයෙහි ඇතුළත් චරිත කථා හා ජාතක කථා ඉගෙන ගනියි. එම චරිතවල ගුණාත්මක චරිත ලක්ෂණ සිය ජීවිතයට අදාළ කර ගනියි. එසේම බෞද්ධ දර්ශනය තුළ අන්තර්ගත මූලික ධර්ම කරුණු ඉගෙන ගෙන සිය ධර්ම ඥාණය වර්ධනය කර ගනියි. ධම්මපදය වැනි කෘතිවල ඇතුළත් ගාථා ඉගෙන ගෙන යහපත් හා ගුණාත්මක උපදෙස් හා ධර්ම කරුණු සිය ජීවිතයට බද්ධ කර ගනියි. අපගේ සංස්කෘතියෙහි අනන්‍යතාවය, සංස්කෘතියේ ලක්ෂණ ඉගෙන ගෙන ශ්‍රේෂ්ට ජාතියක් වශයෙන් නැඟී සිටීමට අවශ්‍ය පෞරුෂ ලක්ෂණ වර්ධනය කර ගනියි. අතීතයේ විසූ අපේ සිංහලයන් රට, ජාතිය හා ආගම වෙනුවෙන් සිදු කළ අමිල ජාතික මෙහෙවර ඉගෙන ගනියි. එබඳු වීර චරිතයක් වීමට සිය රුචිකත්වය මනස තුළ ගොඩනැගෙයි. අපගේ උරුමයන් හා අතීත ශ්‍රී විභූතිය මනාව ඉගෙන ගෙන සිය ජාතියට බුදු දහමට මහත් බැඳීමක් ඇති කරයි. බෞද්ධයකු වශයෙන් පන්සලට හා භික්ෂූන් වහන්සේලාට ඉටු කළ යුතු යුතුකම් නොපිරිහෙළා ඉටු කිරීමට යොමු වෙයි. වත්පිළිවෙත් හා පුද පූජාවන් නිසි පරිදි ඉටු කිරීමට අවශ්‍ය පුහුණුව දහම් පාසලෙන් ලැබේ. පසඟ පිහිටුවා වැඳීමට, අත්මාර්ථකාමී සිතිවිලි පරාජය කිරීමට, අනෙකා පරයා නැඟී නොසිටීමට, ඊර්ෂ්‍යාව, ක්‍රෝධය, වෛරය වෙනුවට මෙත් කරුණා ගුණ පැතිරවීමට කටයුතු කරයි. මෙසේ ගුණාත්මක දරුපිරිසක් සමාජයට දායාද කරන්නේ දහම් පාසල් අධ්‍යාපනයයි. එය දෙමාපියන් හා වැඩිහිටියන් වශයෙන් අප සියලු දෙනාම මැනවින් දැනගත යුතු කාරණයකි.

හැදියාව තුළින් ගොඩනැගෙන සභ්‍යත්වය දහම් පාසල් දරුවන්ගේ හැසිරීමෙන් දැකිය හැකි ය. ඇඳුම් පැළඳුම් භාවිතය සභ්‍යත්වයේ මූලික ලක්ෂණයකි. ලජ්ජා භය ඇතිව සමාජයේ හැසිරීමට දරුවන් යොමු වන්නේ බුදු දහමෙන් ඉගැන්වෙන ලෝකපාලක ධර්ම (ලජ්ජා හා භය) නිසාය.

**මෙම ලිපියේ ඉතිරි කොටස වප් අව අටවක පෝද 28 පත්‍රයේ පළවේ.**

**මහාචාර්ය**
**එච්. එම්. මහින්ද හේරත්**
පාලි හා බෞද්ධ අධ්‍යයන අංශය
පේරාදෙණිය විශ්වවිද්‍යාලය



## A+ පොසිටිව් වකුගඩුවක් අවශ්‍යයි

වකුගඩු අසාධිත අවුරුදු 20 පමණ අයෙකුට A+ පොසිටිව් වර්ගයේ වකුගඩුවක් ඉතා ඉක්මනින් අවශ්‍යව ඇත. ඒ සඳහා පිං කැමති පරිත්‍යාගශීලී අයෙක් සිටී නම් දුරකථන අංක **0762984984** ට අමතන්න.

## වකුගඩුවක් අවශ්‍යයි

කොට්ටාව පදිංචි බී. කේ. ඒ. කුමාරි මහත්මියට **ඕ පොසිටිව්** වර්ගයේ වකුගඩුවක් (වයස 35ත් 55 ත් අතර අයෙකුගේ) ඉතා ඉක්මණින් බද්ධ කිරීමට අවශ්‍ය බැවින් පරිත්‍යාගශීලියෙකු වේ නම් **071-6288680** දුරකථන අංකය වෙතින් විමසන්නැයි ඉල්ලීමක් කෙරේ.

## දැන් ලබාගත හැක

**ලංකා පංචාංග ග්‍රහස්ඵුට ලිත**

**2022-2023**

**මිල රු. 580/-**

**තැපැල් ගාස්තුව සමග 700/-**

ලියුම් හා මුදල්

**කළමනාකාර අධ්‍යක්ෂ,**

**ලංකා ජ්‍යොතිර් විද්‍යා පර්යේෂණායතනය,**

**422/ඒ, වැලිපාර, තලවතුගොඩ.**

**දුරකථන : 0112-773226, 0112-773529**

## අනුරාධපුර දිස්ත්‍රික්කයේ ත්‍රිකුණාමලයට මායිම්ව පිහිටා ඇති

දුෂ්කර ගම්මානයක, වන සත්තුගෙන් හානි සහිත පරිසරයක පිහිටි අප විහාරස්ථානයේ

**චෛත්‍ය රාජයාණන් වහන්සේ ඉදිකර ගැනීමට ආධාර පතමි.**

**දු. ක. 0714429377**

## ආරණ්‍ය සේනාසනයක් සඳහා සුදුසු ඉඩමක් අවශ්‍යයි

මේ සඳහා ඉඩමක් විකිණීමට, තිබෙන ඉඩමක් පූජා කිරීමට හෝ මිලදීගෙන පූජා කිරීමට කැමති පිංවතුන්

**අමතන්න - 0763986300**

## ලුම්බිණි

රෙ:නො: W5510




විශ්වාසවත්, පිරිසිදුවත්, විනයානුකූලවත්, අටපිරිකරක් ලබා ගැනීමට ලුම්බිණි වෙළඳසැල වෙතම යන්න.

අපිරිකර සහ පූජා භාණ්ඩ ප්‍රමුඛයෝ

**ලුම්බිණි**

**ස්ටෝර්ස්**

**65, ඕල්කට් මාවත, පිටකොටුව**

**දුරකථනය: 2324814**

## වැඩිහිටියන් හට නවාතැන්

අලුතින් ආරම්භවූ වැඩිහිටි නිවහන සඳහා මව්පියන් බඳවාගනු ලැබේ. වෛද්‍ය උපදෙස් මත සකසන ප්‍රනීත ආහාරපාන කාරුණික සාත්තු සේවය වෛද්‍යසායන මාසික වෛද්‍යසායන භාවනාව පැරණි ගීත හාස්‍ය උපදවන මනෝචිකිත්සා වැඩසටහන් ඇතුලුව ජීවිතාන්තය දක්වා ආගමානුකූලව සුවසේ සිටිය හැකි නිදහස් පරිසරයක පිහිටි ස්ථානයකි.

**0710903803**

## ලංකා ජ්‍යොතිර් විද්‍යා පර්යේෂණ ආයතනයෙන් 2022 ට ඔබට දෙන තවත් සිතුම්ණකි

## ලංකා නැකත් ලිත 2022

**LANKA NEKATH CALENDAR 2022**

**සමග ලංකා ගොවි ලිතද ඇත**

**LANKA FARMERS ASTROLOGICAL GUIDE 2022**

| | | |
|---|---|---|
| ✻ | මහා නක්ෂත්‍ර නැකැත් | 87 ක්ද, |
| ✻ | ගොවි නැකැත් | 550 ක්ද, |
| ✻ | චූල නක්ෂත්‍ර නැකැත් | 600 ක්ද ඇතුළත් |

### 2022 ලංකා නැකැත් කැලැන්ඩරයෙහි

සැම දිනකම ඉර උදාව, බැසීම, රාහු කාලය, විස කලා, නැකැත්, තිථිය ආදී පමණක් නොව ලිත භාවිතයට උපදෙස් ද එහිම ඇත.

**මෙතෙක් ලංකා කැලැන්ඩරය භාවිත කළ දස දහස් ගණනක් ඉන් ඉහළම ඵල ලබා ඇත. ඔබත් එකක් මිලදී ගෙන ප්‍රතිඵල ලබාගන්න. එකක් රුපි. 250/= තැ. ගා. සමග රුපි. 350/= කි.**

### ලංකා ජ්‍යොතිෂ දින පොත 2022

**LANKA ASTROLOGICAL DIARY 2022**

බොහෝ ජ්‍යොතිෂ කරුණු ඇතුළත් මහා නැකැත් 87, ගොවි නැකැත් 550 සහ චූල නැකැත් 600 ක් අන්තර්ගත වේ. පරිහරණයට පහසුයි. අලංකාර පිට කවරයකි. රාහුකාලය, හිරු නැගීම, බැසීම, මරු සිටින දිශාව ඇතුළත්ය.

**එකක් රු. 220/= කි. තැ.ගා. සමග රු. 300/= කි.**

### ලංකා ජ්‍යොතිෂ චූල දින පොත 2022

**LANKA ASTROLOGICAL SLIM DIARY 2022**

මෙය ඉතා හුරුබුහුටිය, ලස්සන නිමාවකින් හා ලස්සන ප්ලාස්ටික් කවරයකින් යුක්තය. මෙය කුඩා නිසා නිතර සාක්කුවේ රැගෙන යාම වඩාත් පහසුය.

1. රාහු කාලය හා ඉර උදාව, ඉර බැසීම යන කරුණු වර්තමාන ඔර්ලෝසු කාලයෙන් දක්වා ඇත. ඒනිසා ඔබට රාහු කාලය මගහැර කටයුතු කිරීම ඉතා පහසුයි. ගණන් සෑදීම අවශ්‍ය නොවේ. විශේෂ නැකැත් නොබැලුවත් රාහු කාලය මගහැර ඔබේ සුබ කටයුතු යොදා ගන්න.
2. පෝය අවුරුදු චාරිත්‍ර ශුභ දවස් සහ ශුභ දිසාව මරු සිටින දිසාව ශුභ හෝරාව ආදී ජ්‍යොතිෂ කරුණු ද රාශියක් ඇතුළත්ය.
3. සෙසු සියලු ස්ලිම් දින පොත්වල දැක්වෙන කරුණු ද ඇතුළත් නිසා දින පොත් දෙකක් මිලට ගැනීමට අවශ්‍ය නොවේ.

**(පිටපතක් රු. 100/= කි. ලි.ප.තැ.ගා සමග රු. 190/= කි.)**

**සියලුම වෙළඳසැල්වලින් ලබාගත හැකියි.**

**සියලුම විමසීම්, ලියුම් හා මුදල්**

**කළමනාකාර අධ්‍යක්ෂක**

**ලංකා ජ්‍යොතිර් විද්‍යා පර්යේෂණායතනය,**

**නො. 422 ඒ, වැලිපාර,**

**තලවතුගොඩ.**

**දුරකථන: 0112773226, 0112773529**

## බෞද්ධයන් හට ආගමික ශාසනික කටයුතු කර ගැනීමට අවශ්‍යතා ඇති දුෂ්කරතා ඇති ගම් පළාත් වේ නම් දන්වන්න.

**සුමනවංශ හිමි**

**0777991893, 0712162783**

පහසුකම් ප්‍රතිලාභ අවශ්‍ය නැත. ශාසනික සේවයක් ලෙස උදව් උපකාර කිරීමට කැමතියි.

## උපසම්පදා ලත් හිමි නමක්

**කුඩා ආවාසයක් හෝ කෙනෙක් නොමැති පන්සලක් සොයමි.**

ගම්පහ – කැගල්ල විශේෂයි.

**0712814767**

මාතර නගර ආසන්නයේ පදිංචි නිවස සහ තවත් දේපළ සසුනට පූජා කළ සහෝදරියගේ කැමැත්ත තවදුරටත් සුපුරුදු පරිසරය තුළ ජීවත් වීමය. ව්‍යාපාරික සැමියාගේ මරනින් පසු දරුවන් නොමැති ඇයට තම වැඩකටයුතු කරගත හැකි අතර, උයාපිහාදී ගෙදර දොර වැඩ කටයුතු කරගෙන ඇය හා එකහා සමානව ජීවත් වීමට කැමති පවුල් බරින් තොර නිරෝගී මැදිවියේ මවක් රු. 20,000/– පමණ වේතනයකට අසල්වැසි සහෝදරයා සොයයි.

**විමසීම් : 071-8224742.**

ජීවිතය විඳවන්නේ නැතුව සැනසෙන්න

සන්ධි වේදනාවන්ට ප්‍රත්‍යක්ෂ සහනය



වාත පත්තුව



ශ්‍රී ලංකාවේ අංක 1

වාත තෛලය®




- කොන්දෙ කැක්කුම
- දණිස් කැක්කුම
- ආතරයිටීස්
- හන්දිපත් වේදනාව
- මාංශපේශි කැක්කුම
- නහරගත වේදනා
- කෙණ්ඩ පෙරලීම

ඉහත රෝගයන්ට ප්‍රත්‍යක්ෂ සුවය දෙයි.!

ලබාගත හැකි ස්ථාන :-

Manufactured & Marketed by

**Jeewaka Herbal Products (Pvt) Ltd**

070 1979 702

# සිංහල ඉතිහාසයේ අසිරිමත් වංශ කතාව

# මහාවංසය



> මෙම පූජනීය සහ පුද්ගල වංසකතා අතරෙහි දැයේ වංසකතාව රචිත මහාවංසයක් අපට හිමිවීම ලොව අන් කවර රටකටත් නො ලද භාග්‍යයකි.

**අපේ ඉතිහාසය විමසා බලන්නට අපට උරුම අපූර්ව සාහිත්‍යයකි වංසකතා. පාලි හා සකු සාහිත්‍යය ඇසුරෙන් මෙම සාහිත්‍යාංගය අපට හිමි විය. රඝුවංශය වැනි සංස්කෘත වංසකතා මෙන් ම බුද්ධවංශ, අනාගත වංශ වැනි පාලි වංසකතා ඇසුරෙන් අපගේ වංශ කථා සාහිත්‍යය බිහි වන්නට ඇතැයි සිතිය හැකි ය.**

ශ්‍රී ලංකාවේ දී වංසකතා සාහිත්‍යය නව මගකට අවතීර්ණ වන්නේ පූජනීය වස්තු මූලාශ්‍රය කොට වංසකතා සාහිත්‍යයක් බිහි වීමෙනි. බෝධීන් වහන්සේ, දළදා වහන්සේ ඇතුළු පූජනීය වස්තූන් අපට ලැබුණු විට ඒවායෙහි පරම්පරාව, ඉතිහාසය මතු නොව ඒවාට කළ යුතු පුද පූජා පිළිවෙළ ද ලියා තැබීමට අවශ්‍ය විය. එය නවතම සාහිත්‍යාංගයක් අපට එක් කිරීමෙනි. බෝධි වංශය, දළදා සිරිත, කේසධාතු වංශය, ථූපවංශය වැනි වටිනා කෘති එයින් අපට උරුම වේ.

තවත් පසෙකින් වංසකතාව විකසිත වන්නේ පුද්ගලයන් වටා ද වංසකතා ලියන්නට පෙළඹීමෙනි. දඹදෙණි කාලයෙහි පාලියෙන් ලියැවෙන හත්ථවනගල්ල විහාර වංශය එවැන්නකි. අත්තනගලු විහාරයේ වංශ කථාව ලියනු අටියෙන් මේ කෘතිය රචිත වුව ද සැබවින් ම සිරිසඟබෝ චරිතයේ විශිෂ්ටත්වය කියාපෑම එහි අරමුණ විය.

මෙම පූජනීය සහ පුද්ගල වංසකතා අතරෙහි දැයේ වංසකතාව රචිත මහාවංසයක් අපට හිමිවීම ලොව අන් කවර රටකටත් නො ලද භාග්‍යයකි. ක්‍රි.පූ. හයවන සියවසෙහි සිට වර්තමානය දක්වා ශ්‍රී ලංකාවේ ලිඛිත ඉතිහාසය මෙම මහාවංසයට ඇතුළත් ය. මහාවංසය ලියැවෙන්නේ පස් වන සියවසෙහි මහානාම නම් මහාවිහාරයික භික්ෂුවක් අතිනි.

මහාවංස කතුවරයා ග්‍රන්ථාරම්භයේ දක්වා ඇති පාඨයක් විමසා බැලීම මහාවංසයේ ශ්‍රේෂ්ඨත්වය ඉස්මතු කරවයි. පැරැන්නන් විසින් සම්පාදිත වූ එය ඇතැම් තැනෙක ඉතා විස්තර සහිතව ද තවත් තැනෙක ඉතා සංක්ෂිප්තව ද ඇති අතර, තවත් තැනක් පුනරුක්තයෙන් ගහන ය. මේ දෝෂයන්ගෙන් මිදී අවබෝධ කර ගැනීමට හා ධාරණය කර ගැනීමට පහසු අන්දමින් පහන් සංවේගය ඇති කරවමින් රචිත මෙම ග්‍රන්ථයේ මුඛ පරම්පරාවෙන් පැවත ආ පුරාවෘත්ත ඇතුළත් වේ.

උක්ත උද්ධෘතය තුළ මහාවංස කතුවරයා මහාවංසයට මුල් වූ කෘතියක් ගැන සඳහන් කරයි. එය එක් කෘතියක් නොව කෘති කිහිපයක් ද වන්නට ඇත. විශේෂයෙන් දීපවංශය නමැති කෘතියක් මේ වන විටත් සම්පාදිත ව පැවතුණි. පස් වන සියවස දක්වා ලංකා ඉතිහාසයෙහි කරුණු සංක්ෂිප්තයක් දීපවංශයෙහි දැක් වේ. ලංකා ඉතිහාසය ලියන්නට ගත් පළමු ප්‍රයත්නය ලෙස දීපවංශය ඇගයේ. මහානාම හිමියන් පස් වන සියවස දක්වා ලංකාවේ ඉතිහාසය ගොඩ නගද්දී දීපවංශාගත තොරතුරු ඉතා වැදගත් මූලාශ්‍රයක් කොට ගන්නට ඇතැයි සිතිය හැකි ය. කරුණු ඉදිරිපත් කිරීමේ දී දුර්වලත්වය හේතුවෙන් දීපවංශයට මහාවංසය තරම් ශ්‍රේෂ්ඨ ස්ථානයක් වංශකතා සාහිත්‍යයේ දී හමු නොවේ. එහෙත් මහාවංසගත නොවූ ඇතැම් කරුණු ගවේෂණය කරන ඉතිහාසඥයෝ අදත් දීපවංශය ද සමීප කෘතියක් සේ භාවිත කරති. මේ අනුව මහාවංස කතුවරයා පළ කරන මුල් කෘති අතර එක් කෘතියක් ලෙස දීපවංශය දැක්වීම නිවැරැදි ය.

මේ හැර මහාවංසයට මුල් වූ සිංහල කෘතියක් පිළිබඳව ද වංසකතාකරුවන්ගේ අවධානය යොමු වෙයි. එය වංසත්ථප්පකාසිනී නම් මහාවංස ටීකාවෙහි දැක්වෙයි. බුද්ධඝෝෂ අටුවාකරණයක් සමග පාලි බසෙහි මතු වූ ප්‍රබෝධය හේතුවෙන් මෙම සිංහල වංශකතාව මාගධියෙන් තබන්නට යෑම හේතුවෙන් පාලි මහාවංසයක් ලියැවෙන්නට ඇතැයි ද ඇතැමෙක් කල්පනා කරති. එපමණක් නොව බුද්ධඝෝෂ අටුවා කෘතින් ද මහාවංසකරුවාට මූලාශ්‍රය වන්නට ඇත. විශේෂයෙන් සීහලට්ඨ කතා අටුවාවෙහි ඇතුළත් බොහෝ කරුණු මහාවංසකරුවා තම කෘතියට පාදක කරගන්නට ඇත. ඒ අනුව කතුවරයා පවසන ප්‍රධාන මූලාශ්‍ර තුනක් ඔස්සේ මහාවංසය සැකසෙන්නට ඇත. එනම් දීපවංශය, සිංහල වංසකතාව සහ සීහලට්ඨ කථා යන්න යි.

මහාවංසකරුවාගේ රචනා රීතිය කුමක් ද යන්න ආරම්භක පාඨයෙහි දැක්වූයේ ග්‍රන්ථයන්හි පැවති සංක්ෂිප්ත අවස්ථා විස්තර කරමින් ද, විස්තරාත්මක අවස්ථා සංක්ෂිප්ත කරවමින් ද, පුනරුක්තයන් බැහැර කරමින් ද කළ බවයි. විශේෂයෙන් සංක්ෂිප්තකරණයේ දී ඉතා වැදගත් පාරම්පරික ඥාන සම්භාරයක් අපට අහිමි වූවාට සැක නැත. කෙසේ වෙතත් මහාවංසය යනු මූලාශ්‍ර ග්‍රන්ථවල පදානුපදික පරිවර්තනයක් නොව ඉතාම ස්වාධීන රචනා රීතියකින් වැඩුණු සාහිත්‍ය ග්‍රන්ථයක් ලෙස ඇගයීමට ලක් කළ හැකි ය.


මහාවංස කතුවරයා මහාවිහාරික භික්ෂුවක ලෙස ථෙරවාදයේ මුර දේවතාවකු වී සිටියේ ය. යන්න අවිවාදිත ය. මූලාශ්‍රයන් හි සැකෙවින් විවරණය වූ දුටුගැමුණු චරිතය මහාවංස කතුවරයා පරිච්ඡේද ගණනාවකින් විවරණය කරන්නේ ද ඒ නිසා විය යුතු ය. මහාවංස කතුවරයා මෙම වංසකතාව රචනා කරන්නේ පහන් සංවේගය හා හුදී ජන ප්‍රසාදය පිණිස ය. කර්තෘ බෞද්ධ භික්ෂුවක වූ හෙයින් එවැනි අදහසක පිහිටියා වන්නට ඇත. රජවරුන්ගේ බලපරාක්‍රමය ආදිය උසස් ලෙස වර්ණනා කළ ද අවසානයේ සියල්ලන් මරුගේ වසඟයට ගිය බව දක්වන්නේ උක්ත අදහසෙහි පිහිටා විය යුතු ය.

ආශ්චර්යවත් කථා පුවත්වලින් මහාවංසය පිරී පැවතිය ද කතුවරයා ගේ වැඩි ම අවධානය යොමු වී ඇත්තේ ලංකා ඉතිහාසය වාර්තා කර තැබීම කෙරෙහි ය. විශේෂයෙන් රජ කෙනකුගේ පාලන කාලය තුළ බුද්ධාගමේ දියුණුව පිණිස කළ පුණ්‍යක්‍රියා මෙහි වාර්තා කෙරිණි. මීට හේතුව ආගම මනුෂ්‍ය ජීවිතයේ ප්‍රබල අංගයක් ව පැවතීම නිසා විය යුතු ය. තත්කාලීන දේශපාලනය හා ආර්ථිකය සම්බන්ධයෙන් තතු සියල්ල වාර්තා කර තබන්නට කතුවරයා එතරම් උත්සුක වූ බවක් නො පෙනේ.

ඇතැම් කල්පිත මත ඉවත ලා ඉතා පරික්ෂාවෙන් බැලූ විට මහාවංසය ලංකාවේ ඉතිහාසය පිළිබඳ විවරණය කෙරෙන විශ්වාසනීය මූලාශ්‍රය ලෙස විද්වත්හු පිළිගනිති. විශේෂයෙන් ශිලා ලේඛනගත කරුණුවල සත්‍ය අසත්‍ය බව නිශ්චය කර ගැනීමට මහාවංසය ප්‍රබල සාධකයක් ව පවතී. එමෙන් ම ශිලා ලේඛනගත රාජ පරම්පරා තීරණය කර ගැනීමට මහාවංසය මඟ පෙන්වයි. බොහෝ විට ශිලා ලේඛනමය කරුණු හා මහාවංසයේ තොරතුරුවල සාම්‍යයක් පවතී. මේ නිසා මහාවංසයේ ඓතිහාසික අගය බොහෝ පඬිවරුන්ගේ අවධානයට යොමු විය. ජෝර්ජ් ටර්නර්, හර්මන් ඕල්ඩෙන්බර්ග්, විල්හෙල්ම් ගයිගර් වැනි බටහිර උතුන් මෙන් ම ආනන්ද ගුරුගේ වැනි දේශීය උගතුන් ද ඒ අතර විශේෂයෙන් දැක්වෙයි.

ක්‍රි.ව පස්වන සියවසේ ලියැවෙන්නට ආරම්භ කළ මහාවංසය මේ දක්වා අඛණ්ඩ ව රචනා වීම ද විශේෂ කරුණකි. එය ආරම්භයේ සිට 1978 දක්වා කොටස් පහකින් රචනා කොට තිබේ. පළමු කොටස ආරම්භයේ සිට ක්‍රි. ව. 301 දක්වා ද, එතැන් සිට 1815 දක්වා දෙවැනි කොටස ද, 1815 සිට 1936 දක්වා හතරවන කොටස ද, 1956 සිට 1978 දක්වා පස්වන කොටස ද ලෙසින් ඉතිහාසය රචනා කර තිබෙයි. එහි හය වන කොටස 1978 සිට 2010 දක්වා වර්තමායේ සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ මෙහෙයවීමෙන් ලේඛනගත වෙයි. මහාචාර්ය විමල් බලගල්ල හා මහාචාර්ය මාලනී ඇඳගම දෙදෙනාගේ ප්‍රධානත්වයෙන් ප්‍රවීණ ලේඛක මඬුල්ලක් විසින් මෙම කාර්යය මෙම වසරේදී නිමාවට පත් කෙරෙනු ඇත.

සිංහල ඉතිහාසයේ අසිරිමත් වංසකතාව මහාවංසය දැයට ආභරණයකි.




මොරටුව ලුනාව උයන පාරේ
බෝධිරාජාරාමාධිපති
කොළඹ විශ්ව විද්‍යාලයේ
මහාචාර්ය
**අගලකඩ සිරිසුමන හිමි**

# ප්‍රහේලිකා අංක 20

බුදුසරණ
ත්‍යාග අනුග්‍රහය බෞද්ධාලෝක පදනම

**බුදුසරණ ප්‍රහේලිකාව ඉදිරිපත් කිරීම මහාචාර්ය කිවුලේගෙදර නාරද හිමියන්ගේ අනුශාසකත්වයෙන් කේ. එල්. ඒ. රණසිංහ විසිනි.**




**හරහට**

01. ලක්දිවට බුදුසමය හඳුන්වා දෙනු ලැබුවේ දඹදිව විසූ මෙම ශ්‍රේෂ්ඨ අධිරාජ්‍යයා ය.

03. සතර මහා භූතයන්ගෙන් එකකි.

04. දෙමව්පියන් තම දියණියන් විවාහ කරදීමේ දී දෙනු ලබන තම වත්කම් කොටසයි.

06. අරළු, බුළු සහ නෙල්ලි සංයෝගය මෙනම් කසාය ලෙස හැඳින්වෙයි.

08. මෙම පදයෙන් ලජ්ජාව යන අදහස කියැවෙයි.

09. ජෛන ආගමේ කර්තෘවරයා මෙනමින් ද හැඳින්වෙයි.

**පහළට**

01. බුද්ධ කාලයෙහි තිබූ සොළොස් මහ ජනපදයන්ගෙන් එකකි.

02. වීදුරු වළලු මෙනම් වළලු ලෙස ද හැඳින්වේ.

03. අබෞද්ධයන් සමඟ මේවා පැවැති අවස්ථා පහේදී ම මිගෙට්ටුවත්තේ හිමියෝ බෞද්ධ පාර්ශ්වය මෙහෙයවී ය.

05. සිංහල රාජ සමයේ තිබූ උසස් පාලන තනතුරකි.

07. අටවිසි බුදුවරුන්ගෙන් එක් නාමයකි.

08. පූර්ණක නම් යක්ෂ සේනාධිපතියා ගැන කියැවෙනුයේ මෙම ජාතක කතාවෙහි ය.

**පිරුවානා පොත් වහන්සේ ඇතුළු වටිනා ධර්ම ග්‍රන්ථ කට්ටලයක් පිරිනැමේ.**

**බුදුසරණ කර්තෘ, ලේක්හවුස්, ඩී. ආර්. විජයවර්ධන මාවත, කොළඹ ලිපිනයට ප්‍රහේලිකාව පුරවා තැපැල්පතක අලවා, එහි දුරකතන අංකයක් ද සඳහන් කර එවීමට අමතක නොකරන්න.**

පෝදා පින්කම්



## ඓතිහාසික ශ්‍රී කල්‍යාණි රාජමහා විහාරය

වප් පුර පසළොස්වක පෝදින සීල භාවනා වැඩසටහන - පෙ. ව.06.00 - 06.30 සීල සමාදානය ශ්‍රී කල්‍යාණි රාජමහා විහාරයේ කෘත්‍යාධිකාරි ශාස්ත්‍රවේදී රත්දිලිගම මහින්ද හිමි. උදෑසන බුද්ධ පූජාව, ,07.00-08.00 උදේ දානය හා විවේකය. 08.00-09.00 භාවනා ශ්‍රී කල්‍යාණි උභය රාජමහා විහාරාධිපති, කැලණිය විශ්වවිද්‍යාලයේ පාලි හා බෞද්ධ අධ්‍යයනාංශයේ මහාචාර්ය කොල්ලුපිටියේ මහින්ද සංඝරක්ඛිත නාහිමි. දායකත්වය ශ්‍රී කල්‍යාණි රාජමහා විහාරස්ථ සීල භාවනා සමිතිය . 09.00-10.00 පෙරවරු ධර්ම දේශනාව අතුරුගිරියේ සුබෝධ හිමි, 10.00-11.00 ධම්මපදයෙන් බිඳක් ශාස්ත්‍රවේදී කැලණියේ ශාසනවංශ හිමි, දායකත්වය දරන්නේ සමන්දා විජේමාන්න මිය යි. 11.00-11.30 දිවා බුද්ධ පූජාව විචිත්‍රභාණක ගොඩපොළ නන්ද හිමි. 11.30-12.00 දිවා දානය හා විවේකය. පස්වරු 12.15-02.00 සීල භාවනා සමිතිය , 02.00 -03.00 විශේෂඥ වෛද්‍ය දේශනය , 03.00-04.00 පස්වරු ධර්ම දේශනාව සියඹලාගොඩ ධම්මින්ද හිමි, 04.00-05.00 ධර්ම දේශනාව ශාස්ත්‍රවේදී කැලණියේ ශාසනවංශ හිමි .05.00-06.00 භාවනා මහාචාර්ය කොල්ලුපිටියේ මහින්ද සංඝරක්ඛිත නා හිමි, දායකත්වය දරන්නේ ශ්‍රී කල්‍යාණි රාජමහා විහාරස්ථ සීල භාවනා සමිතියයි. 06.00-07.00 ගිලන්පස බුද්ධ පූජාව ආචාර්ය දෙතියායේ පඤ්ඤාලෝක බුද්ධරක්ඛිත හිමි.


**අසරණ දැහැමි සත්‍යවාදී වැඩිහිටියෙකුට හෝ ස්වෝත්සාහයෙන් ජීවත්වීමට උත්සාහ කරන**
කුඩා පවුලකට කිසියම් උපකාරයක් කිරීමට කැමැත්තෙමි.
**0762765489**

**කැපකරුවෙකු සහ කුලදරුවන් අවශ්‍යයි.**
කඩවත විහාරස්ථානය.
076-9263407, 071-8502253

**බෞද්ධ වැඩිහිටි කාන්තා (විශ්‍රාමික) නිවාසයක නේවාසික වීමට, සුදුසු වැඩිහිටි නිවාසයක් කොළඹ අවටින් සොයමි.**
071-8248396 විමසන්න.
(යම් ගෙවීමක්ද කළ හැකිය)

**උපසපන් හිමිනමක් පංසලක් සොයයි**
වසා ඇති හෝ ගුරු හිමිනමක් යටතේ වුවද කම් නැත.
අමතන්න :
**070-5659593, 071-7047111**

ගම්පහ ගනේමුල්ල ප්‍රදේශයේ වැඩිහිටි නිවාසයක
**මව්වරු සඳහා පමණක් ඉඩ ඇත.**
0112228059 / 0117179727

**අසනීප වැඩිහිටි කාන්තාවක් බලා ගැනීමට කාන්තාවක් සොයයි.**
**0112-792201**

**පිංවතුනි**
බුද්ධ පූජාව පූජා කිරීම සඳහා පාත්‍ර, අෂ්ඨපාන භාජන, දෙසිත් ව්‍යංජන භාජණ පූජා කරන්න. ඉතා කුඩා බුදු මැදුරේ සිවිලිම සකසා ගැනීමට උපකාර කරන්න.
**මෙයට, විහාරාධිපති හිමි**
**0773671680, 0703161274**

**ඉඩමක්**
පිංවතෙකුගෙන්
**පර්. 05 ඉඩම් කැබැල්ලක්**
(කොළඹ හෝ අවටින්) ලබා දෙන්නේනම් මැනවි (කොන්දේසි සහිතව හෝ රහිතව)
TP. 0765858354

**වකුගඩුවක් අවශ්‍යයි**
A පොසිටිව් හෝ O පොසිටිව් වර්ගයේ වකුගඩුවක් අවශ්‍යයි. පින් කැමති පරිත්‍යාග ශීලියෙක් ඇත්නම් අමතන්න.
**0779825297**

**දාන පාරමිතා**
වනවාසී භික්ෂූවකගේ මනසට නිරතුරුවම වදදෙන, ගිහි කල ඇති වූ මූල්‍යමය ගැටලුවකට පිහිට විය හැකි පිංවතුන් වේ නම් අමතන්න.
0722131861

**නොමිලේ ඉංග්‍රීසි දැනුම**
ගරු ස්වාමීන් වහන්සේලාට හා දස සිල් මාතාවන්ට මුල සිට ඉංග්‍රීසි දැනුම නොමිලේ ලබා දෙනු ලැබේ.
online පාඨමාලාව.
**විමසන්න : 071-8312958**
Whats App : 076-6609012

**කුරුණෑගල නගරයේ**
විහාරස්ථානයක කටයුතු කරගෙන නැවතී සිටීමට හැකි පවුල් බරින් තොර අයෙකු සහ පැවිදි කිරීමට කුල දරුවන් අවශ්‍යයි.
**076-9775558**

**දකුණු පළාතේ මැදිවියේ හිමිනමකට**
බාරගෙන වැඩසිටීමට විහාරස්ථානයක් සොයයි.
**0702470608**

**අප විහාරස්ථානයට ප්‍රත්‍ය පහසුකම් ඉතාම හිඟයි**
උදව් කරන්න.
**කඨින පිංකමටද අනුග්‍රාහක පිංවතුන් අවශ්‍යයි.**
077-8325775

**සැමදා නොමිලේ**
බෞද්ධයෙනි. දිනපතා මේ රටේ ලක්ෂ කෝටි ගණනින් අහිංසක ගවයන්, එළුවන්, ඌරන්, කුකුලන්, මසුන් මරනු ලබන්නේ ඔබලාගේ මාංශ තෘෂ්ණාව සපිරීම සඳහාය. මාංශ අනුභවය සතර අපා දෙර විවර කරයි. නිර්මල අවිහිංසා ධර්මය නොමිලේ !
0717679254

**විහාරස්ථානයක් සොයනු ලැබේ.**
**0726722441**
**0773758013**

**මාතර දිස්ත්‍රික්කයේ**
**අකුරැස්ස නගරයට ආසන්නව විහාරස්ථානයක නේවාසිකව වැඩසිටි ආගමික වතාවත් ඉටුකිරීමට වයස 40 ට වැඩි භික්ෂූන් වහන්සේ නමක් අවශ්‍යයි. අමතන්න.**
**071-8182782**

**කඨිනානිසංස**
මෙම වස්කාලය තුළ මහා සංඝරත්නය පහළොස් නමක් වැඩ හිඳින විහාරස්ථාන සංඝාවාසයේ දිරාපත් වහලය සකස් කරගැනීමට දායකත්වය ලබාදීමෙන් කුසල් රැස්කරගන්න.
විමසීම් :
0716298663, 0779769711

**කාරුණික දැන්වීමයි**
අසාධ්‍ය රෝගියෙකුට
O+ වර්ගයේ
**වකුගඩුවක්**
අවශ්‍යව තිබේ.
පරිත්‍යාගශීලියෙකු සිටිනම් අමතන්න.
ජනක - 0719 80 78 63
0766 91 06 00

**නොමිලේ**
බුද්ධ ශාසනයට අනුපමේය සේවයක් කළ අපවත්වී වදාළ නාඋයනේ අරියධම්ම මහා ස්වාමීන් වහන්සේගේ යතිවර පැනවිසඳුම් පොත ලබා ගැනීමට ඔබගේ පැහැදිලි අත් අකුරින් ඔබගේ ලිපිනය පහත සඳහන් ලිපිනයට ලැබෙන්න සලස්වන්න.
**සුමනදාස සෙන්දනායක**
**17/14, ගාමිණී මාවත,**
**මතුගම.**

**විශ්‍රාමික සහ අසරණ වැඩිහිටියන් සඳහා හොරණ නගරාසන්නයේ නිසංසල පරිසරයක නේවාසික පහසුකම් ඇත.**
**ඉදිකිරීම් කටයුතු සඳහා ඔබගේ ආධාරයද අවශ්‍යයි.**
071-8011656,
071-4220117




# දකුණු සිරිලක එළියකරන මාතර පාලටුවේ බෙත්තාරාම මහ වෙහෙර

ක්‍රි.ව. 1753 ඇසළ පුර පසළොස්වක පොහෝදින වැලිවිට අසරණ සරණ සරණංකර නාහිමියන්ගේ අප්‍රතිහත ධෛර්යයත්, කීර්ති ශ්‍රී රාජසිංහ රජුගේ රාජ්‍ය අනුග්‍රහයත් නිසා දීර්ඝ කාලයක් අභාවයට පත් ව තිබූ උපසම්පදාව සියම් දේශයෙන් වැඩම වූ උපාලි මාහිමිපාණන් වහන්සේගේ ප්‍රධානත්වයෙන් පිහිටුවන්නට හැකිවිය. මේ හේතුවෙන් දිවයිනේ බොහෝ පළාත්වලින් දිසාවලින් පැමිණි සිල්වත් පිරිස ඓතිහාසික සෙංකඩගල පුරයේදී උතුම් උපසම්පදාව ලබා ගත් හ. ඒ අතර ප්‍රමුඛත්වයක් ගන්නා ලද වේහැල්ලේ ධම්මදින්න මහා ස්වාමීන්ද්‍රයාණන් වහන්සේ දැක්විය හැකි ය.

ක්‍රි.ව. 1728දී මහනුවරට වැඩමවා ශාසනික හා ශාස්ත්‍රීය කටයුතුවල යෙදුණ ධම්මදින්න හිමියෝ 1751 දී කීර්ති ශ්‍රී රාජසිංහ රජතුමා විසින් කුට්ටාපිටිය හා පැල්මඩුල්ල විහාර හා ශ්‍රීපාද විහාර නායක පදවිය ද තඹ සන්නසකින් පුද කළ අතර, මාතර පළාතේ හා සපරගමු පළාතේ ශාසනික ධර්ම ශාස්ත්‍රීය සත්ක්‍රියාවන්හි නිරත වූහ.

සඟරාජ මාහිමියන් වෙතින් මහණ උපසම්පදාව ලබා ගත් දෙහිගස්පේ අත්ථදස්සී හිමියන් උන්වහන්සේගේ ශිෂ්‍යයන් අතර සයවැන්නා විය. මාතර පාලටුව ආදි විහාරස්ථාන රැසෙක සමාරම්භකයාණන් වූයේ උන්වහන්සේ ය. මෙම පාලටුව සඟ පරපුරෙහි හත්වැනියා වූයේ පාලටුවේ සෝණුත්තර හිමිපාණන් ය. උන්වහන්සේගේ ශිෂ්‍යයන් වහන්සේ වූයේ ඇටම්පල රතනපාල හිමියන් ය.

පාලටුවේ සෝණුත්තර හිමියන් තම ශිෂ්‍ය නම කොළඹ හුණුපිටියේ ගංගාරාම විහාරස්ථානයෙහි නතර කොට මාලිගාකන්දේ විද්‍යෝදය පිරිවෙණේ අධ්‍යාපනය ලැබීමට පහසුකම් සැලැස්වූහ. හික්කඩුවේ ශ්‍රී සුමංගල, මහගොඩ ඤාණේශ්වර මාහිමියන් වහන්සේලා ඇසුරෙහි දැන උගත්කම් ඇතිකරගත්



විහාරාධිපති
**පාලටුවේ ජිනරතන නාහිමි**

උන්වහන්සේ පාලටුවේ බෞද්ධෝදය පිරිවෙණ ඇරඹීය.

එම ඇටම්පල රතනපාල හිමියන්ගේ ජ්‍යෙෂ්ඨ ශිෂ්‍යයන් වහන්සේ වූයේ මාලිම්බඩ ගුණරත්න නාහිමියන් වහන්සේ ය. උන්වහන්සේ සුවිශාල ධර්ම ශාස්ත්‍රීය සේවාවක් පාලටුව, උනැල්ල, අත්තුඩාව හා මාලිම්බඩ යන ප්‍රදේශවල ඇති කළහ. ප්‍රදේශයේ දූ දරුවන්ගේ නැණ නුවණ පෑදීමට එය හේතු විය. මාලිම්බඩ චන්ද්‍රරතන හිමියන්ගේ ශිෂ්‍ය නමක් වූ පාලටුවේ ජිනරතන ස්වාමීන් වහන්සේ අද මෙම පාලටුව බෙත්තාරාම විහාරස්ථානයේ ආධිපත්‍යයට පත්ව සිටිති.

පාලටුවේ බෙත්තාරාම විහාරස්ථානයේ ස්වර්ණමය යුගය වන්නේ ගරු පාලටුවේ ජිනරතන හිමියන්ගේ කාලවකවානුවයි. පිරිහී විනාශ වී තිබූ විහාරස්ථානයට නව පණක් එක්කරමින් විහාරාංග ඉදිකරමින් අද දැකුම්කළු දර්ශනීය විහාරස්ථානයක් බවට පත් කොට ඇත.

1962 මාර්තු 15 වන දින පැවිදි බිමට පත් වූ පාලටුවේ ජිනරතන හිමියන් 1963.11.08 වන දින කොළඹ ගංගාරාමස්ථ ශ්‍රී ඥානේශ්වර විද්‍යායතන පිරිවෙනට ඇතුළත්ව සිංහල පාලි සංස්කෘත ආදී පෙරදිග භාෂා මෙන් ම ඉංග්‍රීසි භාෂාව ද හදාරා 1982 වසරේදී අමෙරිකාවේ නිව්යෝර්ක් හි කොළඹ ගංගාරාම මහා විහාරාධිපති ආචාර්ය ගල්බොඩ ඤාණිස්සර නාහිමියන් ආරම්භ කළ බෞද්ධ විහාරස්ථානයට වැඩමවා එහි වැඩ වසමින් ආගමික සාමාජික කටයුතුවල වසර 15 ක් පමණ නියුතු වෙමින් තම උසස් අධ්‍යාපන කටයුතු ද සපුරා ගත්හ.

2002 වසරේදී ශ්‍රී ලංකාවට නැවත පැමිණි පාලටුවේ ජිනරතන නාහිමියෝ පරම්පරාවෙන් තමා වෙත උරුම වූ පාලටුවේ බෙත්තරාම පුරාණ විහාරස්ථානයේ පාලනය බාර ගෙන පරිහාණියට පත්ව තිබූ මෙම විහාරස්ථානය සංවර්ධනය කිරීමට පුරෝගාමී වූ හ. කොළඹ ගංගාරාම මහා විහාරාධිපති ආචාර්ය ගල්බොඩ ඤාණිස්සර නාහිමියන්ගේ ඉල්ලීම මත ගංගාරාම විහාරස්ථානයේ ආගමික කටයුතුවල නිරත වන අතර 2012 ජනවාරි 31 වන දින අබලන් ව පැවැති ධර්මශාලා ගොඩනැගිල්ල ඉදිකරවා විවෘත කළහ. සිවු දෙසින් වඩිනා මහා සංඝ රත්නයේ සුව විහරණය තකා නේවාසික භික්ෂූන්ට පහසුකම් ඇති නව සංඝාවාස ගොඩනැගිල්ල ඉදිකරවා විවෘත කරන ලදී.

විහාරස්ථානයක පැවතිය යුතු විහාරාංග වන චෛත්‍යය හා බෝධිය පිළිසකර කරවා සැදැහැවතුන්ට වන්දනාමාන කිරීමට පහසුකම් ද ඇති කළහ.

විහාර මන්දිරය ජීවමාන බුදුරජාණන් වහන්සේ වැඩ සිටින අයුරින් නිර්මාණය කෙරෙන ස්ථානයයි. බුදුරජාණන් වහන්සේ ද සැදැහැවත් කුලපුත්‍රයකු විසින් දැක පහන් සංවේගය උපදවා ගත යුතු ස්ථාන හතරක් දක්වා ඇත. ඒ අනුව බුද්ධ පරිනිර්වාණයෙන් ඉතිරි වූ ධාතු නිධන් කළ චෛත්‍ය ද බුද්ධත්වයට පත්වීමට උපකාරී වූ ජයශ්‍රී මහා බෝධිය ද අප විහාරස්ථානවල චෛත්‍ය බෝධිය දෙකින් නිර්මාණය කළහ. බුදු උපත සිදු වූ බරණැස ඉසිපතනාරාමය ද විශේෂිත ස්ථාන දෙකකි. ඒ ස්ථාන දෙක නිර්මාණය විහාර මන්දිරය තුළ සකසනු ඇත.

දඹදිව වන්දනාවට යා නොහැකි වුවත් තම ගමේ පන්සලේ දී මෙම ස්ථාන වන්දනාමාන කිරීමට ශ්‍රද්ධාව පුබුදුවා ලීමට ශ්‍රී ලංකාවේ මේ නිර්මාණයන් ශාරීරික උද්දේශික පාරිභෝගික යැයි ත්‍රිවිධ චෛත්‍ය නිර්මාණය වේ.

ජී. කේ. ජිනදාස මැතිතුමා සහ චන්ද්‍රා පියසිලි මැතිණියගේ දායකත්වයෙන් පරලොව සැපත් දයාබර ලතිල් ගල්බොඩ තරුණ පුතුට පින් අනුමෝදන් කිරීමේ දසවස් සපුරන අනුස්මරණයට සමගාමීව පෞරාණික විහාරය සම්පූර්ණයෙන් ප්‍රතිසංස්කරණය කොට බුදු සිරිතේ වැදගත් අවස්ථා හා ජාතක කතා චිත්‍රයට නංවා අලංකාරවත් ව සැදැහැ සිත් පුබුදුවාලන විහාර මන්දිරයේ වැඩකටයුතු විහාරාධිපති පාලටුවේ ජිනරතන නාහිමියන් විසින් කැපවීමෙන් හා අනුශාසකත්වයෙන් ඉදිකොට අවසන් වී ඇත. ඒ වෙනුවෙන් මෙම ඔක්තෝබර් 28 දින තිස් පැ තුනේ මහා පිරිත් දේශනයක් පවත්වාලීමට ද කටයුතු යොදා ඇත.


මහින්ද රාජපක්ෂ අගමැති තුමන් ප්‍රධාන මැති ඇමතිවරු ප්‍රධාන සම්භාවනීය ගිහි පිරිසකගේ සහභාගිත්වයෙන් ඔක්තෝබර් මස 30 වැනි දින සවස 3.00ට විවෘත කරනු ලැබේ. වාර්ෂික කඨින චීවර මහා පූජාව ද ඊට සමගාමීව සිදුවේ.

දකුණු සිරිලක මාතර පාලටුව බෙත්තාරාම මහ වෙහෙර දැකුම්කළු අංග සම්පූර්ණ විහාරයක් බවට පත් කරලීමට පුරෝගාමී වූ විහාරාධිපති ගෞරවාර්හ පාලටුවේ ජිනරතන ස්වාමීන් වහන්සේගේ මෙම ආගමික සාමාජික සංස්කෘතික හා සමජ සේවා උදාර මෙහෙවර අගයා ස්‍යාමෝපාලි මහා නිකායේ මල්වතු මහා විහාර පාර්ශවයෙන් දකුණු පළාතේ සම්භාවනීය නායක පදවියකින් ද සම්මානිත කොට ඇත.

රාජකීය පණ්ඩිත, ත්‍රිපිටකාචාර්ය ශාස්ත්‍රපති
**තන්තිරිමුල්ලේ සරණ මහා ස්ථවිර**



# උදාර චරිතයක හිමිකාරිනියක් වන්නට විශාඛා චරිතය කියවන්න



**බුද්ධකාලීන සමාජයේ වාසය කළ කුල කාන්තාවක වූ විශාඛාවගේ පරමාදර්ශී චරිත ලක්ෂණ වර්තමාන සමාජයට යහපත් මඟ පෙන්වීමක් ලබා ගත හැකි සිද්ධි රාශියකින් සමන්විත වේ. සත්හැවිරිදි වියෙහි දී විශාඛාව සෝවාන් තත්ත්වයට පැමිණි බව කියැවේ. "ඇගේ චරිතයට අනුකූල වන සේ බුදුරදුන් විසින් දෙසන ලද දහම් කතා අසා සෝතාපත්ති ඵලයෙහි පිහිට බව' ධම්මපදට්ඨ කතාවෙහි සඳහන් වේ.**

පසළොස් හැවිරිදි වන විට විශාඛාව කේශ කල්‍යාණය, මාංශ කල්‍යාණය, දන්ත කල්‍යාණය, ඡවි කල්‍යාණය සහ වය කල්‍යාණය යන අංග පහෙන් සම්පූර්ණ වූ පංච කල්‍යාණියක වූවා ය. ඇය රූපයෙන්, ධනයෙන්, ගුණයෙන් හා නැණයෙන් සමකාලීන කාන්තාවන් අභිබවා යමින් බුද්ධ ශාසනයෙහි කීර්තිමත් චරිතයක් ලෙස අද දක්වා ජීවමාන වීම සඳහා සුදුසු වූ පෙර පින් මහිමයෙන් සන්නද්ධ වූ බව ද විශාඛා වස්තුවෙන් හෙළි කෙරේ.

## තමා පිළිබඳ විශ්වාසය හා අභිමානය

පසළොස් හැවිරිදි වයසේ යෞවනික වූ විශාඛාව ඇගේ තාරුණ්‍යය මෙන් ම දෙමවුපියන් කෙරෙහි වූ කුල ගෞරවය ද සිහියේ තබාගෙන ක්‍රියා කිරීමට සමතියක් වූ වා ය. මීට අදාළ සිද්ධිය සංවාදමය ස්වරූපයක් ගනී. සිය යෙහෙළියන් සමඟ දිය නෑමට යන අතරමඟ දී පතිත වූ මහා වැස්සෙන් බේරීම සඳහා සිය යෙහෙළියන් සෙවණක් කරා දිව ගියත් විශාඛාව සුපුරුදු ගමනින් ම පියවර තබමින් එහි පැමිණියා ය.

අලසකම නිසාම ඈ සිය වස්ත්‍රාභරණ පිළිබඳ තැකීමක් නොකර ඒවා වැස්සෙන් තෙත් බරිත වීමට හැරියේ ඇයි දැයි අමුත්තන් විමසූ විට ඇගෙන් ලැබුණු පිළිතුරෙන් කරුණු දෙකක් විද්‍යාමාන වෙයි. එනම් යෞවනියකගේ හැදියාව හෙවත් චරිතවත් බව සහ බාහිර අලංකාරය හා එහි ඇගයුම පිළිබඳ වූ ඇගේ සුවිශේෂී තක්සේරුවයි. කාන්තාවක් සිය රූ සපුව පිළිබඳ සුපරික්ෂාකාරී විය යුතු ය. මන්ද එය ඇය සතු වටිනා දායදයක් බැවිනි. අපරික්ෂාකාරී ව දුව පැන යාමේ දී පා පැකිලී වැටීමෙන් ඇට අනතුරක් සිදුවිය හැකි ය. විකිණීමට ඇති භාණ්ඩයක් පළුදුවීමෙන් එය නොවටිනා භාණ්ඩයක් බවට හැල්ලුවේ. දිවීම නිසා සිදුවිය හැකි අනතුරක් වළක්වා ගැනීම සඳහා සුපුරුදු පා ගමනින් ම සෙවණ කරා පියමැන්න බව ඇගේ පහදා දීමයි.

මෙයට තවත් කරුණක් ද ඇය එක් කළා ය. එනම්, කාන්තාවකට හිමි සමජ ගෞරවය පළුදු කිරීමට ඇය නොකැමති වූ බවයි. දිවීමෙන් හෙවත් කායික අසංවරයෙන් සමාජයේ අවමානයට පත්වන්නන් අතර කාන්තාව ද එක් අයෙකි.

"මැය පිරිමියකු මෙන් හැසිරෙනවා ය හෙවත් දුව පැන නටනවා ය" යැයි සමාජය විසින් කාන්තාව ගර්හාවට ලක්කරනු ලැබීමෙන් වැළැකී සිටීමට ඈ උත්සාහගත් බවයි.

වර්තමාන යෞවනියට යෞවනත්වයේ අභිමානය පිළිබඳ මා හැඟි ආදර්ශයක් මෙම සිදුවීම ඇසුරින් ප්‍රකට කර පෙන්වයි. සමාජ සම්ප්‍රදායන් විසින් රැක දී ඇති කාන්තා ගරුත්වය නිසි අවබෝධයෙන් රැක ගැනීමට විශාඛාවගේ සෝවාන් නුවණ ඇය මෙහෙය වූ බව මේ අනුව සනාථ කළ හැකි ය.

## තැනට ඔබින ලෙස හැසිරීම

විවාහ ප්‍රාප්ත වීමට බලාපොරොත්තු වන තරුණ දියණියක මෙන් ම විවාහයෙන් පසු සිටු බිරිඳක වශයෙන් ද විශාඛාව සිය වගකීම් ඉටුකිරීමේ දී මනා සංවිධාන ශක්තියක් ඈ සතු බව ප්‍රකට කළා ය. විවාහ මංගල උත්සවය සංවිධානය කිරීමේ දී සමාව අයැදිය යුතු කිසිදු ප්‍රමාද දෝෂයක් සිදු නොවීමට ඈ වගබලා ගනී. විවාහ මංගල උත්සවය සඳහා රාජරාජ මහාමාත්‍යවරුන්ගේ සිට ඇත් - අස් රිය ධාවකයින් දක්වා සියලු දෙනා ම සහභාගි වූ අතර ඉතා පහළ මට්ටමේ සේවකයින් පවා සතුටු වන ලෙස කටයුතු සංවිධානය කිරීමේ ශික්ෂණය ඇය සතු විය.

> "පිඬුසිඟා වඩින භික්ෂු නමකට කිසිවක් නොදී නුදුටුවා සේ ආහාර බුදීමෙහි යෙදී සිටි සිය මාමණ්ඩිය "පුරාණයක් කනවා" යයි කරන ලද ප්‍රකාශය ඇසීමෙන් දැඩි සේ කෝපාවිෂ්ට විය."

"අපි විශාඛාවගේ මංගල උත්සවයට ගොස් කිසිවක් නොලැබීමු. ඇතුන් අසුන් බලා ගැනීමෙහි ම යෙදී සිටියෙමු'. වශයෙන් අවලාදයක් නැඟීමට ඇති ඉඩකඩ අහුරා දමා සියලු දෙනාගේ සතුටට හේතු වන ලෙස කටයුතු සංවිධානය කිරීම සඳහා වූ දක්ෂතාවය සහ සංයමය ඇගේ චරිතය තුළින් ප්‍රකට වේ.

විවාහයෙන් පසුව සිරිත් පරිදි නැදිමයිලනුවන්ගේ නිවසට පැමිණෙන විශාඛාව එම නගරයේ සියලු වැසියන් හා මිතුරු සබඳතාවන් ඇති කර ගැනීමට නිහතමානී වූවා ය. ඒ සඳහා ඇය විවාහ මංගල්‍යය වෙනුවෙන් ලැබුණු පුද පඬුරු නුවර වැසියන් සමඟ බෙදා හදා ගැනීමට සිතූ අතර එසේ තෑගි බෝග යැවීමේ දී ප්‍රියමනාප වචනවලින් ඇමතීමෙන් ඔවුන්ගේ සිත් දිනා ගැනීමට සමත් වූවා ය.

"මෙය මාගේ මෑණියන්ට ය, මෙය පියාණන්ට ය, මෙය සොහොයුරාට ය, මෙය නැගණියට ය, ආදී වශයෙන් නගරයේ සියලු දෙනා ඥාතීත්වයෙන් ඇමතීමෙන් ඇය සමානාත්මතා ගුණය වැනි උදාර චරිත ලක්ෂණ පිළිබිඹු කළා ය.

## උපායශීලි බව හා තැනට සුදුසු නුවණ

බෞද්ධ පරිසරයක හැදුණු වැඩුණු විශාඛාව විවාහප්‍රාප්ත වී පැමිණියේ නිගන්ඨ භක්තික පවුලක් වෙතටයි. මෙම සහවාසය උපායශීලී ව පවත්වා ගැනීමට පමණක් නොව, තීක්ෂණ බුද්ධිය මෙහෙයවා සිය මයිලණුවන් සහිත පවුලේ සාමාජිකයින් බුදුරජාණන් වහන්සේගේ ධර්මයට යොමු කරවා ගැනීමට ද ඇය සමතියක් වූවා ය. මේ පිළිබඳ පසුබිම් පුවත චමත්කාරජනක කතාවකි. පිඬුසිඟා වඩින භික්ෂු නමකට කිසිවක් නොදී නුදුටුවා සේ ආහාර බුදීමෙහි යෙදී සිටි සිය මාමණ්ඩිය "පුරාණයක් කනවා" යයි කරන ලද ප්‍රකාශය ඇසීමෙන් දැඩි සේ කෝපාවිෂ්ට විය. ඒ පිළිබඳව කරුණු විමසීමේ දී ඇගේ පැහැදිලි කිරීම වූයේ "මගේ මාමණ්ඩිය දැන් කිසිදු පිනක් නොකරයි. අතීතයේ කරන ලද පින් නිසා ලැබුණු සම්පත් පමණක් අනුභව කරමින් සිටී" යන්නයි. මෙම පැහැදිලි කිරීමෙන් කරුණු මනාව තේරුම් ගත් මයිලණුවන් ඇගේ පිරිපුන් බුද්ධි මහිමයට ගරු කිරීමක් වශයෙන් ඇය මවු තනතුරින් සම්මානනය කිරීමට පවා පෙළඹිණි. "මිගාරමතා" නමින් ප්‍රකට වූ ඇය මිගාර සිටුතුමා විසින් සිය ලේලියට දැක්විය හැකි උසස් තනතුරින් පුදනු ලැබීමට සමත් වූවා ය.

විශාඛාවගේ තීක්ෂණ බුද්ධිය මෙන් ම උපායශීලී බව ද සෝවාන් චරිතයක උතුම් ගුණාංග විදහාපෑමට ප්‍රමාණවත් බවට මෙය කදිම නිදසුනකි.

***මෙහි ඉතිරි කොටස වප් අව අටවක පෝදා 28 පත්‍රයේ පළවේ***

දර්ශන ශූරී බෞද්ධ අධ්‍යයන
**මල්ලිකා කරුණාරත්න**

# පිටිනුවරින් ආ අය අපේ ඥාතීන් බව අමතක කරන්න එපා



## කුක්කුර ජාතකය

**බඹදත් රජුගේ මුහුණෙහි වූයේ බෙහෙවින් විඩාපත් පෙනුමකි. කුමරියක විජිනි පතකින් පවන් සැලුව ද ඩා දියෙන් පෙඟී තිබුණු ඔහුගේ සිරුරට දැනුණු ග්‍රීෂ්මය අඩු නොවී ය. උදෑසන සිට උයන් කෙළියේ යෙදුණු රජුට ඉර අවරට යනු නොපෙනිණ. අහසේ වලාකුළු මුදුන් වනු පෙනිණ.**

සුදු අශ්වයන් සිව් දෙනකු විසින් ඇදැගෙන ආ අලංකාර රිය මාළිගා අංගනයෙහි නතර කැරිණ.

"අද වහීවි." රියෙන් බසින රජුට සිතිණ.

"ඒ නිසා තමයි මේ තරමට රස්නෙ."

රජ බිසව ද කුමරියෝ ද රාජ පුරුෂයෝ ද විඩාපත් ව සිටිය හ. ඔවුහු ද රජු සමඟ මාළිගයට පිවිසුණ හ.

අශ්වයන් මුදා ලූ රථාචාර්ය තෙමේ රාජකීය රථය මාළිගා අංගනයෙහි ම තිබෙන්නට හැරියේ ය.

හැන්දෑවේ වැහිකළු මුදුන් වැ නුවර අඳුරු විය. වැහි කළු යටින් හිරු බැස්සේ සොරකු මෙනි.

මහ සුළඟක් ද හැමුවේ ය.

රජුට දැනුණ ග්‍රීෂ්මය දුරුවිය. වැසි ඇද වැටෙන්නට විය.

මාළිගා වහලේ පීලිවලින් මහ දිය කඳක් ගැලුවේ ය. කාණු ඉතිරී ගියේ මාළිගා අංගනය දදියෙන් වැසිණ.

වැසි සීතල මාළිගයේ රජු ඇතුළු බොහෝ දෙනකු නින්දට ළං කෙළේ ය. විඩාපත් සිරුරු වහා නින්දෙහි ගිලිණ.

මැදියම් රැයවන විට වැසි නතර වූව ද පිබිද සිටි මිනිසෙක් නම් නොවී ය. රජ වාසල මුරකරුවන් අතින් අසිපත් බිම වැටිණ. වහා ඒවා අතට ගෙන දෑස පිරිමැද පිබිද සිටීමට සිතුව ද කුළුණුවලට බරදී සිටි ඔවුහු යළි නින්දට පැරැදුණහ.

පසුදා උදෑසන රන් රිවි කිරණ බරණැස් නුවර මහ මැදුරුවල දුහුවිලි නැති අලුත් කොත් කැරලි සිප ගති.

පිබිදුණු නගර වැසියනට ඉවසුම් නොදෙන දුගඳක් දැනිණ. නැහැ පුඩු හකුළුවා ගනිමින් "මේ කුමක් ද" යි ඔවුහු විමසූ හ.

දුගඳ විහිදුණේ මාළිගා අංගනයෙනි.

හිරු මඳක් ඉහළට නැගී අංගනයේ අඳුර පළවා හැර දුගඳ ආ තැන පෙන්වූයේ ය. රාජ පුරුෂයනට ඇස් ඇදහිය නොහැකි විය.

රාජකීය රථයේ අසුන්වල වූ සම් සහ සම්පටි ඉරී කොට්ටවල පුළුන් ඉවතට වැටී තිබිණ. දුගඳ නැගුණේ තෙමුණු සම් කැබැලිවලිනි.

"මේ අපරාධය කළෝ කවුරු ද?"

"රාජ උදහසින් අපට මිදුමක් නම් නැහැ..." මුරකරුවෝ සිතූහ.

සුවඳ දුමින් පිරුණු, සුවඳදිය විසුරුණු විසිතුරු කුටියෙක සැතැපී සිටි රජුට මේ දුගඳ නොදැනිණ. පිබිදුණු පසු ඔහුට ළං වූ කුමරියක් රියට වූ විපත හෙළි කළා ය.

ප්‍රධාන ආරක්ෂක නිලධාරියා රජු ඉදිරියේ පෙනී සිටියේ ය.

"රජ තුමනි, රාජකීය රථයේ ආසන සුනඛයන් විසින් වනසලා"

"සුනඛයන් විසින්?"

"එහෙමයි, ඊයේ රෑ වැස්සට රථයේ ආසනවල හම් සහ හම්පටි තෙමිලා – පෙඟිලා – දුගඳ හමන විට බල්ලන් පැමිණ ඒවා කාලා"

රජු රිය නැරැඹුවේ ය. ඔහුගේ නැහැය ද හැකිළිණ. තෙත පුළුන් කුට්ටි සහ ඉරුණු සම් කැබැලි ඔහුට පෙනිණ.

"උදේ දැකිය යුතු දෙයක් නොවෙයි නුඹලා මට පෙන්නුවේ" රජුගේ දත් සැපෙන හඬ ඇසිණ.

රාජ පුරුෂයෝ වෙවුලන්නට වූහ.

"වහාම මේ රථය වඩුවන්ට දෙනු. පිටිනුවර එක සුනඛයකුවත් ජීවත් ව සිටිනු මා දුටුවහොත් නුඹලාට ද ජීවත් වීමට ඉඩ නොලැබෙන බව දැන ගනිව්! වහාම වහාම පිටිනුවර යව්! ඒ රාජ ද්‍රෝහීන් සමූල ඝාතනය කරව්!"

රජ අණ නිකුත්විණි,

"ඒ අණ නිවැරැදියි" රජු පසුපසින් ආ පුරෝහිතයා ද කීය.

“
පිබිදුණු නගර වැසියනට ඉවසුම් නොදෙන දුගඳක් දැනිණ. නැහැ පුඩු හකුළුවා ගනිමින් "මේ කුමක් ද" යි ඔවුහු විමසූ හ. දුගඳ විහිදුණේ මාළිගා අංගනයෙනි. හිරු මඳක් ඉහළට නැගී අංගනයේ අඳුර පළවා හැර දුගඳ ආ තැන පෙන්වූයේ ය. රාජ පුරුෂයනට ඇස් ඇදහිය නොහැකි විය.
”

රාජ පුරුෂයෝ දුනු, හී ද ගල් මුගුරු ද ගෙන පිටිනුවරට දිවූ හ.

මේ රජ අණ නොදත් සුනඛයෙක් බියෙන් සැකයෙන් තොරව වීදිය දිගේ ගමන් කෙළේ ය.

ඈත දිව එන රාජ පුරුෂයන් පෙනුණ ද ඌ ඔවුන් පිළිබඳ නොසිතී ය.

"අන්න රාජ ද්‍රෝහියෙක්" රාජ පුරුෂයෙක් කෑ ගැසී ය.

සුනඛ හිස මතට මහ මුගුරක් වැටිණ. හීන් කෙඳිරියක් නගමින් ඌ තවත් අඩි හත අටක් දුරට ගියේ ය. පා පැකිළ වැටුණේ ය. යළි හිස එසවුණේ නැත.

"ඔන්න එක රාජ ද්‍රෝහියෙක් ඉවරයි".

මුගුරු පහර දුන් පුරුෂයා සතුටින් කෑ ගැසී ය. යමක් කටින් ඩැහැගත් බලු පැටියෙක් පටු වීදියක් දිගේ දිව ගියේ ය.

"අන්න අන්න රාජකීය රථයේ සම් කැබැල්ලක් ගෙන යනවා – පුංචි රාජ ද්‍රෝහියෙක්"

රාජ පුරුෂයෙක් ඇඟිල්ල දික් කෙළේ ය. හී සරයක් පුංචි සුනඛ හිස සිදුරු කෙළේ ය. නැගුණේ මඳ කෙඳිරියක් පමණි. බලු පැංචා ඇද වැටී දෑස පියවිණි.

'බඩුත් එක්ක හොරු ඇහුවුණා."

දුන්න ගත් පුරුෂයා බලු පැටියාට ළං විය.

ඒ කුඩා මළ සිරුරු මුවෙහි වූයේ මස් කැල්ලකි.

පැටියා සොයා ආ මව ඔහු නො දුටුව ද මුගුරු පහරකින් පරලොව දුටුවා ය.

පිටිනුවර මිනිස්සු කැළඹුණහ. තැන තැන වැටුණු සුනඛ මළ සිරුරු පෙනිණ.

"මොකක් ද මේ සුනඛ සංහාරේ?" ඔවුහු ඇසූ හ.

"රජ අණ – රජ අණ. ප්‍රශ්න කරන්න එපා". රාජ පුරුෂයෝ ගුගුළ හ.

"සුනඛයෝ රජතුමාගේ රථය වනසලා – උන් රාජ උදහසට ලක්වෙලා".

මිනිස්සු යළි ප්‍රශ්න නො කළ හ. කරබාගෙන සිය කටයුතුවල යෙදුණ හ.

"අපට මොක ද ඕක සුනඛයන් ගේ ප්‍රශ්නයක් නේ" ඔවුහු සිතූ හ.

එහෙත් සුනඛයෝ භීතියෙන් ඇවිස්සුණහ.

"මොකක් ද මේ අපේ වර්ගයාට සිදුවන්නේ?

දුටු දුටු තැන අප මරන්නට රජතුමා නියෝග කරලා"

සුනඛයෙක් තවත් සුනඛයකුට කීය.

"මහ සොහොනේ සිටින අපගේ නායකතුමා හමුවෙමු. මේ විපත ගැන කියමු."

අනෙක් සුනඛයා යෝජනා කෙළේ ය.

පිටිනුවර මහ සොහොනේ බිම සුනඛයන් දහසක් වෙසෙන තැනකි. ඔවුන් විසින් තෝරා ගැනුණු නායකයෙක් එහි විය.

ඒ නායක තෙමේ තැන්පත් ය. කාරුණික ය. සිය පිරිසේ කිසිවකුට ගැටුමකට, කලහයකට, ඉඩ නො ලැබෙන පරිදි දැහැමෙන් සෙමෙන් පාලනයෙහි යෙදෙන්නේ ය.

පිටිනුවර සුනඛයන් දෙදෙනා හෙළි කළ පුවත නිසා සොහොනේ සුනඛයෝ ද කැළඹුණ හ.

"පිටිනුවර සුනඛ මළ සිරුරු සිය ගණනක් මා දුටුවා. රාජ පුරුෂයන් දුනු හී තල ගෙන, කඩු මුගුරු ගෙන අප ලුහු බඳිනවා. එහෙත් මෙහෙත් පැන අපි ඔබ තුමා හමුවීමට ආවා."

සුනඛයෝ නායකතුමාට කී හ.

17 පිටුවට ...

ඒ මොහොතේ ම තවත් සුනඛයෝ කීප දෙනෙක් සොහොනට ආ හ.

"පස්සෙන් ඊතල එනවා. ගල්, මුගුරු වැටෙනවා. අපේ වර්ගයා විනාශයි."

හති හලමින් එක සුනඛයෙක් කී ය.

"රාජ පුරුෂයෝ මේ ළඟට ම ආවා. කැළේ පාරවල් සොයාගන්න බැරිව යන්න ඇති. ඒත් මට බයයි. උන් කොහොම හරි මෙහාටත් ඒවි"

පිටිනුවරින් ආ සුනඛ මහල්ලෙක් කී ය.

සොහොන් වැසියනට තැති ගැන්මක් ඇතිවිය.

"ආරක්ෂාව පතා නුඹලා අප සිටින තැනට එනවා. රාජ පුරුෂයන් එය දැනගත්විට අපටත් මෙහි වසන්නට ලැබෙන්නේ නැහැ."

සුනඛ නායක තෙමේ ඔවුන් නිහඬ කෙළේ ය.

"ආරක්ෂාව සඳහා පැමිණි සියලු දෙනා ම අපි සාදරයෙන් පිළිගන්න ඕන - ඔවුනට අනාථයන් වන්නට ඉඩ දෙන්නට එපා - ඔවුන් අපේ ම අය. මේ භීෂණය දුරුවන තුරු ඔවුන්ට අප සමඟ ජීවත් වන්නට ඉඩ දෙමු. ඒ අතර අපි විසඳුමක් සොයා ගන්න ඕනෑ."

"රජතුමා අපේ වර්ගයාට සතුරු වූයේ ඇයි?" නායකයා පිටිනුවරින් ආ අයකුගෙන් ඇසී ය.

"දවසක් රජතුමාගේ තිල රථය මාළිගාවේ අංගනයේ තිබිලා වැස්සට තෙමිලා. රථයේ ආසනවල තෙමුණ හම් සුනඛයන් කැවලූ. රජතුමා කෝපවෙලා නියෝග කළා ලූ සුනඛ සංහාරය පටන් ගන්න."

"නුවර දෙරවල් වැහුවට පස්සෙ පිටිනුවර කෙනකුට ඇතුළට යන්න පුළුවන් ද?"

"පුළුවන්කමක් නැහැ නායකතුමනි, මා දිනක් රාත්‍රියක ඇතුළු නුවරට යාමට තාප්පය වටේට ම

ඇවිද්දා - හැමතැන ම මුරකාවල් - මීයකුට රිංගන්න පුළුවන් තරමේ සිදුරක්වත් නැහැ. මීයෙක් නම් තාප්පෙට උඩින් පනීවි - සුනඛයන්ට ඒ හපන්කම් බැහැ.""ඇතුළු නුවරත් සුනඛයන් ඉන්නවා නේද?"

"එහෙමයි -රජතුමා සමඟ දඩයමේ යන සුනඛයන් ඉන්නවා."

"ඒ කියන්නෙ කීන බල්ලො?"

"එහෙමයි - එක දවසක දවාලක මා ඇතුළු නුවරට ගියා - මාළිගාවේ සඳලුතලවල කීණ බල්ලන් සිටිනවා මා දැක්කා."

නායකයා හිස සලමින් යමක් සිතුවේ ය.

ඔහු සිය සගයන් රැස් කෙළේ ය.

"පිටිනුවරින් ආ අය අපේ ම වර්ගයේ අය බව, අපේ ඥතීන් බව අමතක කරන්න එපා - ඔවුන්ට කළ හැකි සියලු සත්කාර කරන්න - තවත් ටික දවසකින් ඔවුන්ට ආපසු පිටිනුවරට යන්නට ලැබේවි."

සගයෝ නායකයා ගේ බස පිළිගත් හ. එහෙත් ඔවුන්ගේ සිත බියෙන් පිරී තිබිණ. රජුගේ හී සර වන ලැහැබට ඉහළින් හා පහළින් යම් මොහොතක සොහොනට පැමිණිය හැකියි ඔවුනට සිතිණ.

නායක තෙමේ සොහොන් බිම මැද වූ ගල් තලාවේ වැතිර සිතන්නට විය.

"මේ රාජ නීතිය හරිම අසාධාරණයි. අයුක්ති සහගතයි. දඬුවම් නිවැරදිකරුවන්ටයි. වැරදිකරුවන්ට සැලකිලි. රාජකීය රථයට සිදු වූ දේ සොහොනේ සිටින මට පෙනෙනවා. - එහෙත් එය මාළිගාවේ සිටින රජුට පෙනෙන්නේ නැහැ. ඔක්කොම වැරදිවලට දඬුවම් ලැබෙන්නේ ලොක්කන් සමඟ සමීප බව නැති පිටිනුවර සිටින අහිංසකයින්ටයි. පහත් තැනින් යයි ගලා ජලේ කීවා නේ.

මා රජතුමාට හමු වී ඇත්ත පහදා දෙනවා."

ඔහු ගල්තලාවෙන් බැස සගයකුට සිය සිත හෙළි කෙළේ ය.

"නායකතුමනි, සොහොන් බිමෙන් පිටතට යාම ගැන නම් සිතන්නට එපා. රාජ පුරුෂයන් වියරු වැටිලා. උන් පිටිනුවර සුනඛයන් සොයනවා. පිටතට



ගියොත් ආපසු එන්න ලැබෙන්නේ නැහැ. ඔබතුමා ගේ ගුණ යහපත්කම් උන්ගේ ඊතල - මුගුරුවලට පේන්නේ නැහැ."

සගයා කීය.

"මා හිතනවා ඔය ගමනේ දී මට කිසිදු උපද්‍රවයක් වෙන්නේ නැහැ - මා යන්නේ යහපත් අරමුණක් ඇතිව - සියලු අහිංසකයන් ගේ ජීවිත රැක ගැනීමේ පරමාර්ථයෙන්."

නායකයා ඇතුළු නුවරට යන පුවත සොහොන් බිමේ පැතිරිණ.

"නායකතුමනි, ඔබතුමාට පිටිනුවර වීදියක අඩියක් දෙකක්වත් යන්නට ලැබෙන්නේ නැහැ."

බලු මහල්ලෙක් කීය.

බොහෝ දෙනකු ගේ ඇස්වලට කඳුළු නැගිණ.

"මිත්‍රවරුනි, මගේ අරමුණේ පිවිතුරු බව, උතුම් බව, සැබෑ නම් මට අනතුරක් නොවී, ඒ අරමුණ ඉටු කරගෙන එන්නට ලැබෙනවා - මා එනතුරු සන්සුන් ව, සාමකාමීව ඉන්න"

නායකයා ගමන අරඹමින් කී ය.

සොහොනේ දෙර තෙක් සිය නායකයා කැටුව පිරිස ගමන් කළ හ.

"ඔබ තුමා ගේ ගමන සරුවේවා!

"මා හිතනවා ඔය ගමනේ දී මට කිසිදු උපද්‍රවයක් වෙන්නේ නැහැ - මා යන්නේ යහපත් අරමුණක් ඇතිව - සියලු අහිංසකයන් ගේ ජීවිත රැක ගැනීමේ පරමාර්ථයෙන්." නායකයා ඇතුළු නුවරට යන පුවත සොහොන් බිමේ පැතිරිණ.

නිවැරැදි අපට සාධාරණය ඉටුවේවා!" ඔවුහු පැතූ හ.

සුනඛ නායක තෙමේ පිටිනුවර වීදි ඔස්සේ නුවර මහ දෙරටුව දක්වා ගියේ අවට වූ සිය වර්ගයා ගේ මළ සිරුරු කීපයක් ද දුටුවේ ය. දුනු, හී, අසිපත්, ගත් අත් ඇති රාජ පුරුෂයනට මේ නායකතුමා ගමන් කරනු නොපෙනිණ.

මහ දෙරටුවේ රැකවල්ලූ ද කරබාගෙන සිටිය හ. ඔහු මාළිගා අංගනය මැදින් ගියේ සුවිසල් මැදුරෙක සඳලුතලෙහි කීණ බල්ලන් සිටිනු ද දුටුවේ ය.

"සැප සේ වැඩුණු අපගේ වර්ගයේ ම අය. එහෙත් ඔවුන් සිටින්නේ රජු වෙනුවෙන් අහිංසකයන් දඩයම් කිරීමට යි. ඒ සඳහා ඔවුන්ට රජු ගෙන් රජ සැප!"

මෙසේ සිතමින් ගිය ඔහු රාජ මාළිගාවට ද ඇතුළු විය.

ඉදිරිපස දිගු ශාලාවකි. එහා විසිතුරු භාණ්ඩ තැන්පත් කැර තිබිණ. පහළ බිතු කොටස කැටපත් පුවරුවලින් සරසා තිබිණ. බලු නායක තෙමේ සිය පිළිබිඹුව දැක මඳක් විමසිලිමත් වූයේ ය. මුහුණේ වූයේ විඩාව මිස බියක සැකයක ලකුණු නොවේ. ඒ ශාලාව කෙළවර විසල් දෙරටුවකි. එහි ඇතුළට ගියවිට පෙනුණේ රාජ සභාව ය.

සිංහාසනාරූඪව සිටි රජු ඇමතිවරයකු ගේ බසට කන්දෙනු සුනඛ නායකයාට පෙනිණ. පුරෝහිත බමුණා ද, ඇමතිවරු කීප දෙනෙක් ද, සෙන්පතිවරු ද, දිලෙන අසිපත් ඉහළට නගා ගත් අත් ඇති රාජපුරුෂයෝ ද එහි වූහ. ඔවුන් ගේ ඇස්වලට ගොදුරු නොවූ සුනඛ පතියාණෝ නරපතියාණන්ගේ සිහසුන මැද මඳ විවේකයක් ගන්නට සිතී ය.

එක් රාජපුරුෂයකු ගේ ඇසට සිහසුන යටට රිංගාගත් බලුපතියා පෙනිණ. ඔහු මුගුරු ගෙන බලුපතියා පිටතට ගැනීමට සැරසුණේ ය.

"ඌ පිටතට ගන්න එපා" රජු කී ය.

බලුපතියා නරපති අසුන යට වැතිර ඇමති දෙසුමට සවන් දී සිටියේ ය.

"මහරජතුමනි, පිටිනුවර වැසියන් කැරලි නොගසන එක ගැන මට පුදුමයි. ඔවුන් විරුද්ධ වන්නේ සුනඛ සංහාරයට නෙවේ. තැන තැන දමා ඇති සුනඛ මළ සිරුරුවල දුර්ගන්ධයටයි. රාජ පුරුෂ යනට අණ ලැබී ඇත්තේ උන් මරා දැමීමට පමණයි. මළ සිරුරු වළ දැමීමට නියෝගයක් නැහැ. පිටිනුවර මහා පරිසර දූෂණයක් සිදුවෙනවා. - වසංගත රෝග බිය ද ළඟ ළඟම එනවා.

දැන් පිටිනුවර පණ ඇති එක සුනඛයෙක්වත් නැහැ. උන් මහ සොහොනට ගොස් සැඟවුණු බව මට මේ දැන් සැළවුණා."

වැතිර සිටි සුනඛපතියා ගේ හිස එසවිණ. සවන් පත් දික් විය.

"මේ නිසා රජතුමනි, රාජ පුරුෂයන් වහා සොහොන් බිමට ද යැවිය යුතුයි. නැතිනම් අපගේ සම් ද උන් කා දමනු ඇති"

රජු එක් ඇමතියකු දෙස බැලී ය.

"සියලු සුනඛ මළ සිරුරු සොහොනට ගෙන ගොස් ගිනි තැබීමටත්, සොහොනේ සිටින සුනඛයන් ද ඒ ගිනි ගොඩට ම දමා මැරීමටත් නියෝග කරමි."

රාජ සභාවේ කටයුතු අවසන් විය.

නරපති සිහසුනෙන් බසින්නට සැරසුණි.

සුනඛපති සිහසුන යටින් පිටතට පැමිණ රජුට නමස්කාර කෙළේ ය.

"මහරජතුමනි" ඔහු රජු ගේ දෑස තමා දෙසට ඇද ගත්තේ ය.

"ඇයි? මොකද? "රජු නො මනාපයෙන් මෙන් ඇසී ය.

"ඔබ තුමා සමඟ සාකච්ඡා කිරීමට මට කාරණයක් තියෙනවා."

රජු යළි සිහසුනේ හිඳගති.

සිය නිවෙස් කරා යාමට සැරසුණු පුරෝහිත බමුණා ද, ඇමතිවරු ද, සෙන්පතිවරු ද, යළි සිය අසුන්වලට බර දුන්හ.

"මොකක් ද කාරණය?" රජු ඇසී ය.

"අපේ වර්ගයා ඝාතනය කිරීමට ඔබතුමා නියෝග කරලා තියෙනවා. ඒක සාධාරණ නියෝගයක් නොවෙයි."

"ඔය නියෝගය සෑම සුනඛයකුට ම වලංගු ද?"

"නැහැ මාළිගාවේ සිටින අපේ කීණ බල්ලන්ට ඔය නීතිය වලංගු නැහැ."

"ඔබතුමා දඬුවම් දෙන්නේ තමන් ගේ අය බේරලා. පිටිනුවර අයට පමණයි ඔය නීතිය වලංගු. ඉතින් මා ඒකනේ කීවේ ඔය නීතිය අසාධාරණයි කියල.

**මෙහි ඉතිරි කොටස වප් අව අටවක පෝදා 28 පත්‍රයේ පළවේ**

**දෙනගම සිරිවර්ධන**

# සැදැහැ සිතින් නමදිමි සිරිමහ බෝධී

පදීපදානං පාදාසිං - පරිවාරෙත්වාන බෝධියං
සද්දහන්තෝ පදීපානි - අකරිං තාවදේ අහං
යං යං සෝ නූපපජ්ජාමි - දේවදත්තං අථ මානුසං
ආකාසේ උක්කං ධාරෙන්ති - දීපදාදස්සිදං ඵලං
තිරොකුඩ්ඩං තිරෝ සේලං - සමතිග්ගය්හ පබ්බතං
සමන්තා යෝජන සතං - දස්සනං අනුභෝමහං

***මම බෝධීන් වහන්සේ වටා ප්‍රදීප දානයක් දුන්නෙමි. ඒ මොහොතේ මම ධර්මය ගැන විශ්වාසය ඇතිව පහන් දැල්වූයෙමි.***

***එතැන් පටන් මම දෙව්ලොව හෝ මිනිස් ලොව යම් තැනක ඉපදුණේ ද මට අහසෙහි ගිනිසිලු දරයි. මේ ප්‍රදීප දානයේ අනුසස් ය.***

***බිත්තිවලින් එහා, කඳුවලින් එහා, පර්වතයන් ඉක්මවා හාත්පස යොදුන් සියයක් දුර දකිමි.***

***අප ගෞතම සම්බුදු සසුනෙහි පැවිදි ව රහත් වූ පඤ්ච දීපක නම් රහතන් වහන්සේ නමක් වැඩ සිටියා. අපදාන පාලියෙහි එන උන්වහන්සේගේ පූර්ව චරිතාවර්ජනය සම්බන්ධ ගාථා කීපයක් සහ එහි අර්ථයයි ඉහතින් දක්වනු ලැබුවේ.***

**‘බෝධීන් වහන්සේ’ බෞද්ධ සිව්වනක් පිරිසගේ ම හදවත තුළ කිඳාබැස ඇති නාමයක්. ඒ නාමය සිහිපත්වන සෑම විටෙක ම අපමණ බුද්ධාලම්භන ප්‍රීතියක්, ශ්‍රද්ධාවක්, භක්තියක් අපගේ හදවතෙන් පැන නඟිනවා. බෝධීන් වහන්සේ අපට මෙතරම් සමීප වූයේ ඇයි?**

බෝධීන් වහන්සේ පූජනීය වෘක්ෂයක් ලෙස සලකන ලද්දේ ප්‍රාග් ඓතිහාසික යුගවල පටන් ම යි.

බෝධි යන වචනයේ අර්ථය නිවැරැදි වූ ද, පැහැදිලි වූ ද, සම්පූර්ණ වූ ද දැනීම යන්නයි. එසේත් නැතිනම් අවබෝධය යි. දැකීම යි. මෙහි දැනීම, අවබෝධය, දැකීම යනුවෙන් අදහස් වන්නේ ඥාන දර්ශනය යි. ඒ අනුව බෝධි යන වචනයෙන් අදහස් කරන්නේ ලෝකෝත්තර මාර්ග ඥානය හා සර්වඥතා ඤාණයයි.

ලොව්තුරා බුදු බව පතන උත්තම බෝධිසත්වයන් වහන්සේට, සම්මා සම්බුද්ධත්වයට පත්වීම සඳහා විශේෂ ස්ථානයක් මේ මිහිමඬල තුළ පවතිනවා. ඒ, දඹදිව මධ්‍ය දේශයේ පිහිටි බෝධි මණ්ඩලය යි. සියලුම බෝධිසත්වයන් වහන්සේ බුදුබව ලබන්නේ යම් කිසි වෘක්ෂ යක් මුල දී යි. සිද්ධාර්ථ බෝධිසත්වයන් මවු කුසින් බිහි වූ දිනයේ ම ඉහත කී ජය භූමියෙහි ඇසටු ගසක් පැන නැඟුණා. ඒ ඇසටු ගස පැන නැඟුණේ උන්වහන්සේට ලොව්තුරා බුදු වීම සඳහා ආධාර වීම පිණිසයි.

සම්බුදුරජාණන් වහන්සේගේ පරිනිර්වාණයෙන් අවුරුදු දෙසිය තිස් හතක් ගෙවී ගියා. එකල්හි ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේගේ දක්ෂිණ ශාඛාව රැගත් සංඝමිත්තා මෙහෙණින් වහන්සේ ප්‍රධාන පිරිස ශ්‍රී ලංකාවට සැපත් වූවා. ලංකා ධරණී තලයෙහි පිහිටි බෝධීන් වහන්සේ සතියක් නොපෙනී තිබුණා. සත්වන දිනයේ බෝධීන් වහන්සේ දෘශ්‍යමාන වූවා. ඒ මොහොතේ දෙවන පෑතිස් රජතුමා ප්‍රධාන පිරිස විසින් මහත් ශ්‍රද්ධාවෙන් නමස්කාර පූර්වක ව හිස් මුදුනින් බෝධීන් වහන්සේ පිළිගනු ලැබුවා. බෝධීන් වහන්සේගේ මහා අතු පසෙහි වූ ඵල පසින් ඵලයකින් පැළ අටක් බැගින් පැන නැඟුණා. ඒ බෝධි අංකුරයන් ශ්‍රී ලංකා ද්වීපයේ ස්ථාන හතළිහක රෝපණය කරවූවා. මෙම බෝධි රෝපණය ශ්‍රී ලාංකීය ඉතිහාසයේ චින්තන විප්ලවයකට මඟ පාදා දුන්නා. එම චින්තන විප්ලවයෙන් බෝධි සංස්කෘතිය ඇරඹුණා. ඒ කියන්නේ බෞද්ධ සංස්කෘතිය. ඒ කාලයේ ලංකාව පුරා විවිධ ඇදහිලි ක්‍රම ව්‍යාප්ත වී තිබුණා. ඒ ඇදහිලි ක්‍රම යටපත් වූයේ බෝධි සංස්කෘතියත් සමඟයි. බොදු ජනතාව බෝ සෙවණෙහි පහස විඳිමින් තෙරුවන් ගුණ සිහි කරන්නට වූවා.

බෝධි වන්දනාවට හුරු පුරුදු වූ ශ්‍රී ලාංකික ජනතාව බෝධීන් වහන්සේගේ සෙවණ යට අප්‍රමාණ සැනසීමක් ලැබුවා. බුදුරජාණන් වහන්සේ සය අවුරුද්දක් අත්ථකිලමතානු යෝගයෙහි යෙදෙමින් දුෂ්කර ක්‍රියා කළ අයුරු සිහිපත් කරමින් තම ජීවිතවල ඇති දුෂ්කරතාවයන් එපමණ නැතැයි සිහිපත් කරමිනුයි ඔවුන් දුක් කරදර හමුවේ සිතට ශක්තිය ලබා ගත්තේ. තමන්ගේ දුක් කරදර බෝ සමිඳුන් ඉදිරියෙහි කියමිනුයි ඔවුන් සිතේ බර නිදහස් කර ගත්තේ. තෙරුවන් ගුණ සිහිපත් කරමින් ජීවිතයට ආශිර්වාද පැතූ ජනතාව ලෙඩ දුක්, අපල උපද්‍රවයන්හි දී ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේගෙන් තරම් පිහිටක් වෙන කිසිදු තැනකදී නොලැබෙන බව කල්පනා කළා. ප්‍රදීපයෙන්, සුවඳ දුමින්, ගිලන් පසින්, සුවඳ පැනින්, කිරි අහරින්, සුවඳ මලින්, බෝධීන් වහන්සේට පුද පූජා කළා. වර්තමානයේ ද එසේමයි. එ පමණක් නොවෙයි. අපේ පැරැන්නෝ බෝධීන් වහන්සේ ආරක්ෂා කළේ තම දිවිහිමියෙනුයි. අනතුරුවලදී සහ ස්වභාවික ආපදාවන්වලදී බෝධීන් වහන්සේ සුරැකීම ඔවුන් තම පරම යුතුකමක් සේ සැලකුවා.

බෝධි වෘක්ෂයන්හි සම්බුදුවරයන් වහන්සේට අවබෝධය ලැබීමට උපකාර වන ශක්තියක්, අනුහසක්පවතිනවා. මහ බෝසත්වරු බුද්ධත්වය ලැබීම සඳහා බෝධි මූලයන්ට එළඹෙන්නේ ඒ නිසාමයි. ලොව්තුරා බුදුරජාණන් වහන්සේ බුදු වූ විගස ආසනයෙන් නොනැගිට සතියක් ම බෝධියට පිට දී එතැන වැඩ සිටියා. තථාගතයන් වහන්සේ විසින් එසේ පරිභෝග කරනු ලැබීම නිසා ද බෝධීන් වහන්සේ පූජනීය වනවා. බුදුන් වහන්සේ විසින් ම අනිමිස ලෝචන පූජාවෙන් පිදුම් කරනු ලැබූ නිසා ද පූජනීය වනවා.

“බුදුවරුන් ඇති කල්හිත් නැති කල්හිත් බුදුවරුන් පරිභෝග කළ මහා බෝධිය චෛත්‍යය වන්නේ යැයි” දේශනා කළ, බුදුරජාණන් වහන්සේ තමන් වහන්සේ වෙනුවට සැදැහැවතුන්ට වන්දනාමාන කිරීම සඳහා ජේතවනාරාමයෙහි ආනන්ද බෝධිය රෝපණය කරවූවා.

මෙසේ පාරිශුද්ධ වූ බෝධීන් වහන්සේ උදෙසා කරනු ලබන සත්කාරයන්හි විපාකය අපමණයි.

නාගසේන තෙරුන් වහන්සේට මිළිඳු රජු පැරදවීමට සමත් මහා නුවණක් ලැබුණේ ඇමදීමේ කුසලයෙනුයි. විපස්සී නම් බුදුරදුන් කාලයේ බෝධීන් වහන්සේ දැක සිත පහදා ඇමදීම සහ සැදැහැ සිතින් කළ වන්දනාව නිසා සකිං සම්මජ්ජ නම් තෙරුන් වහන්සේ කල්ප අනූවකට පෙර කළ පින නිසා දුගතියකට නොවැටුණු බව සඳහන් වෙනවා. උප උපන් ජාතීන්හි සමෙහි රෝග නොවූ බව ද සඳහන් වනවා. අපදානපාලියෙහි මෙබඳු චරිත කථා බොහෝ තිබෙනවා. මුලින් ම දැක්වූයේ ද එබඳු කතාවක්.

බෝධි රෝපණය කළ අසන නම් රහතන් වහන්සේගේ අපදානයක් ද වෙයි. තිස්ස නම් බුදුරජාණන් වහන්සේගේ කාලයේ සත් හැවිරිදි වයස් ඇති ව සිටි උන්වහන්සේ සතුටු සිතින් බෝධියක් රෝපණය කළා. අසන නම් වූ එම බෝධීන් වහන්සේට වර්ෂ පහක් උපස්ථාන කළා. ඒ පිළිබඳ ඇසූ තිස්ස බුදුරජාණන් වහන්සේ දේශනා කොට වදාළේ මෙ තෙම කල්ප තිහක් දෙව්ලොව රාජ්‍යය කරන බවයි. හැට හතර වාරයක් සක්විති රජ වන බවයි. මිනිස් ලොව ඉපිද ගෞතම සම්බුදු රජාණන් වහන්සේගේ කාලයේ දී රහත් බව ලබන බවයි.

ඉහත කෙටියෙන් සඳහන් කරන ලද්දේ බෝධීන් වහන්සේට ශ්‍රද්ධාවෙන් පුද සත්කාර කොට කුසලානිසංස ලැබූ උතුමන් පිළිබඳව යි. සියලු වෘක්ෂයන්ට උසස් වෘක්ෂය වන බැවින් මහා බෝධි නම් වූ ලොව්තුරා සම්මා සම්බුදුරජාණන් වහන්සේ විසින්, සෝවාන් සකදාගාමී අනාගාමී අරිහත් උතුමන් විසින්, දිව්‍ය බ්‍රහ්ම ආදීන් විසින් රාජරාජ මහාමාත්‍ය ආදීන් වැඳුම් පිදුම් කරනු ලැබූ, වැඳුම් පිදුම් කරනු ලබන ජය ශ්‍රී මහා බෝධි රාජයාණන් වහන්සේ පින් කැමති සෑම දෙනෙකු විසින් ම මහත්, ශ්‍රද්ධාවෙන් පුද සත්කාර වන්දනාමාන කළ යුතු බව කල්පනා කළ යුතු වනවා.

නිවැරැදි ව බෝධි පූජාවන් සිදු කරන්නේ කෙසේ දැයි? විමසා බැලීම ද ඉතාම වැදගත්. වර්තමානයේ නොයෙක් දෙනා නොයෙක් අයුරින් බෝධි පූජා පින්කම් සිදු කරනු දකින්නට ලැබෙනවා. කොයි ආකාරයෙන් සිදු කළත් සිදුවන්නේ පූජා ක්‍රම දෙකකටයි. ඒ වස්තු පූජාව සහ ස්තුති පූජාව වශයෙනුයි. පූජාව ද දානමය කුසලයට අයත් පින්කමක්. ලබන තැනැත්තාගේ හෙවත් ප්‍රතිග්‍රාහකයාගේ ගුණ සලකාගෙන ගෞරවාදරයෙන් දීම පූජාව වශයෙන් සැලකෙනවා.



බෝධි පූජාවක දී මල්, පහන්, සුවඳ දුම්, ගිලන්පස, දැහැත්, බෙහෙත්, කිරි ආහාර, ආදී වශයෙන් වස්තු පූජාවන් සිදු කරන අතර, ගුණ කීම් ආදී වශයෙන් ස්තුති පූජාවන් සිදු කරනු ලබනවා. මෙසේ කරනු ලබන පූජාවක දී ඉතා ම වැදගත් වන්නේ බාහිර සහ අභ්‍යන්තර පිරිසිදු බවයි. පළ මුවෙන් ම අපි බාහිර පිරිසුදු බව ගැන සලකා බලමු. පූජාව සිදු කරන විට ශාරීරික වශයෙන් පිරිසිදු වී සිටිය යුතු යි. බාහිර පිරිසිදු බව ශරීරයට පමණක් සීමා වන්නේ නෑ. පූජාව සිදු කරන ස්ථානය ද පිරිසිදු විය යුතුයි. වර්තමානයේ බොහෝ බෞද්ධයන් සිදු කරන්නේ වටපිටාව අතුගා සුද්ධ පවිත්‍ර නොකොට තමන් ගෙනෙන දේවලින් වටපිටාව අපිරිසිදු කොට යෑමයි. එසේ නොකොට පුළුවන් ශක්ති ප්‍රමාණයෙන් පරිසරය පිරිසිදු කළ යුතු වෙනවා.

> **“ කරදර බාධක ජීවිතේට එනකොට අපි කියනවා ඒක අපල කාලයක් කියලා. අප විසින් කරන ලද අයහපත් ක්‍රියාවන්වල ප්‍රතිඵල ලැබෙන කොට අපේ ජීවිතවල සිද්ධ වෙන්නෙත් අයහපත් දේ. ඒවා සමහරවිට පෙර භවයන්වල කරපු පාප කර්මයන්ගේ විපාක හැටියටත් අපේ ජීවිතවලට බලපානවා. ”**

පහන් දල්වන කොට බෝධීන් වහන්සේට ඉතා ම ළඟින් පහන් දැල්වීම නොකළ යුතු යි. මොකද එය බෝධීන් වහන්සේට කරන හානියක්. ඒ වගේ ම අපි දල්වන පහන් සහ පහන් වැට පිරිසිදු කොට පහන් දල්වන්නේ නම් ඉතාම යහපත්. මල් පූජාව ගෞරව දැක්වීම සඳහා අතීතයේ සිට ම කරන උතුම් පූජාවක්. මල් නෙළීමේ සිට ම ඒ ගැන සැලකිලිමත් විය යුතුයි. ගසකින් මලක් නෙලා ගන්නා විට මල් ගසට හානියක් නොවෙන්නට එය කළ යුතු වනවා. ඒ වගේ ම නෙලා ගන්නා මල් ඉතාමත් අලංකාර ව ඇසට ප්‍රියමනාප වෙන අන්දමින් සකසා පූජා කළ යුතුයි. පූජා කරන ලද මල් අපවිත්‍ර වන ආකාරයට තැන් තැන්වල දැමීමත්, මල් ආසන වල ඒ අයුරින් ම පරවෙන්නට තැබීමත්, පරමල් උඩ ම අලුත් මල් තබා පිදීමත් නුසුදුසු යි. ඒ අයුරින් අනෙක් පූජා ද්‍රව්‍යයන් ද සකස් කර ගැනීමේ දී පිරිසුදු භාවයත්, ප්‍රියමනාප භාවයත් පිළිබඳ සැලකිලිමත් විය යුතු වනවා. සිදුකරන පූජාව කොතරම් විශාල වුවත්, කොතරම් කුඩා වුවත් ඉහත කී කාරණා පිළිබඳ සැලකිලිමත් වෙමින් කරන්නේ නම්, තමාගේ සිත ද සතුටු වෙනවා. දෙව් මිනිසුන් ද සතුටු වනවා.

මීළඟට අප විසින් සිදු කරන පූජාව නම් ස්තුති පූජාව හෙවත් ගුණ කීමයි. මෙහිදී විශේෂයෙන් සැලකිලිමත් විය යුතු කාරණාවන් කීපයක් තිබෙනවා. වර්තමාන කාලයේ බෝධි පූජා ගාථා, කවි අතර මල් පහන් පූජා කරන ගාථා කවි, තෙරුවන් වන්දනා කරන ගාථා සහ කවි, බෝධීන් වහන්සේගේ ගුණ ගායනා කරමින් වන්දනා කරන කවි සහ ගාථා, නොයෙක් ප්‍රාර්ථනාවන් සිදු කරමින් ගායනා කරනු ලබන කවි සහ ගාථා ආදිය බොහෝ පොත්පත් වල දැකිය හැකි වනවා. නොයෙක් දෙනා නොයෙක් අරමුණු ඇති ව බෝධි පූජා සිදු කරනවා.

එම අරමුණු අතර බොහෝ අරමුණු ලෞකික ප්‍රාර්ථනාවන්. බෝධි පූජාවන් තැබූ පසු ඒවා ඉෂ්ට වෙන බව අපි හැමදෙනා ගේ ම විශ්වාසය යි. එසේ ඉෂ්ට වන්නේ නම් ඒ කුමක් නිසා දැයි විමසා බැලිය යුතුයි.

කරදර බාධක ජීවිතේට එනකොට අපි කියනවා ඒක අපල කාලයක් කියලා. අප විසින් කරන ලද අයහපත් ක්‍රියාවන්වල ප්‍රතිඵල ලැබෙන කොට අපේ ජීවිතවල සිද්ධ වෙන්නෙත් අයහපත් දේ. ඒවා සමහරවිට පෙර භවයන්වල කරපු පාප කර්මයන්ගේ විපාක හැටියටත් අපේ ජීවිතවලට බලපානවා. එහෙම අවස්ථාවන්වල සිත පිරිසුදු කර ගෙන යහපත් පුණ්‍ය කර්මයන් කළා ම පාප ශක්තිය යටපත් වෙලා, පුණ්‍ය ශක්තීන් මතු වෙලා අපේ අරමුණු ප්‍රාර්ථනාවන් ඉෂ්ට සිද්ධ වෙනවා. එහෙම කල්පනා කරන කොට ඔබ විසින් සිදු කළ පුණ්‍ය කර්මය, තෙරුවන්ගේ ගුණ මෙනෙහි කිරීම, ගුණ ගායනා කිරීම පූජාවන් සිද්ධ කිරීම වැනි ක්‍රියාවන් හේතු කොටගෙන ජීවිතයට යහපත් දෙයක් සිදු වුණා නම්, අනවශ්‍ය ප්‍රාර්ථනාවන් ඉවත් කරලා එකඟ කරගත්තු හිතකින් තෙරුවන් ගුණ පිළිබඳ සිහි කළොත්, ශ්‍රද්ධාවෙන් පිරිසුදුව පූජාවන් සිද්ධ කළොත් කොපමණ ආනිසංසයක් ලබන්නට පුලුවන් ද?

ඒ නිසා නිවැරැදි ව බෝධි පූජාවක් සිද්ධ කරනවා නම්, වඩාත් හොඳ ආශිර්වාදයක්, පුණ්‍ය ශක්තියක් ලබා ගන්නවා නම් කලින් කියපු විදිහට බාහිර පරිසරය පිරිසිදු කර ගෙන හිත එකඟ කර ගෙන බෝධිරාජයාණන් වහන්සේගේ වටිනාකම සිහිපත් කරලා තමන් සූදානම් කර ගත්තු පූජා වස්තුන් කටින් නිකන් ම වචන විදියට විතරක් කියන්නේ නැතුව මුළු හිතින් ම පූජා කරමි පූජා වේවා කියන අදහසින් පූජා කළ යුතුයි. තෙරුවන් ගුණ සජ්ඣායනය පමණක් නො කර දන්නා පමණින් ගුණ සිහිපත් කළ යුතුයි. මහත් ශ්‍රද්ධාවෙන් ත්‍රිවිධ චෛත්‍යයන් සිහිපත් කරමින් වන්දනා කළ යුතුයි. පිරිත් ආදිය කියා මෛත්‍රී භාවනාව ආදී යම් භාවනාවක් වැඩිය යුතුයි. මේ අයුරින් සිදු කිරීමේ දී මහත් පුණ්‍ය ශක්තියක් ඒකරාශී වෙනවා. ඒ තුළින් ඉබේ ම තමන්ගේ අපල උපද්‍රව ආදිය දුරු වෙනවා. අමුතුවෙන් ප්‍රාර්ථනා කළ යුතු වන්නේ නැහැ. ඒ නිසා අනෙක් අය කරන්නන් වාලේ පූජාවන් නො කොට පිනක් කර ගන්නට, පුණ්‍ය ශක්තියක් ඒකරාශී කර ගන්නට පුලුවන් වෙන ආකාරයට බෝධි පූජාවන් සිදු කරන්නට හැම දෙනා ම කල්පනා කළ යුතු යි. එවිට ඔබගේ ජීවිතයට යහපතක් සිදු වේවි. සංසාරේ කෙටි කර ගන්නට හැකි කුසල ශක්තියක් වේවි.



පොත්තපිටිය ශ්‍රී විජයාරාම විහාරාධිපති
ලබුවැල්පොල ත්‍රිපිටක ධර්මායතන මහ පිරිවෙන් නියෝජ්‍ය පරිවෙනාධිපති
නුවරඑළිය දිස්ත්‍රික් පාලි ගුරු උපදේශක
රාජකීය පණ්ඩිත, විනය විශාරද
**කන්දකැටියේ විනය ධජ හිමි**

**රුක් අත්තන බෝධිය (රුක් අත්තන)**



තණ්හංකර බුදු හිමි

**ගස් කැල, කැල බෝධිය (ගස් කැල, කැල)**



මේධංකර බුදු හිමි

**පාඨලී බෝධිය (පලොල්)**



සරණංකර බුදු හිමි
විපස්සි බුදු හිමි

**කප්පිත්ත / පතන බෝධිය (කප්පිත්ත / පතන බෝ)**



දීපංකර බුදු හිමි

# සම්බුදු පහස ලද අටවිසි බෝධීන් වහන්සේ

**ජීවිතයේ මුහුණ දෙන අනේකවිධ දුක් කරදරවලට සහනයන් ලබා ගන්නට, යහපත් ප්‍රාර්ථනා ඉටුකර ගන්නට තෙරුවන්ගේ ආශිර්වාදය ලබා ගන්නට බෞද්ධයෝ අමතක නොකරති.**

තෙරුවන් ගුණ සිහි කිරීමකින් එවැනි බාධක අවම කර ගැනීමට හෝ නැති කර ගැනීමට හැකි බව බෞද්ධයින්ගේ විශ්වාසය යි. එබැවින් බෝධි පූජා, නවග්‍රහ පූජා සහ අටවිසි බෝධි පූජාවන් ද පවත්වති. රෝග පීඩා, පවුල් ආරවුල්, විභාග ජයග්‍රහණ, ව්‍යාපාරික හෝ වෘත්තීය ජීවිතියේ අභිවෘද්ධිය, වාසනාව, ග්‍රහදෝෂ නැති කර ගැනීම වැනි අරමුණු පෙරදැරි ව අටවිසි බෝධි පූජා පවත්වති.

සාමාන්‍යයෙන් විහාරස්ථානයක දක්නට ලැබෙන්නේ ඇසතු බෝධින් වහන්සේ පමණි. එයට මල්, පහන්, ගිලන්පස, චතුමධුර, දැහැත් සහ පිරිකර විසි අටබැගින් සකස් කර පූජා කිරීම සම්ප්‍රදාය යි. ඇසතු බෝධිය වටා අටවිසි බෝධින් වහන්සේලා සහ අටවිසි බුදුරජාණන් වහන්සේලා සංකේතවත් කරමින් කුඩා ප්‍රමාණයේ කුටි විසි අටක බුදු පිළිම විසි අටක් තැන් පත්කර තිබෙනු දක්නට ලැබේ. ඒ ඉදිරියෙන් සකස් කරගත් පූජා තැන්පත් කර අටවිසි බෝධි පූජා පවත්වයි. අටවිසි බෝධි පූජාවක් පැවැත්වීමට පෙර කළ යුතු වතාවත් සමූහයක් තිබේ.

විහාරයට පැමිණෙන සැදැහැවත් තැනැත්තා හෝ තැනැත්තිය ශරීරය හොඳින් වැසෙන සේ සුදු ඇඳුමකින් සැරසී පැමිණිය යුතු ය. අනතුරුව බෝධිය අවට මළුව ඇමදිය යුතු ය. මල් ආසන පිරිසුදු කළ යුතු ය. ඒ සියල්ල අවසන් වන විට ම තම සිතට මහත් සහනයක් හිමි වේ. තව ද අන් අයට ප්‍රිය වේ. දෙවියන් සතුටට පත් වේ. රූප ශෝභාව වර්ධනය වේ. මරණින් මතු දිව්‍ය සම්පත් ආදිය හිමිවීමට ද භාග්‍ය උදාවේ.

මළුව පිරිසුදු කළ පසු සකස් කරගත් පූජා අදාළ ස්ථානවල තැන්පත් කිරීම කළ යුතු ය. ඇතැම්හු පහන් දල්වන්නේ බෝධි වෘක්ෂයට ය. ඇතැම්හු බෝ මලු වේ ය. මෙයින් බෝධියේ පැවැත්මට බලපෑම් ඇති කරයි. වැලිමළුවට තෙල් වැටීමෙන් වැලි අපවිත්‍ර වේ. එවිට වැලිමළුවේ වැලි ඉවත් කර නැවතත් අලුත් වැලි ඇතිරීමට බොහෝ විහාරස්ථානවලට සිදු වේ. වන්දනා කරන පිරිස්වලට ද එය බාධා ගෙන දෙයි. එබැවින් බෝධි පූජාවක් පැවැත්වීමේ දී අවධානය යොමු කළ යුතු කරුණු රැසක් ම පවතියි.

අටවිසි බෝධි පූජාවක් පවත්වන්නේ ගෞතම බුදුරජාණන් වහන්සේ ඇතුළු තවත් බුදුවරයන් වහන්සේලා විසිහත් නමකගේ ගුණ සිහිපත් කරමිනි. විශේෂයෙන් ම අටවිසි බෝධි පූජා අවස්ථාවක දී කරන්නේ විසිඅටක් බුදුවරයන් වහන්සේලාගේ නම් සහ බුද්ධත්වයට පැමිණීමට උපකාර වූ බෝධි වෘක්ෂ සඳහන් කවි හෝ ගාථා ගායනා කරමින් වන්දනා කිරීමයි. ගෞතම බුදුරජාණන් වහන්සේ සිද්ධාර්ථ කුමරුව මෙලොව උපත ලබන්නේ සල් ගසක් අසල ය. නේරංජනා නදී තෙර බුද්ධත්වය ලබන්නේ ඇසතු බෝධියක් යට ය. පිරිනිවන්පාන්නේ ද සල් ගස් සමූහයක සෙවණේ ය. ජීවිතයෙන් වැඩි කාලයක් පරිසරය සමග දිවි ගෙවීමට බුදුරජාණන් වහන්සේ ප්‍රිය කළහ.

21 පිටුවට ...

**සාල කළ්‍යාණ බෝධිය (ඉන්දියානු සල්)**




කොණ්ඩඤ්ඤ බුදු හිමි
වෙස්සභූ බුදු හිමි

**නාග බෝධිය (නා)**



මංගල බුදු හිමි රේවත බුදු හිමි
සුමන බුදු හිමි සෝභිත බුදු හිමි

**අර්ජුන බෝධිය (කුඹුක්)**



අනෝමදස්සී බුදු හිමි

**මහාසෝන බෝධිය (මුරුත)**



පදුම බුදු හිමි නාරද බුදු හිමි

**සරල බෝධිය (හොර)**



පදුමුත්තර බුදු හිමි

**නීප බෝධිය (බක්මී)**



සුමේධ බුදු හිමි

**වේළු බෝධිය (කොළ උණ)**



සුජාත බුදු හිමි

**කුකුධ බෝධිය (රුක්)**



පියදස්සී බුදු හිමි

**චම්පක බෝධිය**
**(සපු)**



අත්ථදස්සී බුදු හිමි

**කුරාවක/බිම්ජාල බෝධිය**
**(රත් කරවි)**



ධම්මදස්සී බුදු හිමි

**කණිකාර බෝධිය**
**(කිණිහිරියා)**



සිද්ධත්ත බුදු හිමි

**අසන බෝධිය**
**(අසන)**



තිස්ස බුදු හිමි

**ආමල බෝධිය**
**(නෙල්ලි)**



ඵුස්ස බුදු හිමි

එයට ප්‍රබල හේතුවක් පවතියි. මනුෂ්‍යා ස්වභාවික සත්වයෙකි. පරිසරයට අයත් ජීවියෙකි. ස්වභාවික ජලය, ගස් සෙවණ ආදිය ජීවිතයට සහනය සලසයි. රෝගාබාධ උපන් අවස්ථාවල දී ගස්වල මල්, ඵල, කොළ, මුල්, දළු, කිරි හෝ මැලියම් සහ කොළ තම්බා ලබා ගන්නා ජලය ඖෂධ වශයෙන් භාවිත කිරීමට බුදුරජාණන් වහන්සේ අනු දැන වදාරා ඇත්තේ එබැවිනි.

ගෞතම බුරජාණන් වහන්සේ ද අනුගමනය කර ඇත්තේ පෙර බුදුවරුන්ගේ මඟ ය. බුදු, පසේබුදු සහ අර්හත් යනුවෙන් නිවන් දැකීමේ බෝධි තුනක් ඇති බව ධර්මයේ සඳහන් ය. මෙයින් පසේබුදු බව සහ අර්හත් බව ඕනෑම ස්ථානයක දී ලැබිය හැකි ය. එහෙත් බුද්ධත්වය ලබන්නේ බෝධි වෘක්ෂයක් සමීපයේ ම ය. මේ නිසා ම "බෝධි" පදයට සර්වඥතා ඥානය, අර්හත් මාර්ග ඥානය, ආර්ය මාර්ගය, සතර මාර්ග ඥානය, සත්‍යාවබෝධය, බෝ වෘක්ෂය යන ගැඹුරු අරුත් ආරෝපණය වී ඇත. ගෞතම බුදුරජාණන් වහන්සේ ඇසතු බෝධියට කෘතගුණ සැලකීම් වශයෙන් දින හතක් ඇසිපිය නො හෙලා අනිමිස ලෝචන පූජාව පැවැත්වූහ. එයින් උන්වහන්සේගේ ආධ්‍යාත්මික ශක්තිය එයට අයිති විය. සෙසු බුදුරජාණන් වහන්සේලා විසි හත් දෙනා ද තමන් වහන්සේලාට බුද්ධත්වයට පැමිණීමට උපකාර වූ වෘක්ෂවලට කෘත ගුණ දක්වා තිබේ. බුද්ධත්වය ලැබීමට යොදා ගෙන ඇති බෝධි වෘක්ෂ සියල්ල රුක්ෂ වෘක්ෂයන් ය. එවැනි ගසක් සමීපයේ විනාඩි කිහිපයකට නතර වුවත් ලැබෙන මානසික සහනය වචනවලින් ප්‍රමාණය කළ නොහැකි ය. තව ද එම වෘක්ෂ ඖෂධ ගුණවලින් පිරිපුන් ඒවා ය. බුදුරජාණන් වහන්සේ ගස්, ගල්වලට වන්දනා කිරීම ප්‍රතික්ෂේප කළහ. එහෙත් බුදුරජාණන් වහන්සේ කෙනෙකු පරිභෝග කළ වස්තුවකට අනුග්‍රහ දැක්වීම ආශිර්වාද ලබා ගැනීමට හැකි දෙයක් බව ශාරීරික, පාරිභෝගික සහ උද්දේශික යන ත්‍රිවිධ චෛත්‍යයන් දක්වමින් අනුදැන වදාළහ. අනන්ත ගුණවලින් පිරුණු සම්බුද්ධත්වය ලැබූ බුදුරජාණන් වහන්සේ නමකට සෙවණ දුන්, උන්වහන්සේලාගෙන් ආශිර්වාද ලැබූ බෝධි වෘක්ෂ විසිඅටකට පූජා පැවැත්වීම අටවිසි බෝධි පූජාවේ විශේෂ ලක්ෂණය යි. එහෙත් වෘක්ෂ වශයෙන් ගත් විට විසි දෙකක් පමණක් දක්නට ලැබෙයි. නා ගස, සල් ගස සහ මුරුත ගස අවස්ථා කිහිපයක දී බුද්ධත්වයට භාවිත කර ඇත. තණ්හංකර, මේධංකර, සරණංකර, දීපංකර, කොණ්ඩඤ්ඤ, මංගල, සුමන, රේවත, සෝභිත, අනෝමදස්සී, පදුම, නාරද, පදුමුත්තර, සුමේධ, සුජාත, පියදස්සී, අත්ථදස්සී, ධම්මදස්සී, සිද්ධත්ත, තිස්ස, ඵුස්ස, විපස්සී, සිඛී, වෙස්සභූ, කකුසඳ, කෝණාගම, කාශ්‍යප, ගෞතම යන බුදුරජාණන් වහන්සේලා බුද්ධත්වය ලැබීමට උපකාර කර ගත් බෝධි වෘක්ෂ පර්යාය නම් සමගින් පිළිවෙළින් මෙසේ සඳහන් කළ හැකි ය. රුක්අත්තන ගස සප්තපර්ණී, නමින් ද, කැල ගස කිංසුක නමින් ද, කප්පිත්ත හෙවත් පතන බෝ, පිප්ඵලි, පුලිල, පලොල්, නෙරළු යනුවෙන් ද හඳුන්වයි. සරණංකර සහ දීපංකර බුදුරජාණන් වහන්සේලා දෙනම පතන බෝධිය භාවිත කර තිබේ. කොණ්ඩඤ්ඤ සහ වෙස්සභූ බුදුරජාණන් වහන්සේ සල් වෘක්ෂය යොදා ගන්නා අතර එය සාල කල්‍යාණි, ඉන්දියානු සල් යනුවෙන් ද හඳුන්වයි. මංගල, සුමන, රේවත සහ සෝභිත බුදුරජාණන් වහන්සේලා නා ගස භාවිත කළහ. එය නාග, නාගරුක්ඛ යන නම්වලින් ද හඳුන්වයි. අනෝමදස්සී බුදුරජුන් කුඹුක් හෙවත් අර්ජුන ගස ද, පදුම සහ නාරද බුදුවරු මුරුත, කේතරුක්ඛ සහ මහාසෝණ නමින් හඳුන්වන බුරුත ගස ද භාවිත කර ඇත. පුදුමුත්තර බුදුරජාණන් වහන්සේගේ සිට සෙසු බුදුවරුන් වහන්සේලා පිළිවෙළින් පහත සදහන් බෝධි වෘක්ෂ බුද්ධත්වයට පාරිභෝගික කර තිබේ.

හොර හෙවත් සලල ගස ද, කොළොන්, මහානිප, නීපරුක්ඛ නම්වලින් යුතු බක්මී ගස ද, මහාවේණු, වේළු යනුවෙන් හදුන්වන කොළ උණ ගස ද, කුකුබ, පියංගු නමින් හදුන්වන රුක් ගස ද, චම්පික නමින් හඳුන්වන සපු ගස ද, බිම්බජාල, කුරාවක යනුවෙන් භාවිත කරන රත්කරවු ගස ද, කනීකාර, කරණකාර නම්වලින් දක්වන කිණිහිරියා ගස ද, අසන, පියා යන නම්වලින් හදුන්වන කොහොඹ ගස ද, ආමලක, ඇඹුල රුක යනුවෙන් දක්වන නෙල්ලි ගස ද, පාඨලී හෙවත් පලොල් ගස ද, පුණ්ඩරීක, හෙළඹ නම්වලින් හදුන්වන ඇටඹ ගස ද, උදුම්බර සහ දිඹුල් යනුවෙන් දක්වන අට්ටික්කා ගස ද, නිග්‍රෝධ සහ මහනුග යනුවෙන් හඳුන්වන නුග ගස ද, මහරි, සිරිසි, මාර සංඝ්‍ය නමින් දක්වන මාර ගස ද, අසත්ත බෝධිය නමින් දක්වන ඇසතු බෝධිය ද බෝසත්වරු බුද්ධත්වයට භාවිත කළහ. මේ සියල්ල ඉතා විශාල වෘක්ෂයෝ ය. අධික සෙවණක් සහිත ය. ජලය රැඳෙන ස්ථානවල පිහිටන ඒවා ය. එමෙන් ම ශරීර සෞඛ්‍යයට මහත් සහනයක් සැපයීමේ හැකියාවලින් යුක්ත ය. ඖෂධීය ගුණවලින් පිරිපුන් ය. බුද්ධාංකුරයන් වහන්සේලාගේ අවධානය එම වෘක්ෂවලට යොමු වී ඇත්තේ එවැනි හේතු නිසා ය.



දඹාන මාවරගල ආරණ්‍ය සේනාසනවාසී
රාජකීය පණ්ඩිත, ශාස්ත්‍රපති,
අධ්‍යාපනපති
**පදියතලාවේ අමරවංශ හිමි**

**පුන්ඩරීක බෝධිය**
**(ඇටඹ)**



සිඛී බුදු හිමි

**සිරීස බෝධිය**
**(මාර)**



කකුසඳ බුදු හිමි

**උදුම්බර බෝධිය**
**(අට්ටික්කා)**




කෝණාගම බුදු හිමි

**නිග්‍රෝධ බෝධිය**
**(නුග/මහ නුග)**



කාශ්‍යප බුදු හිමි

**අස්සක බෝධිය**
**(ඇසතු)**



ගෞතම බුදු හිමි

**හොඳ ආර්ථිකයක් ගොඩනඟා ගැනීම අප හැමෝගෙම බලාපොරොත්තුවයි. ඒත් හැමෝටම ඒ තැනට යා නොහැකියි. ඒ නිසා ම අනිසි ක්‍රම මඟින් මුදල් උපයන්නට ඇතැම් අය උත්සාහ කරනවා. ඒ නිසා ම ජීවිතය විනාශ කර ගන්නා අවස්ථා ද බොහොමයි. බුදු දහම අගය කරන්නේ දැහැමි ධනෝපායනය යි. ආර්ථික වශයෙන් දියුණුවන ආකාරය බුදුදහමේ පැහැදිලි ව පහදා දී තිබෙනවා. ධෛර්යය , කැපවීම, නො පසුබට උත්සාහය වේ නම්, දියුණුව වෙත යන්නට පුලුවන්. ඇතැම් විට අසාර්ථක වන අවස්ථා තිබෙනවා. එහි දී ත් ධෛර්යයෙන් නැවත නැඟී සිටින්නට ඕනෑ. එවැනි සාර්ථක බෞද්ධ ව්‍යාපාරිකයෙක් අපට හමුවුණා. ඒ, ඇඟලුම් ව්‍යාපාරයක් ඉතා සුළුවෙන් ආරම්භ කොට, මේ වනවිට ව්‍යාපාර ලෝකයේ සාර්ථක නමක් දිනා ගත් බෞද්ධ ව්‍යාපාරිකයකු වූ දේශබන්ධු, වණික්පති කේ.ආර්.ජී. විජේසුන්දර මහතා . මේ, ඔහු ආ ගමන් මඟ පිළිබඳ කළ සාකච්ඡාවක්.**

# දුසිරිතෙන් ඈත් වනවා නම් ජීවිතය සාර්ථක කර ගන්න එය ම ආශිර්වාදයක් වෙනවා



**කේ. ආර්. ජී. විජේසුන්දර**
**සී/ස විජය සමූහ ව්‍යාපාර ( පුද්ගලික) සමාගම අනුබද්ධිත, CIB ගාමන්ට් සහ CIB ෂොපින් සෙන්ටර් ශාඛා ජාලයේ සභාපති සහ කළමනාකාර අධ්‍යක්ෂ**



## මා ආ ගමන් මඟ

**ගෙවුණු ළමා වියේ මිහිරි මතක වැඩියෙන් දැනෙන්නේ වැඩිහිටියෙක් වුණාම. අද ජීවිතය සාර්ථක කර ගන්න එදා ලැබුණු අත්දැකීම් මොන වගේ ද?**

මම ඉපදුණේ මහනුවර ඉතා පිටිසර පිහිටි මාපාමඩුල්ල කියන ගමේ. 1954 වර්ෂයේ. බොහෝ ම ලස්සන ඒ ගමට තිබුණේ වැලි පාරක් විතරයි. හැම ගෙදරක ම වහලය පිදුරුවලින් ආවරණය කරලා තිබුණා මට මතකයි. ගමේ හැම දෙයකට ම මුල් වුණේ පන්සල. ගමේ ජීවත් වුණේ පවුල් කීපයක් වුණත් ඒ හැමෝම හරිම සමඟියෙන් හිටියා. පන්සල ඇසුරේ, ගහකොළ සෙවණේ, සතා සීපාවා අතරේ තමයි මගේ බාල කාලය ගෙවී ගියේ.

මගේ පියා ගමනා ගමන මණ්ඩලයේ රියදුරෙක්. අම්මා ගෘහණියක්. මගේ පියා එඩිතර චරිතයක් වුවත් අම්මා ඉතා ගුණගරුක නිහතමානී තැනැත්තියක්. අම්මාගේ නම ගුණවතී. මගේ මවගේ තාත්තා ඉතාමත් හොඳ දානපතියෙක්. ඒ ආභාෂය මගේ අම්මටත්, අම්මගෙන් මටත් ආ එකක් කියා මට හිතෙනවා. කුඩා කාලයේ පටන් ම අපේ මව්පියෝ ආගම දහමට අප ව ළං කළා. මට අකුරු කියවූයේ මාලගම්මන චන්දජෝති හාමුදුරුවෝ. උන්වහන්සේගේ ඇසුර මගේ ජීවිතයට ශක්තියක් වුණා. අපි හැමෝම ශ්‍රී දේවානන්ද දහම් පාසලටයි ගියේ. පාසල් අවසන් වී ගෙදර ආ පසු නැවත අපි පන්සලට ගොස් පන්සල් පොත් කියවනවා. එයින් ලැබුණ දැනුම අදටත් ප්‍රයෝජන යි.

**ඔබ අධ්‍යාපනය ලැබුවෙත් මාපාමඩුල්ල ගමේ ම ද?**

නැහැ. අපේ ගමට අල්ලපු ගම නුගවෙල. මම නුගවෙල මධ්‍ය විදුහලේ පළමු පන්තියේ සිට උසස් පෙළ දක්වා අධ්‍යාපනය ලැබුවා. මගේ ජීවිතයට බොහෝ ආදර්ශ ලැබුණේ පාසලෙන්. ඒ ලැබුණ පන්නරය මගේ ජීවිතය ශක්තිමත් කළා. මගේ පවුලේ සහෝදර සහෝදරියන් නව දෙනෙක්. මම අට වැනියා. අපි නව දෙනාට ම මව්පියන් හොඳ අධ්‍යාපනයක් ලබා දුන්නා. මා ඇඟළුම් ව්‍යාපාරයට යොමු වුණත්, සහෝදර සහෝදරියන් විශ්ව විද්‍යාල අධ්‍යාපනය පවා ලබා මේ වනවිට ඉතා ඉහළ තනතුරු දරමින් රටට සේවය කරනවා. මම උසස්පෙළ අවසන් කරන කාලයේ මගේ වැඩිමල් සොහොයුරා වැඩිදුර අධ්‍යාපනයට කොළඹට ආවත් ඔහු පදික වේදිකාවේ ඇඳුම් වෙළඳමක් ආරම්භ කර තිබුණා. ඉගෙනීම අවසන් කර සිටි මම 1970 අයියාගේ ව්‍යාපාරයට සම්බන්ධවීමට කොළඹට ආවා. එතැන් සිට අති දුෂ්කර ව ආ ගමන් මගක් තමා මට තිබෙන්නේ.

**සළුපිළි ලොව ශ්‍රී ලාංකීය අභිමානය CIB කියා ඔබගේ ව්‍යාපාරය හඳුන්වන්නේ ඇයි?**

ඉතාමත් අභිමානවත් ගමනක් ආ නිසා ම යි මම ඒ තේමාව යොදා ගත්තේ. අපට කුඩා කාලයේ පාසල් යාමට නිල ඇඳුමක් තිබුණේ නැහැ. කැමැති ඇඳුමක් ඇඳගෙන අප පාසල් ගියා. එවැනි පරිසරයක ජීවත් වූ මම 2018, 2019, 2020, 2021 වර්ෂ සඳහා ස්ලිම් නීල්සන් ජනතා සම්මානවලින් පිදුම් ලැබුවා. ළමා කාලයත් සමඟ බලද්දී අද මා සිටින තැන ගැන මට තිබෙන්නේ අභිමානයක්. සාධාරණ මිලකට අපි රෙදිපිළි සපයනවා. එය අභිමානයට හේතුවක්. අභිමානය කියන වචනය යොදන්නට උරුමයක් තිබෙනවා කියා මට හිතෙනවා. දුප්පතාගේ දුක දන්නා මම දේශීය සංස්කෘතියක් යටතේ දේශීය ආර්ථිකයක් දියුණු කිරීමේ වටිනාකම හඳුනාගෙනයි ඉන්නේ. බිම් මට්ටමේ සිට ලැබුණ අත්දැකීම් නිසා හැම දෙයක් ම සාධාරණ ව ඉටු කරන්න මම උත්සාහ කරනවා. ඇඳුම තුළින් අභිමානවත් බවක් පෙන්විය හැකියි. මම මේ ව්‍යාපාරය පටන් ගෙන වසර තිස් ගණනක් වෙනවා. එතැනින් පසු CIB ඇඟලුම් කර්මාන්තය ආරම්භ කළා. රටට ගැළපෙන ඇඳුම් මෙරට දී ම නිෂ්පාදනය කළා. ඒ නිසයි CIB ආයතන බොහෝ ප්‍රදේශවලට ව්‍යාප්ත ව ගියේ. ඒ ඒ පළාත්වල අපේ ආයතන ඉදිවෙද්දී ඒ ප්‍රදේශයේ තරුණ තරුණියන්ට අප රැකියා ලබා දෙනවා. අප සළුපිළි ලොව වෙනසක් කළා කියන අභිමානය මා තුළ තිබෙනවා.

**ඔබගේ ව්‍යාපාරයට බුදුදහම තුළින් ලැබෙන අවවාද , අනුශාසනා සම්බන්ධ කර ගන්නේ කෙසේද? සේවක පිරිස් හා ඔබ අතර තිබෙන්නේ මොනවගේ සම්බන්ධතාවක් ද?**

මට ගමේ විහාරයෙන් ලැබුණු ආභාෂය කොළඹ දී ලැබුණේ මහරගම ධර්මායතනය තුළින්. අපවත් වී වදාළ මඩිහේ මහා නාහිමියන්ගේ ඇසුර මගේ ජීවිතය වෙනස් මඟකට යොමු කළා. මිනිසා නොහදා රට හදන්න බැහැ කියන උන්වහන්සේගේ පණිවිඩය යි මම ක්‍රියාත්මක කරන්නේ. පොඩි කඩ කාමරයක සේවකයන් තුන් දෙනකුගෙන් ආරම්භ කළ ඒ ව්‍යාපාරය තුළ මේ වනවිට තුන් දහසකට අධික කාර්ය මණ්ඩලයක් සිටිනවා. ඒ සියලු ම දෙනා ව්‍යක්තයි.

23 පිටුවට ...



විනීතයි. විශාරදයි. මහා නාහිමියන්ගේ සංකල්පය යි මා මෙහිදී උපයෝගි කර ගත්තේ. ඉතාම පොඩි තැනින් පටන් ගෙන, ඉතා ම ඉහළ තනතුරුවලට අද අපේ ආයතනයේ නිලධාරීන් පැමිණ සිටිනවා. අප ආයතයේ සියලු දෙනා පංච දුශ්චරිතයෙන් තොරයි. පන්සිල් සුරකින පිරිසක්. දුම්වැටි, මත්ද්‍රව්‍ය, බොරුව, කේළම, වැරැදි කාමය ආදී සියල්ල ම ආයතය තුළ තහනම්. අපේ සෑම ශාඛාවක් ම විවෘත කිරීමට පෙර පන්සිල් සමාදන් වෙලා, දෙවියන්ට මව්පියන්ට පින් අනුමෝදන් කරලයි වැඩ පටන් ගත්තේ. ඒ නිසා ශ්‍රී ලංකාවේ සංස්කෘතියට ගැළපෙන වාණිජ සංස්කෘතියකට ළඟා වූ ආයතනයක් ලෙසයි මට දැනෙන්නේ. එයයි ධර්මපාලතුමාගේ චින්තන ය. නිදහස් අධ්‍යාපනයෙන් පෝෂණය වූ පිරිසක් නිසා අපි ඒ වෙනුවෙන් බොහෝ වැඩ කොටසක් කරමින් ඉන්නේ. එදා සිට මේ වන තුරු මම ධර්මායතනයේ සිල් සමාදන් වෙනවා. අපේ කාර්ය මණ්ඩලය සහ ඔවුන්ගේ මව්පියන් විටින් විට දඹදිව වන්දනා කිරීමේ වැඩසටහනක් ද අපි ක්‍රියාත්මක කළා. සෑම දෙයක් ම ආගමට මුල්තැන දෙමින් සිදු කරන්නේ.

**කොරෝනා වෛරසය ලෝකය ම අර්බුදයකට ඇද දමුවා. මේ වසංගතය හමුවේ සේවක සේවිකාවනුත් රැක ගෙන එයට සාර්ථක ව මුහුණ දෙන්නට හැකි වුණා ද?**

මෙවැනි වසංගතයකට මුහුණ දුන් පළමු අවස්ථාව මෙය යි. අපට ඒ සම්බන්ධයෙන් කළයුතු දේ ගැන අත්දැකීමක් තිබුණේ නැහැ. ඒත් ව්‍යාපාර ජීවිතයේ අවුරුදු 47 ක අත්දැකීම නිසා එයට සාර්ථක ව මුහුණ දුන්නා. සේවක පිරිස රැක ගනිමින් අප වගකීමෙන් කටයුතු කළා. ව්‍යාපාරය රැක ගැනීම කළ යුතු ව තිබුණා.

එය අභියෝගයක්. පළමු කොවිඩ් රැල්ලේ දී රට වැහුවා. එහි දී අප සේවක පිරිස රැක ගත්තා. මානව සම්පත් අංශය සියලු සේවකයන් ගැන සොයා බැලුවා. සේවකයන් වෙනුවෙන් කොවිඩ් මධ්‍යස්ථානයක් පටන් ගෙන අපේ සේවකයන් රැක ගත්තා. ඒ වගේ ම රෝග උවදුරෙන් පීඩාවට පත් විහාරස්ථාන, රෝගයට පත් වන අය සහ ඔවුන්ගේ පවුල්වල උදවිය සහ ළමා නිවාස, වැඩිහිටි නිවාස ආදී උපකාර ලැබිය යුතු සියලුම දෙනා සොයමින් ගොස් ඔවුන්ට අවශ්‍ය සියලු දේ සපයා දුන්නා.

ඒ වගේ ම අපේ ශාඛා තිබෙන පළාත්වල සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාල, මහජන සෞඛ්‍ය පරීක්ෂක මහතුන් සමඟ එක්ව පවුල් 100 තෝරාගෙන ඔවුන්ට අවශ්‍ය වියළි ආහාර මල්ලක්, එළවළු මල්ලක් ආදිය ලබා දුන්නා. එලෙස ම ලංකාවේ බොහෝ රෝහල්වල කාර්ය මණ්ඩලයට අවශ්‍ය කරන ඇඳුම් ඇතුළු උපකරණ ලබා දීමට කටයුතු කළා.

**අද තරුණ පරපුරේ සමහර කොටසක් වේගයෙන් දුෂ්චරිතයට ඇදෙමින් සිටිනවා. වේගයෙන් මුදල් ඉපයීම ඔවුන්ගේ අරමුණ යි. මේ අයට දෙන්නේ මොන වගේ අවවාදයක් ද?**

තමන්ගේ හැකියාව, දක්ෂතාවය තමන් නිවැරැදි ව හඳුනා ගන්න ඕනෑ. සියලු දෙනාට ම වෛද්‍යවරු හෝ ඉංජිනේරුවන් වෙන්න බැහැ. අපේ රටට හොඳ නිෂ්පාදකයෝ අවශ්‍ය යි. මගේ ජීවිතයේ මම කොළඹට එනවිට පැනක් සහ පොතක් පමණයි තිබුණේ. එහෙත් මම අද ඉහළ ම ස්ථානයක ඉන්නවා. ඒ මගේ කුසලතාවය මම හඳුනාගත් නිසයි. මගේ පවුලේ අය එක් එක් අංශ තෝරා ගනිද්දී මම ඇඟළුම් ව්‍යාපාරය තෝරා ගත්තා. මම මහ පාරේ, පොළවල් ගානේ ගිහින් රෙදි විකුණුවා. මම ඒකට ලජ්ජා වුණේ නැහැ. අද සමහර තරුණ දරුවො හරි දේ කරන්න ලජ්ජයි. ඒත් වැරැද්දට ලජ්ජාවක් නෑ. ලජ්ජා භය කියන දේ නිවැරැදි ව අපේ ජීවිතවලට ගළපා ගන්න ඕනෑ. ත්‍රී රෝද රථයක් පාරට දාලා රැකියාව පටන් ගන්නා තරුණයා පවට ලජ්ජා භය ඇති කර ගෙන, සාධාරණ ව, ආගමට ලැදි ව කටයුතු කළොත් ඔහුට පුළුවන් දියුණුව කරා යන්න. මගේ තරුණ කාලේ නුගේගොඩ පදික වේදිකාවේ වෙළෙඳාම් කළ බොහෝ තරුණයන් සවසට මත්පැන් පානය කළා. ඔවුන් උපයන දේ ඉතිරි කර ගත්තේ නැහැ. මම හිතන්නේ ජීවිතවලට ඉලක්කයක් තිබෙන්න ඕනේ. එයට කාලයක් ගතවේවි. පියවරෙන් පියවර ඉදිරියට යන්න. මෙහි දී අරපිරිමැස්ම ප්‍රධාන වෙනවා වගේ ම උත්සාහයත් අවශ්‍ය වෙනවා. අද බොහෝ තරුණයන් එක දෙයක් පටන් ගෙන ටික කාලයකින් එය අතහැර දමා තව දෙයකට යොමු වෙනවා. එය සාර්ථක බවේ ලක්ෂණයක් නොවෙයි. තමන් කරන දේ විශ්වාසයෙන් නිවැරැදි ව , උත්සාහයෙන්, වීර්යයෙන්, සිහියෙන්, කැප කිරීම මත කළයුතු දෙයක්. දැන් නිදිමත යි, බඩගිනියි, පිපාස යි, මහන්සි යි, සීතල යි, රස්නේ වැඩියි සිතමින් කාලය අපතේ නො හැර දුක, සැප සම සේ විඳ දරා ගෙන ආරම්භ කරන දේ හරියට කරන්න ඕනෑ. සාර්ථක මිනිසුන් ගිය මඟ සොයන්න ඕනෑ. ඒ ජීවිත තමන්ට ගළපා ගන්න උත්සහ කරන්න ඕනෑ.

හැමෝට ම වෘත්තිකයෙක් වන්නත් බැහැ. ව්‍යවසායකයෙක් වෙන්නත් බැහැ. තමන් කරන දේ තේරුම් ගෙන අවතීර්ණ විය යුතු වෙනවා. මට කොළඹ බිම් අඟලක්වත් තිබුණේ නැහැ. ඒත් මට අද බොහෝ දේ උරුමයි. අක්කර 18 ක් බෞද්ධ මධ්‍යස්ථානවලට පූජා කර තිබෙනවා. දියුණු වීමේ දී අවංකබව, නිහතමානීකම, කළගුණ සැලකීම අවශ්‍ය යි. වංක, කපටි පුද්ගලයා ඉක්මණින් පිරිහෙනවා. සත්පුරුෂ ආශ්‍රය, සද්ධර්ම ශ්‍රවණය, යෝනිසෝමනසිකාරය, ධම්මානුධම්ම පටිපදාව මගේ ජීවිතයට බද්ධ වෙලා තිබෙන්නේ. සතරසංග්‍රහ වස්තු මම ජීවිතයට ගළපාගෙන තිබෙන්නේ. බොළඳ, බාල වගේ ම රළු චරිතවලට වැඩි දුරක් යන්න බැහැ. කවදා හෝ අප මේ සියල්ල අතහැර යා යුතු වෙනවා. එදාට තමා ගැන තමාට ලස්සන මතකයක් තිබෙනවා නම් ඔහු මෙලොව වගේ ම පරලොවත් දිනුවා වෙනවා.

> “ලජ්ජා භය කියන දේ නිවැරැදි ව අපේ ජීවිතවලට ගළපා ගන්න ඕනෑ. ත්‍රී රෝද රථයක් පාරට දාලා රැකියාව පටන් ගන්නා තරුණයා පවට ලජ්ජා භය ඇති කර ගෙන, සාධාරණ ව, ආගමට ලැදි ව කටයුතු කළොත් ඔහුට පුළුවන් දියුණුව කරා යන්න.”

**රත් බඳනෙහි කෙසර**
**තෙල් අඩු නොවී පවතින මෙන්**
**උතුමන් හද සපිරි**
**කුළුණු මෙත් අඩු නොවී පවතී**

(රන් භාජනයක දැමූ සිංහ තෙල් අඩු නොවී පවතින්නාක් මෙන් සත්පුරුෂ යන්ගේ හදවත තුළ පිරී පවතින කරුණා මෛත්‍රී ගුණ ද අඩු නොවී පවතින්නේ ය.
**ලෝකෝපකාරය**)

**නයනා නිල්මිණී**





# විහාර මහා දේවියට දරුවෙක් පිළිසිඳ ගනියි

විහාර මහා දේවිය
03 කොටස



**විහාර මහා දේවිය මාලිගාවට යන ගමන නවතා ආපසු හැරී විහාරයට පැමිණියා ය. සාමණේරයන් වහන්සේගේ ආදාහන පූජෝත්සවයේ කටයුතු ඉතා උසස් අන්දමින් සිදු කිරීමට ඇය උත්සුක වූවා ය.**

සාමණේරයන් වහන්සේ අපවත් වී ටික කාලයක් ගත විණි. දරුවන් නැති දුකින් පෙළෙමින් සිටි විහාර මහා දේවියට දරුවකු පිළිසිඳ ගත් ලකුණු දැනිණි. ඇය බොහෝ සතුටු වූවා ය. දරුවා පිළිසිඳගෙන ටික කාලයක් ගතවුණි. විහාර මහා දේවියට පුදුමාකාරයේ දෙළදුකක් ඇතිවිය.

ඒ, වෘෂභයකු පමණ වූ මී වදයක් ගෙනැවිත් එය රහතන් වහන්සේලා දෙලොස් දහසකට පිළිගැන්වීමට ය. ඉතිරි කොටස අලංකාර යහනක වැතිරී ඉහ ඉද්දර තබාගෙන තමන් විසින් අනුභව කරනු ලැබීම ය. එය ඇයගේ පළමු ආශාව ය. (මීවදයේ ප්‍රමාණය ඉස්බක් පමණ යැයි ද ඇතැම් තැනෙක සඳහන් ය.)

තම දේවියගේ ආශාව සංසිඳවීමට රජතුමා වහා කටයුතු සූදානම් කළේ ය. මී වදයක් සොයා ගැනීමට අණ බෙර යැවී ය.

මේ පිළිබඳ අපූරු ජනප්‍රවාදයක් ද වේ. ඒ අනුව, වෙරළාසන්න ජනපදයක ජීවත් වූ අන්ධ මිනිසකුට ද මේ අණ බෙර හඬ ඇසුණි. ඔහු තම දරුවන්ට කතා කොට

"ළමයිනේ, අසවල් තැන තිබෙන මී ගසේ මල් පිපිණු හැටියේ ම මට කියන්නට ඕනෑ." පැවසුවේ ය.

වෙල් නියරවල දුව පනිමින් සෙල්ලම් කරමින් සිටි ළමයින්ට දිනක් මී ගසේ මල් පිපී තිබෙනවා දකින්නට ලැබුණි. ඔවුහු වහා දිව ගොස් මේ පණිවිඩය පියාට පැවසූහ.

අන්ධ මිනිසා මී ගස අසලට ගියේ ය. දරුවන්ලවා ම ඒ මී ගසේ අත්තක අට්ටාලයක් බැඳගත්තේ ය. අට්ටාලයට නැග ගත් හේ නිසොල්මනේ සිටියේ ය. මී මල් පැණි බොන්නට එන මී මැස්සන්ගේ කතා බහට කන් දී ගෙන සිටියේ ය.

දිනක් මී ගසේ මල්වලින් රොන් ගන්නට පැමිණි කණ මී මැස්සියක සහ තවත් මී මැස්සියක් අතර ආරවුලක් ඇති විය. මේ ආරවුලේ දී මී මැස්සියන් දෙන්නා එකිනෙකාට පුරාජේරු කියන්නට විය.

"නුඹ දන්නා තරම තමයි, අසවල් තැන උණ පඳුරේ පුරුක් නැති උස බටයක් තිබෙනවා. එහි මුල සිට අග දක්වා ම මී වදයක් තිබෙනවා. මගේ දෑහින් ම දුටුවා".

ඒ ඇසූ අනෙක් මී මැස්සිය ද දෙවැනි නොවීය.

" එයත් මහ දෙයක් ද? වෙරළ අයිනේ ඔරු කඳක් තියෙනවා. රියන් සීයක් විතර ඇති. ඒ ඔරුකෙඳේ ඉස්බක් තරම් මී වදයක් තියෙනවා මමත් දුටුවා."

මේ කතාව අසා සිටි අන්ධ මිනිසා දරුවන් ද සමඟ අර උණ පඳුර සොයා ගියේ ය. මී මැස්සිය කී ලෙස ම එහි වූ උණ බටයේ මී වදයකි. ඔහු වහ වහා අනෙක් මී මැස්සිය කී ඔරු කඳ වෙත ගියේ ය. එහි ද කී ලෙස ම මීවදයකි. අන්ධ මිනිසා මේ අපූරු පුවත වහාම රජතුමාට දැනුම් දුන්නේ ය. ඒ අනුව දේවියගේ පළමු දෙළ දුක සංසිඳවීමට රජතුමාට හැකි විය.

විහාර මහා දේවියට තවත් ආශාවක් වූයේ ය. එකල අනුරාධපුරය පාලනය කළ එළාර රජුගේ විසි මහා යෝධයන්ගෙන් ප්‍රධානියා වූයේ දීඝජන්තු ය. ඔහුගේ හිස ගසා, එම හිසත් සමඟ ම එම හිස ගැසූ කඩුව ගෙනවුත් එය සෝදා ගත් වතුර දීඝ ජන්තුගේ කඳින් වෙන් වූ හිස මත දෙපා තබාගෙන පානය කිරීමට ය.

දේවියට ඇති වූ තෙවැනි ආශාව එළාර රජුගේ මඟුල් පොකුණෙහි පිපුණු පස්පියුම් මල් දමක් කර ගෙල පළඳින්නට ය.

විහාර මහා දේවියට ඇති වූ මේ දෙළ දුක්වල අර්ථය කුමක් ද කියා නිමිති දන්නා අයගෙන් රජතුමා විසින් විමසන ලදී. විහාර මහා දේවියගේ දෙළදුක සංසිඳ වූයේ නම්, දේවියට ලැබෙන පුත්‍රයා සතුරු ද්‍රවිඩයන් විනාශ කර ලංකාව එක්සේසත් කර, සම්බුද්ධ ශාසනය ද බබළවනවා යැයි ඔවුහු පැවසූහ. එය රජතුමාට සතුට ට කරුණක් විය.

විහාර මහා දේවියගේ පළමු ආශාව සංසිඳ විය. කාවන්තිස්ස රජතුමා දේවියගේ දෙවන හා තෙවන ආශාවන් සංසිඳවීමේ වගකීම ජ්‍යෙෂ්ඨතම සෙනෙවියා වූ වේළුසුමන යෝධයාට පැවරුවේ ය. රුහුණෙන් පිටිවහල් කළ වරදකරුවකු ලෙස වෙස්වළා ගත් වේළුසුමන පිහිටි රට එනම් අනුරාධපුරයට ගොස් එළාර රජතුමා හමුවිය. ' "රජතුමනි, ඔබ වහන්සේගේ ගුණ වර්ණනා කිරීමේ වරදට කාවන්තිස්ස රජතුමා විසින් මා රුහුණු රටින් නෙරපා දමනු ලැබුවා."

ඔහු රජු හමුවේ කීවේ ය.

ඔහුගේ අහිංසක ලීලාව දුටු එළාර රජු ද, ඔහු කියන්නේ ඇත්තක් යැයි සිතීය. ඔහු කෙරෙහි විශ්වාශයෙන් රාජකීය අශ්ව ගාලෙහි සේවයට ද එක් කර ගත්තේ ය. වේළුසුමන අශ්ව ගාලෙහි වූ වේගවත් ම අශ්වයා හඳුනා ගත්තේ ප්‍රධාන අස්ගොව්වාත් සමඟ මිත්‍ර වීමෙනි. ඒ අතරම දැනගත යුතු සියලු රහස් දැන ගන්නට ද ඔහු අමතක නො කළේ ය.

සුදුසු අවස්ථාවක් එළඹුණි. එළාර රජුගේ මඟුල් පොකුණේ නෙළුම් මල් නෙළා ගත් වේළුසුමන, දීඝජන්තු යෝධයාගේ අශ්වයාට සම උස ඇති වේගයෙන් දුවන්නට හැකි තරුණ අශ්වයකු පිට නැගුණේ ය. එළාර රජතුමාගේ මාලිගය ඉදිරියට ගියේ ය.

"මම තමයි කාවන්තිස්ස රජුගේ වේළුසුමන යෝධයා, පුළුවන්නම් මා අල්ලා සිර කර පල්ලා"

යැයි අභියෝග කළේ ය. එකෙණෙහි ම පවනට බඳු වේගයෙන් අශ්වයා පන්නවා අතරමඟ මහ වනයක සැඟවී ගත්තේ ය. වේළුසුමන ලුහුබැඳ පැමිණියේ ඔහු බලාපොරොත්තුවෙන් සිටි දීඝජන්තු යෝධයා ම ය. වේළුසුමන දීඝජන්තු එන පෙරමඟ සැඟවී සිට සිය කඩුව ඔහුගේ ගෙල හරහා දිගු කළේ ය. ඒ අවස්ථාවේ දී වේගයෙන් අශ්වයා පන්නාගෙන ආ දීඝ ජන්තුගේ හිස කැපී අවාසනාවන්ත ලෙසින් බිම පතිත විය. වේළුසුමන යෝධයා එම හිස ද සිය කඩුවෙහි ම අමුණාගෙන රුහුණු රට බලා අසු මෙහෙයවී ය.

දස මසක් ඇවෑමෙන් විහාර මහ දේවිය කුළුඳුලේ පින්වත් කුමාරයෙක් බිහි කළා ය. කුමාරයාට නම් තබන දිනයේ තමන්ගේ පියතුමා ගේ නම වූ "අභය" කොටසත්, මාගම තමන්ගේ නායකත්වයේ පැවතීම සංකේතවත් කිරීම උදෙසා "ගාමිණී" යන්නත් එකතු කොට කුමාරයාට "ගාමණී අභය" නමින් නම් තැබිය. එහෙත් මේ කුමරා ප්‍රසිද්ධ වන්නේ "දුටුගැමුණු" යන නාමයෙනි.

නම් තැබූ දිනයෙන් වසරකට පමණ පසු දේවියට තවත් පුතෙක් ලැබිණ. ඒ කුමාරයා ගැබ් ගත් අවස්ථාවේ දී ද දේවියට දෙළ දුකක් ඇති විය. ඒ, හොඳින් මල් පිපුණු සපු ගසක් සමීපයෙහි අලංකාර යහනක වැතිරී මල් සුවඳ විඳිමට ය. කාවන්තිස්ස රජතුමා ඒ ආශාවත් සැපිරීය. විහාර මහා දේවියට දෙවැනි වර ලැබුණු පුත් කුමරුට නම් තැබූවේ "තිස්ස" නමිනි. එහෙත් කුමරු ප්‍රසිද්ධ වූයේ "සද්ධාතිස්ස" යන නමිනි.



දීපා පෙරේරා

සිරි සදහම් පැන විසඳුම්

සතර පෝදාට ම පිදෙන බුදුසරණ පුවත්පතෙහි පළවන දහම් ලිපියකින් සැකසෙන ප්‍රශ්නයට නිවැරැදි පිළිතුර ලියා එවා ගුණසේන සහ සමාගමෙන් පිරුවානා පොත් වහන්සේ නම් යුත් "මහ පිරිත් පොත් වහන්සේ "හිමිකර ගන්න.

සතිපතා ජයග්‍රාහකයින් පස් දෙනෙකුට ත්‍යාග තිළිණ කෙරේ

බුදුසරණ

සතියේ ප්‍රශ්නය - 62

චීවර මාසය ඇරඹෙන පෝය නම් කරන්න

ඔබේ පිළිතුර පහත සඳහන් ලිපිනයට යොමු කරන්න.

පිළිතුර : ..................

නම : ..................

නිවසේ ලිපිනය : ..................

..................

දුරකතන අංකය : ..................

ඇම්. ඩී. ගුණසේන - බුදුසරණ සිරි සදහම් පැන විසඳුම් , බුදුසරණ පුවත්පත, ලේක්හවුස්, කොළඹ 10



# වෙසක් පෝදා නිවාඩුව ලොවට ම ගෙන ගිය සාම නියෝජිතයා



**ඒ 1963 වසරයි. එවකට දකුණු වියට්නාමය පාලනය කළේ ජනාධිපති නගෝ ඩින්හ් ඩියැම් (Ngo Dinh Diem). එරට තුළ බෞද්ධාගමික සංහාරයක් සිදු කරන බවට ඔහුට චෝදනා එල්ල වෙනවා.**

විශේෂයෙන් ම එය බෞද්ධ – කතෝලික ආගමික අරගලයක් ලෙසයි අන්තර්ජාතික ප්‍රජාව අතර මතයක් හට ගත්තේ. ලෝකයේ ප්‍රධාන බෞද්ධ රටවල් ලෙස සැලකෙන සියමය (තායිලන්තය), බුරුමය (මියන්මාරය) කාම්බෝජය, ශ්‍රී ලංකාව ඇතුළු රටවල් රැසකින් ඒ වෙනුවෙන් හඬ නැගෙනවා. ඒ ගැන විමර්ශනයට කොමිසමක් පත් කෙරෙන්නේ ඇම්නෙස්ටි ඉන්ටර්නැෂනල් ආයතනයෙන්. කොමිසමේ කොමසාරිස්වරයා වූයේ ලක්ෂමන් කදිරගාමර් නම් ශ්‍රී ලාංකිකයෙක්. ඔහු එහි දී කළ විමර්ශනයෙන් අනතුරු ව එළැඹි නිගමනයන් හා නිර්දේශ වියට්නාම පාලනයට ඉවත දමන්නට නොහැකි වුණේ ඒ නිර්දේශ එතරම් ම මානුෂීය බවකින් යුක්ත වූ නිසයි. ආගමක් ඇදහීමට ඉඩ ලබා දීම ජීවත් වන්නට ඉඩ ලබා දෙන්නක් බව ඔහු එදා පෙන්වා දුන්නා. මේ මඟින් පෙන්වන තවත් කරුණක් වන්නේ, සර්ව ආගමික නියෝජන හැකියාවක් ඔහු තුළ තිබූ බව අන්තර්ජාතික ප්‍රජාව ද දැන සිටි බවයි.

එයින් බොහෝ රටවල් තුළ ලක්ෂ්මන් කදිරගාමර් වන නමට විශාල පිළිගැනීමක් ද ඇති වුණා. එයින් වසර 36කට පසුව ඔහුගේ නම යළිත් අන්තර්ජාතික ප්‍රජාව අතර ඇඩි ලෙස කතාබහට ලක් වුණා.

ඒ, ශ්‍රී ලංකා රජයේ විදේශ අමාත්‍යවරයා ලෙස ලක්ෂ්මන් කදිරගාමර් මහතා කටයුතු කළ සමයේ ඔහු විසින් ඉදිරිපත් කළ 554/115 දරණ යෝජනාවට අනුව එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලය විසින් 1999 වසරේදී වෙසක් පුන් පොහෝ දිනය අන්තර්ජාතික නිවාඩු දිනයක් බවට ඒකමතික ව සම්මත කිරීම නිසයි. ඒ අනුව වර්තමානයේ වෙසක් පුන් පොහෝ දිනය, එක්සත් ජාතීන්ගේ සැමරුම් දිනයක් ලෙසට පිළිගන්නවා.

ලක්ෂ්මන් කදිරගාමර් බෞද්ධයකු නොවී, බෞද්ධයන්ගේ ශාස්තෘවරයාණන් වහන්සේ වෙනුවෙන් කළ ඉල්ලීම ගැන අන්තර්ජාතික ප්‍රජාවේ වැඩි පිළිගැනීමක් ඇතිවූයේ ඔහු විසින් බුදු දහම ආගමකටත් වඩා ජීවන ප්‍රතිපදාවක් බවට කළ හෙළිදරව්ව නිසයි.

'බුදු දහම කියන්නේ ආගමක් නොව ජීවන ප්‍රතිපදාවක්' යනුවෙන් ඔහු වරක් අප පුවත්පතකට සම්මුඛ සාකච්ඡාවක් ලබා දෙමින් පැවසුවා. පංච ශීලය ආරක්ෂා කරනවා නම් අපිට ගෙවල්වල දොරවල් වහල තියන්න අවශ්‍ය නැහැ. ඒ වගේ ම කාන්තාවකට ඕනෑම වෙලාවක තනිව ම යන්න එන්න පුළුවන්. සමාජයේ තියෙන ලොකුම ප්‍රශ්න දෙකකට එයින් විසඳුම් ලැබෙනවා නේද? ඒකට ආගමක් අවශ්‍ය වන්නේ නැහැ. ඒ නිසා මම දකින්නේ බුදු දහම කියන්නේ ආගමකට වඩා අපට ජීවත් වෙන්න බුදු හාමුදුරුවන් කියා දුන්න මාර්ගයක්' ඔහු ඒ සාකච්ඡාව ලබා දුන්නේ අන්තර්ජාතික වෙසක් දිනය සම්බන්ධවයි.

කදිරගාමර් මහතා සේවය කළ කාර්යාල කාමරයේ බිත්ති හතරේ බුද්ධ ප්‍රතිමාවක්, හින්දු දේවරූපයක්, ක්‍රිස්තුන් වහන්සේගේ ඡායාරූපයක් හා මක්කම ශුද්ධ වූ දේවස්ථානයේ ඡායාරූපයක් ද එල්ලා තිබීම බොහෝ දෙනෙක් නොදන්නා කරුණක් වන්නට පුළුවන්.

කිතුනුවකු ව උපත ලැබූ ඔහු බුදු දහමින් හා හින්දු දහමින් පෝෂණය වී සැම ආගමක ම උගන්වන ඉවසීම හා මානව දයාව පදනම් වූ සර්ව ආගමික නියෝජනයේ සංකේතයක් ලෙස හඳුන්වා දෙන්නට පුළුවන්.

පාසල් අධ්‍යාපනයෙන් පසුව ලංකා සරසවියට ඇතුළු වී නීති උපාධිය ලබා ගන්නා ඔහු 1955 වසරේදී අධි නීතිඥයකු ලෙස දිවුරුම් දෙනවා.

කදිරගාමර්ට ඔක්ස්ෆර්ඩ් විශ්වවිද්‍යාලයට ඇතුළත් වීමට ශිෂ්‍යත්වයක් ලැබෙන්නේ ඒ අතරයි. ඔහු 1959 දී ඔක්ස්ෆර්ඩ් ශිෂ්‍ය සංගමයේ සභාපතිවරයා බවට පත් වෙනවා. ඒ ඔක්ස්ෆර්ඩ් ශිෂ්‍ය සංගමයේ සභාපතිවරයා බවට පත් වූ දෙවන ශ්‍රී ලාංකිකයා වෙමින්. 1959 බැරිස්ටර්වරයකු ලෙස ලන්ඩනයේ සේවය කිරීමට ද ඔහුට අවස්ථාවක් ලැබෙනවා.

ශ්‍රී ලංකාවේ සේවයට පැමිණි ඔහු යළිත් 1971 ජනතා විමුක්ති පෙරමුණේ කැරලි සමයේ නැවතත් ලන්ඩනය බලා යනවා. 1976 දී ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ උපදේශකයකු ලෙස තේරී පත් වන ඔහු 1983 වසරේදී එම ආයතනයේ ආසියා පැසිෆික් අධ්‍යක්ෂ වරයා ලෙස පත්වෙනවා.

1988 වසරේ ඔහු යළිත් මෙරටට පැමිණෙන්නේ උපන් බිමට සේවය කිරීම සඳහායි. 1988/89 සමයේ උතුරේ හා දකුණේ සන්නද්ධ කණ්ඩායම්වල ප්‍රචණ්ඩත්වය ද, එවකට පැවති ආණ්ඩුවේ සාහසික මර්දනය ද ඔහු හෙළාදුටුවා. 1991 වසරේදී ඔහු ජනාධිපති නීතිඥවරයකු ලෙස දිවුරුම් දෙනවා.

ධනවත් පෙළැන්තියකින් පැවත එන ඔහු දේශපාලනයට පිවිසෙන්නේ උතුරේ යුද්ධය නිමා කිරීමේ අරමුණින්. 2001 වසර වන තුරු විදේශ ඇමතිවරයා ලෙස සේවය කළ ඔහු, කරන ලද ප්‍රධානතම කාර්යය වන්නේ එල්ටීටීඊ සංවිධානය අන්තර්ජාතික වශයෙන් තහනම් කිරීමට අවශ්‍ය පියවර ගැනීම යි. ඒ අනුව අමෙරිකාව හා බ්‍රිතාන්‍ය විසින් එල්ටීටීඊ සංවිධානය තහනම් ත්‍රස්ත සංවිධානයක් බවට පත් කරන්නේ 1997 හා 2001 යන වසරවල දී. මීට අමතර ව බොහෝ යුරෝපියානු රටවල එල්ටීටීඊ සංවිධානය තහනම් වන්නේත් ලක්ෂ්මන් කදිරගාමර්ගේ කරුණු දැක්වීම් මත යි.

සටන් විරාම කඩ කරන එල්ටීටීඊ සංවිධානය හා ඊට මැදිහත් වෙන නෝර්වේ රාජ්‍ය ද ලක්ෂ්මන් කදිරගාමර්ගේ දැඩි විවේචනයට පාත්‍ර වෙනවා. 2004 වසරේදී එක්සත් ජනතා නිදහස් සන්ධානය මහා මැතිවරණයේ ජයග්‍රහණයෙන් පසුව ලක්ෂ්මන් කදිරගාමර් අග්‍රාමාත්‍ය ධූරයට නිර්දේශ වෙනවා.

ලක්ෂමන් කදිර්ගාමර් මහතා කොළඹ පදිංචි ව සිටියදී නිතරම කොළඹ 07 ශ්‍රී සම්බෝධි විහාරයට ගියා. කිසිවිටෙක ඔහු අත් දෙක වනමින් ගියේ නැහැ. එහි විහාරාධිපති ව වැඩ විසූ දරණාගම කුසලධම්ම හිමියන් හමුවී විවිධ බොහෝ දේ ගැන ඔහු කතා කළා. කදිරගාමර් මහතා සිය නිවසේ දී පවා බෞද්ධාගමික කටයුතුවල නිරත වුණා. ඒ බව දන්නේ කිහිප දෙනයි. ඔහු එය කිසිවිටක ප්‍රසිද්ධියට කළේ නැහැ. බොහෝ විට සම්බෝධි විහාරයේ භික්ෂූන් වහන්සේ ඔහුගේ නිවසේ ආගමික කටයුතුවලට වැඩම කළා. භික්ෂූන් වහන්සේට නිසි ලෙසින් වන්දනා කරන්නට ඔහු කිසිවිටක අමතක කෙළේ නැහැ.

බුද්ධ රූපයට අවමන් වන ආකාරයේ සිදුවීම් රටතුළ සිදු වන විට ඊට විරුද්ධ ව ශ්‍රේෂ්ඨාධිකරණයේ පාර්ශ්ව කරුවෙක් වෙමින් නඩු පවරන්නත් ලක්ෂමන් කදිර්ගාමර් කටයුතු කළා.


ඉතිරිය 34 පිටුවට ...

**තාරක වික්‍රමසේකර**

# උත්තරීතර පතිදමක ගුණ වරුණ තිළිණ කළ මාහැඟි ජන කාව්‍යය

# යශෝදරාවත

**බුදුන් වහන්සේගේ අතීත භවයන් විවරණය කෙරෙන බෝධිසත්ව කතා, බුදුගුණ නිරූපණය කෙරෙන කතා සහ බුද්ධ චරිතය ඔස්සේ ගොඩ නැඟුණු සාහිත්‍යයක් ලෝකයේ බුදු දහම ඇති සෑම රටක ම දක්නට ලැබෙනවා. ශ්‍රී ලංකාවේ සන්දේශ සහ හටන් කවි හැරුණු කොට ඉතිරි සියලු සාහිත්‍යාංග බුදු සමයෙන් පෝෂණය වූ බව කිව හැකි යි. අප ජීවත් වන සමාජයේ පවතින අර්බුද, දුබලකම්, දුර්ගුණ නිරූපණය කර ඒ අනුව මනුෂ්‍ය ජීවිතය සකස් කිරීම සාහිත්‍යයෙන් සිදුවෙනවා. විශේෂයෙන් බෞද්ධ සාහිත්‍යයේ අරමුණ මිනිසාට යහමඟ පෙන්වීම යි.**



එම්. සාර්ලිස් චිත්‍ර ශිල්පියාගේ සිතුවමකි

අමාවතුර, සද්ධර්මරත්නාවලිය, ලෝවැඩ සඟරාව, ලෝකෝපකාරය, සුභාෂිතය, සිරිත් මල්දම, බුදුගුණ අලංකාරය, ගුත්තිල කාව්‍ය, සද්ධර්මාලංකාරය, පූජාවලිය, පන්සිය පණස් ජාතක පොත ආදී උපදේශාත්මක බෞද්ධ සාහිත්‍ය බිහි වුණේ සමාජීය අවශ්‍යතා පදනම් කරගෙන යි . තම තමන්ගේ චරිතවල ඇති අඩුපාඩු සකසාගෙන කුසලයට නැඹුරු විය හැකි මෙම කෘති ලාංකිකයන් තම ජීවිතය යහමඟට ගැනීම සඳහා පරිහරණය කළා. ලජ්ජා බිය ඇති ව, ශික්ෂණය ඇතිකර ගැනීම බෞද්ධ සාහිත්‍යයෙන් ඉටු වූ මෙහෙය යි.

මහනුවර යුගයේ ලියැවුණු කෘතියක් බවට බොහෝ දෙනා විශ්වාස කරන යශෝදරාවත කාව්‍ය බොහෝ සේ වටිනා කෘතියක් ලෙස හඳුනාගත හැකියි. එම කෘතියෙහි සඳහන් ව පවතින පති භක්තියෙහි ඇති වටිනාකම සමස්ත කාන්තා පරපුරට ම ආදර්ශවත් බවක් එක් කරයි. යශෝදරා දේවියගේ චරිතයේ වැදගත් අවස්ථා ඒකරාශී කොට ධර්ම ගෞරවය ගොඩනැගෙන පරිදි සංවේදී බව ආරක්ෂා කර ගනිමින් රචනා කර ඇත. සම්මා සම්බුද්ධත්වය තරම් මිනිසත්බව දියුණු කර ගත් කිසිදු පදවියක් ඇත්තේ නැත. අධ්‍යාත්මික ව සාරා සංඛ්‍ය කල්ප ලක්ෂයක් පාරමී දම් පුරා කරන ලද මහා පරිත්‍යාගවල, පුහුණු කිරීම්වල, අත්දැකීම්වල මහා දැනුම් සම්භාරයක ප්‍රතිපලය පරම පූජනීය වූ සම්මා සම්බුද්ධත්වය යි.

උත්තරීතර බුද්ධත්වය ලබන උතුමකුට සංසාරය පුරාවට ඒ වෙනුවෙන් ධෛර්යය දෙමින් ළඟින් සිට අපමණ දුක සැප බෙදා ගනිමින් ස්ත්‍රියක සිටියේ නම්, ඒ එකම කාන්තා රත්නය යශෝදරාව යි. බුදුබව පතනා සිදුහත් බෝසතාණන් වහන්සේ දීපංකර බුදුරජාණන් වහන්සේගේ පාද මූලයෙහි නියත විවරණ ලබා ගත් දිනයේ සිට සංසාරය පුරා උප උපන් හැම ආත්මයක දී ම ඒ උතුම් කාර්යභාරය සඳහා ම කැප වූ එකම කාන්තා රත්නය යි. පාරමී දම් පුරණ උතුමන් වෙනුවෙන් සහකාරිය වන්නට සසර පුරා කැප වන්නට යශෝදරාවෝ පාරමී පුරා තිබෙන ආකාරය ජාතක කතා තුළින් පැහැදිලි වේ. ඕ තොමෝ ඒ උතුම් කාර්යභාරය ඉෂ්ට කරන්නට යෙදුණේ මනුෂ්‍ය ආත්ම භාවයක උප්පත්තිය ලැබූ කාලයේ පමණක් නොව, බෝසතාණන් වහන්සේ තිරිසන් ආත්මවල උප්පත්තිය ලැබූ භවයන්හි ද යශෝදරාවෝ එම ආත්මයේ ම ඉපිද එම ජීවිතයට ධෛර්යය ලබා දුන් අයුරු සඳකිඳුරු ජාතකයෙන්, කලන්දක ජාතකයෙන් දැක ගත හැකියි.

කලන්දක ජාතකයේ දී ලෙහෙනියක ව ඉපදී දරුවන් සොයන්නට මුහුද ඉසින්නට බෝසත් ලේනා උත්සාහ කළ අවස්ථාවේ ලේනිය වී ඇය ධෛර්ය ලබාදුන්නී ය. බෝසතාණන් වහන්සේ ලෙහෙනකු ලෙසත්, යශෝදරාවෝ ලෙහෙනියක ලෙසත් ඉපදෙමින් එම ආත්මයේ දී බෝසතාණන් වහන්සේට ධෛර්යය දුන් ආකාරය, වීර්ය වඩපු ආකාරය කලන්දක ජාතකය පුරාම දැකගන්නට පුළුවන.

**උන්නෙමි අපි ඉපිද ලෙහෙනුන් කුලේ එදා**
**වැටුණේ ජලය මැද සමුදුරයේ බිළිඳා**
**දැනුණේ කරපු වීරිය ගොඩගන්නට එදා**
**හිමි රජුනේ මග ඇරියේ මන්ද මෙදා**

සඳකිඳුරු ජාතකයේ දී ද අප මහ බෝසතාණන් වහන්සේ සඳ කිඳුරා ලෙසත්, යශෝදරාවෝ සඳ කිඳුරිය ලෙසත් ජීවත් වූ ආත්මභාවයේ දී කිඳුරිය ලබා ගැනීම සඳහා දුෂ්ට රජකු සඳකිඳුරාට හී පහර විදි අවස්ථාවේ දී කිඳුරිය බෝසත් කිඳුරා කන්දක් උඩට ගෙන ගොස් සත්‍යක්‍රියා කරමින් සුවපත් කළා ය. වෙස්සන්තර ජාතකයෙහි සඳහන් ආකාරයට වනගත වන ගමනේ දී තනිවම වනගතවීමට ඉඩ නොදී තවුස් ජීවිතයට අවශ්‍ය පරිසරය නිර්මාණය කරදීමට මද්‍රි දේවිය ද රජතුමා අත නොහැර ම කැළයට ගොස් බෝසතාණන් වහන්සේට අවශ්‍ය පලවැල රැගෙනවිත් පෝෂණය කරමින් අවශ්‍ය පහසුකම් ලබා දෙමින් රැකවරණය ලබා දීමට පසුපසින් ම පැමිණියා ය. යශෝදරාවෝ අතීත භවයන්හි ගත කළ ජීවිතය පිළිබඳ විස්තර ජාතක කතා පොතේ අප්‍රමාණ ජාතක කතා ප්‍රමාණයක සඳහන් වේ. එවැනි සුවිශේෂී ශ්‍රේෂ්ඨ චරිතයක් බෝසතාණන් වහන්සේට යශෝදරාව ලෙසින් හමුවෙයි. සිද්ධාර්ථ කුමරා අවුරුදු දහතුනක කාලයක් යශෝදරාව සමඟ යුග ජීවිතය ගෙවන කාලය පුරාවට ඇය ද සිදුහත් බෝසතාණන් වහන්සේ ගේ ගමනට අවශ්‍ය පසුබිම නිර්මාණය කළා ය. ඇය කිසිවිටෙකවත් සිදුහත් කුමරා ගිහි ගෙය තුළ රඳවා තබා ගැනීමට උපක්‍රම යෙදුවේ නැත. සිදුහත් කුමරා අභිනිෂ්ක්‍රමණය කළ අවස්ථාවන් වැළැක්වීමට අවශ්‍ය උපක්‍රම සංවිධානය කළේ නැත. ඒ වගේ ම සිදුහත් කුමරා යන ගමන්බිමන් සොයා බලමින් මංපෙත් අවහිර කළේ නැත. සිද්ධාර්ථ කුමරා සුවිශේෂී උතුම් පුද්ගලයකු බව අවබෝධයෙන් යුග ජීවිතය තුළදී පවා යශෝදරාවගේ හැසිරීම තුළින් දක්නට ලැබුණ ලක්ෂණ විය.

සිද්ධාර්ථ කුමරා තුළ මහා පුරුෂ ලක්ෂණ තිබුණ බවත්, එම සියල්ල ම හොඳින් නිරීක්ෂණය කළ එකම කාන්තා රත්නය යශෝදරාව යි. මේ ලෝකයේ අසහාය මනුෂ්‍යයකු බවත්, අසහාය පුරුෂයකු බවත්, යශෝදරාවෝ දැන සිටි කාරණය යි. එබඳු උතුම් මිනිසකු ගිහි දිවියේ තබා ගැනීමට කවරාකාරයක හෝ ප්‍රයත්නයක යෙදුණ බවට යශෝදරාවන්ගේ චරිත කතා ප්‍රවෘත්තීන්හි කිසිදු ස්ථානයක හමුවන්නේ නැත. ලොව්තුරා බුදුරජාණන් වහන්සේ ලෙස බුද්ධත්වය ලබා මහා මාලිගාවට වැඩම කළ අවස්ථාවේ සියලු සිහිපත් කිරීම් කරනු ලැබුවේ තමන්ගේ ගමනට යශෝදරාවන්ගෙන් ලැබුණ ධෛර්යය හා කැපවීමයි. මේ ලෝකයේ ස්වාමිපුරුෂයකුට භාර්යාවක විසින් ලබා දුන් ධෛර්යය සහයෝගය පමණක් නොවෙයි, මේ ලෝකයේ උතුම් මහා ශ්‍රේෂ්ඨ උතුමකු නිර්මාණය කිරීමට කාන්තාවක විසින් ලබා දුන් මහා වීර්යයක් හැටියට එය සැලකිය හැකියි.

බෝසතාණන් වහන්සේ අභිනිෂ්ක්‍රමණය කළාට පසුව ද, යශෝදරාවෝ ගත කළ ශ්‍රේෂ්ඨ උතුම් ජීවිතය යශෝදරාවත කාව්‍යයෙහි උපදේශාත්මක ලෙස විග්‍රහ කර ඇත. යශෝදරාවෝ කිසි විටෙකවත් හඬා වැටුණේ නැත. වර්තමාන අම්මා කෙනකු දරුවෙක් සමඟ තනි වූ විට කෙතරම් අපහසුතාවයකට පත්විය හැකි ද? ඒ අම්මා වෛර කරන්නේ නැද්ද? දරුවාට හිමිකම් ඉල්ලා යුක්තිය පසඳලීමට අධිකරණය වෙත යන්නේ නැද්ද? වර්තමානයෙහි දරුවකු සමඟ තනි වූ අම්මා කෙනකු විසින් සිදුකරනු ලබන කිසිවක් සිදුකිරීමට යශෝදරාවෝ පෙළ ඹුණේ නැත. ඇය එම ජීවිතයට මුහුණ දුන්නා ය. සිදුහත් කුමරා කෙරෙහි තිබූ අප්‍රමාණ භක්තිය හා ගෞරවය නිසා ම කුමරා ගියේ කොහේ ද ? කුමන ස්ථානයකට ගියා ද? කවුරුන් සමඟ ගියා ද? කෙසේ ගියා ද? යන කරුණු කාරණා පිළිබඳ බොහොම ගෞරවයෙන් ආදරණීය ව ළෙන්ගතුව විමසා බැලීමට කාරුණික වෙයි.


**හිමයේ ගොසින් මල් යහනක නිදනවද**
**කොමළ අනගි සිරිපා දෙක රිදෙනවද**
**හිගේ නැතිව දෙවියෝ මුර කරනවද**
**මගේ ඇත් රජුනි හිමි අද කොතැනකද**

**කැලේ තිබෙන කොයි දේවත් රසවේවා**
**මලේ බඹරු මෙන් පිරිවර ඇතිවේවා**
**අව්වේ තිබෙන රැස් මාලා අඩුවේවා**
**ගව්වෙන් ගව්වදිව මාළිග සෑදේවා**

ඉතිරිය 34 පිටුවට ...

**හේමමාලා රන්දුනු**

## ධම්මපදය - මිරිස්සේ ධම්මික නාහිමි




භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ විසින් විවිධ අවස්ථාවන්හිදී විවිධ පුද්ගලයන් අරභයා දේශනා කරන ලද උතුම් වූ ගාථා රත්නයන් ධම්මපදයෙහි අඩංගුව තිබේ.

බුදුරජාණන් වහන්සේගේ පිරිනිවීමෙන් තෙමසක් ඇවෑමෙන් රජගහනුවර ගිජුකුළුපව්ව පාමුල දී පළමු ධර්ම සංගායනාව පැවැත්විණි. මහා කාශ්‍යප මහ රහතන් වහන්සේගේ ප්‍රධානත්වයෙන් පන්සිය නමක් වූ සංගීතිකාරක මහ රහතන් වහන්සේලා දේශිත ශ්‍රී සද්ධර්මය සූත්‍ර, විනය සහ අභිධර්මය නම්පිටක තුනකට බෙදන ලදහ.

සූත්‍ර පිටකයට දීඝ නිකාය, මජ්ඣිම නිකාය, අංගුත්තර නිකාය, සංයුත්ත නිකාය සහ ඛුද්දක නිකාය නම් ග්‍රන්ථ පහකි. ඛුද්දක නිකායට පොත් 15 ක් ඇතුළත් වූ අතර ධම්මපදය ද ඉන් එකකි. ධම්මපදය වග්ග විසි හයක් වන අතර ගාථාවෝ 423 කින් සමන්විත ය.

බුදුරජාණන් වහන්සේ විසින් විවිධ අවස්ථාවල විවිධ පුද්ගලයන් උදෙසා දේශනා කරන ලද ධර්මය, අවවාද, කර්මස්ථාන ආදී විරාගී අමා දහම ඉතාමත් සුගම ලෙස ගලපා වග්ගවලට ඇතුළත් කොට ඇත. නිදසුනක් ලෙස දෙවන වග්ගය වන අප්පමාද වග්ගයේදී කුසලයට යොමු නොවීම නම් වූ ප්‍රමාදය දක්වා ප්‍රමාදයේ ඇති අනිටු විපාකත් කුසලයට යොමු වීම නම් වූ අප්‍රමාදයේ ඇති උතුම් බව සහ එහි යහඵලයත් විස්තර කොට දක්වා තිබේ. මේ ලෙස සෑම වග්ගයක ම ඇත්තේ මනා වූ සාරවත් බවකි. රාගාදී කෙලෙස් නොවඩන නිරාමිස ප්‍රීතියෙන් සිත සුවපත් කරන අමා රසයකි.

බත්තරමුල්ල සිරි සුදස්සනාරාම සදහම් සෙනසුනේ ප්‍රධාන අනුශාසක මිරිස්සේ ධම්මික නාහිමියන් විසින් මේ උතුම් ධම්මපද ග්‍රන්ථය පාළි, සිංහල හා ඉංග්‍රීසි භාෂා ත්‍රිත්වයෙන් ම යුතුව ඉතා සරල ලෙසින් අවබෝධයට පහසු අයුරින් සම්පාදනය කොට ඇත.

මේ ග්‍රන්ථය සම්පාදනයෙන් නාහිමියන්ගේ බලාපොරොත්තුව ඉඩ ලද සෑම අවස්ථාවකදී ම එක්වරකට එක ගාථා රත්නයක් හෝ කියවා තේරුම් ගෙන, අවබෝධයෙන් යුතුව ම තම ජීවිතයට ද, පරිසරයට ද, සමාජයට ද ගලපා ගෙන විමසා බලනු දැකීම ය.

**දීපා පෙරේරා**

## බෞද්ධාලෝක පදනමෙන් තරුණ යුවළකට නිවසක්



බෞද්ධාලෝක පදනම මඟින් මුලතිව් දිස්ත්‍රික්කය කේන්ද්‍ර කර ගනිමින් සමාජ සුභ සාධන ව්‍යාපෘතිය යටතේ සිලාවත්තේ ස්ථිර වාසස්ථානයක් නොමැතිව සිටි ලක්ෂිකන් වාස් තරුණ යුවලට නිවහනක් තැනීමට අගෝස්තු මස මුල්ගල් තැබූ අතර එහි වැඩ අවසන් කොට 72 වැනි ශ්‍රී ලංකා යුධ හමුදා දිනයට සමගාමීව 2021.10.10 වනදින බෞද්ධාලෝක පදනමේ නිර්මාතෘ සහ පදනමේ සභාපති ජගත් සමුතිපාල මැතිතුමා විසින් එම නිවස නිවාසලාභීයා වෙත පරිත්‍යාග කරන ලදී. මෙම අවස්ථාවට බෞද්ධාලෝක පදනමේ අධ්‍යක්ෂිකා සමන්තා සුමතිපාල මැතිණිය, මහාචාර්ය මාලිංග අමරසිංහ මහතා ඇතුළු බෞද්ධාලෝක පදනමේ නිලධාරින්, 59 වැනි පාබල සේනාංකාධිපති මේජර් ජනරාල් සූරිය බණ්ඩාර මහතා, 24 වන බලඇණිය ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුවේ හිටපු 5 වන අණදෙන නිලධාරී ලුතිතන් කර්නල් රුවන් රුද්‍රිගු මහතා, 24 වන බලඇණිය ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුවේ වත්මන් අණදෙන නිලධාරී මේජර් සම්පත් නල්ලපෙරුම මහතා ඇතුළු මුලතිව් ආරක්ෂක බලසේනාවන්ට අයත් යුධ හමුදා නිලධාරීන් සහභාගී විය. මෙම ව්‍යාපෘතිය සඳහා සම්බන්ධීකරණය සහ ශ්‍රම දායකත්වය මුලතිව් අලම්පිල් හි පිහිටි 24 වන බලඇණිය ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුව විසින් සිදු කරන ලදී.

**මහේෂ් සේනාධීර**

## පෝය ලබන සහ ගෙවෙන අයුරු

| වප් පුර පසළොස්වක | වප් අව අටවක |
|---|---|
| ඔක්. 19 අඟහරුවාදා අපර භාග 19.03 වප් පුර පසළොස්වක ලබා 20 බදාදා අපර භාග 20.26 ගෙවේ බදාදා සිල් | ඔක්. 28 බ්‍රහස්පතින්දා අපර භාග 12.49 අව අටවක ලබා 29 සිකුරා දා අපර භාග 14.09 ගෙවේ බ්‍රහස්පතින්දා සිල් |

## පිහිට පතයි

අක්මා රෝගයෙන් ඉතා අසාධ්‍ය තත්වයේ සිටින සිය මවට o+ (ඕ පොසිටිව්) හෝ A+ (ඒ පොසිටිව්)වර්ගයේ අක්මාවකින් 30%ක ප්‍රමාණයක් ඉතා මණින් අවශ්‍ය වී ඇති බව කියයි. පරිත්‍යාග කිරීමට කැමැති වයස අවුරුදු 25-50 අතර පින්වත් පරිත්‍යාගශීලියකු වේ නම් හැකි විගස 0769968498 හෝ 0770490799 දූරකථන අංකයන්ට දන්වන මෙන් ඉල්ලා සිටියි. පරිත්‍යාග කළ අයගේ එම ඉන්ද්‍රිය නැවත යතා තත්වයට පත්වන බව වෛද්‍ය නිර්දේශය වී ඇති බව ද කියයි.

---

අම්පාර, උහන, එකමුතුගම අංක 395/ ඒ දරණ ලිපිනයේ පදිංචි ආර්. කේ. සුනිල් රත්නායක දරුණු වකුගඩු රෝගයකින් පෙළෙන බව කියයි. ඔහුට ඉක්මණින් ඒ හෝ B පොසිටිව් වර්ගයේ වකුගඩුවක් බද්ධ කළ යුතු බව වෛද්‍ය නිර්දේශය වී ඇති බව ද කියයි. ඒ සඳහා පරිත්‍යාගශීලියකු වේ නම් දුරකතන 0779825297 අංකයට දැනුම් දෙන ලෙස ද, ඉල්ලීමක් කරයි.

---

දරුණු වකුගඩු රෝගයකින් පෙළෙන විසි හැවිරිදි පුතුට හැකි ඉක්මනින් O+ (ඕ පොසිටිව්) වර්ගයේ වකුගඩුවක් බද්ධ කළ යුතු බව වෛද්‍ය නිර්දේශය වී ඇති බව කියයි. මේ ශල්‍යකර්මයට ඉතා විශාල මුදලක් වැය වන බව ද පවසයි. පියාණන් ද නැතිව මේ දක්වා උස්මහත් කරගත් තම පුතුගේ ජීවිතය බේරා ගැනීමට උපකාරී වන්නැයි මව පින්වත් ඔබගෙන් බැගෑපත්ව ඉල්ලා සිටින බව කියයි. 'ඕ පොසිටිව්' වර්ගයේ නීරෝගී වකුගඩුවක් ප්‍රදානය කළ හැකි දාන පාරමිතා පුරන්නකු සහ සැත්කමට වැය වන මුදල සපුරාගැනීමට උපකාරී විය හැකි අය වේ නම් 076-8544209 (මව) අමතන ලෙස ඉල්ලා සිටින බව කියයි. පරිත්‍යාග: සම්පත් බැංකුව, දෙහිවල ශාඛාව, කේ.සී. විතාරණ, 101750151141 දරන ගිණුමට බැර කළ හැකි බව ද කියයි.

---

කොළඹ කොටහේන පදිංචි වයස අවුරුදු 65ක් වන වී. ධනබාලසිංහ යන අය දරුණු වකුගඩු රෝගයකින් පෙළෙන බව කියයි. ඔහුට ඉතා ඉක්මණින් ඕ පොසිටිව් හෝ ඕ නෙගටිව් වර්ගයේ වකුගඩුවක් අවශ්‍ය වන බව වෛද්‍ය නිර්දේශය වන බව ද කියයි. පරිත්‍යාග ශීලියකු වේ නම් 0777125100 දූරකථනයට අමතන ලෙස ඉල්ලා සිටියි.

## කඨින පින්කම්

### සිරිසඟබෝ භාවනා මධ්‍යස්ථානය

අනුරාධපුර ඉසුරුමුනිය සිරිසඟබෝ භාවනා මධ්‍යාස්ථානයේ වාර්ෂික කඨින පින්කම මේ මස 20 සහ 21 දිනයන්හි ශාස්ත්‍රපති අලුත්ගම බෝගමුවේ සද්ධාරංසි නා හිමියන්ගේ අනුශාසනා මත කෑගල්ල රංවල පදිංචි ඩබ්.එස්. ඒ. විජේනායක මහතා සහ රේණුකා දමයන්ති මහත්මියගේ දායකත්වයෙන් සිදු කෙරේ.

### රජරට සිරි සම්බුද්ධ සීල භාවනා මධ්‍යස්ථානය

අනුරාධපුර දකුණු දාගැබ පාරේ පිහිටි රජරට සිරි සම්බුද්ධ සීල භාවනා මධ්‍යස්ථානයේ වාර්ෂික කඨින පින්කම නොවැම්බර් මස 3 සහ 4 දිනයන්හි ශාස්ත්‍රපති අලුත්ගම බෝගමුවේ සද්ධාරංසි නාහිමියන්ගේ අනුශාසනා පරිදි විහාරස්ථාන දායක දායිකාවන් විසින් සිදු කරනු ලබයි.

**සුනිල් ගුණවර්ධන - කුණ්ඩසාලේ සමූහ**

### සිරි සම්බෝධි ධර්මායතන

පල්ලෙකැලේ සිරි සම්බෝධි ධර්මායතන විහාරස්ථානයේ 21 වන වතාවට සිදු කරනු ලබන කඨින පින්කම් මහෝත්සවය මෙම මස 23-24 යන දිනයන් හීදී විහාරාධිපති පූජ්‍ය බුලංකුලමේ උපවංස ස්වාමීන් වහන්සේ ගේ අනුශාසකත්වයෙන් පැවැත්වේ.

23වනදින අටවිසි ගිලන්පස බුද්ධ පූජාව හා ධර්ම දේශනාවක් පැවැත්වෙන අතර 24 වනදින කඨින චීවර පූජාව පැවැත්වේ.

පල්ලෙකැලේ සසා නිවාස සංකීර්ණයේ සහ ප්‍රදේශවාසීන් ගේ දායකත්වයෙන් වසංගත නිවාරණයට අදාළ නීතිරීති අනුගමනය කරමින් මෙම පින්කම් මාලාව පැවැත්වීමට කටයුතු සම්පාදනය කර ඇත.

### මහාමායා විශ්ව ශාන්ති මහා විහාරය



ලුම්බිණිය කඨින චීවර පූජා මහෝත්සවය මෙම 25 වැනිදින පැවැත්වේ. ශ්‍රීමත් අනගාරික ධර්මපාල ශ්‍රීමතාණන්ගේ ශ්‍රී නාමයෙන් ගොඩනගන ලද නේපාලයේ ලුම්බිණිය මහා බෝධි සමාගමේ මහමායා විශ්ව ශාන්ති මහා විහාරයේ කඨින චීවර පූජෝත්සවය ඉන්දියානු මහා බෝධි සමාගමේ මහලේකම් භාරතයේ ප්‍රධාන සංඝනායක ශාස්ත්‍රපති පූජ්‍යපාද පැල්වත්තේ සීවලී නායක හිමිපාණන් වහන්සේගේ අනුශාසනා මත බද්දේගම නන්ද ස්වාමීන් ස්වාමීන් වහන්සේ, පදවිය වංගීස ස්වාමීන් වහන්සේ ඇතුළු ලුම්බිණී විහාර වාසි ආර්ය මහා සංඝරත්නය උදෙසා චීවර පූජාව මහා සඟසතු දානමය පින්කම පැවැත්වීමට කටයුතු සංවිධානය කොට ඇත. නිරූපා විලියම් මහත්මිය, මනෝජ් අල්ගම මහතා ඇතුළු දූ දරුවන්ගේ දායකත්වයෙන් පවතින කොරෝනා තත්ත්වය යටතේ සීමිත ජන සංඛ්‍යාවක් සමගින් පින්කම සංවිධානය කොට ඇත.



# තිස්ස කුමාරයා ප්‍රතිඥා බිඳ දමයි

**"මගේ මවගේ මිනීමරුවා. ඇගේ මව්පියන්ගේ මිනීමරුවා". සිරිනාග ඉතා තියුණු හඬින් මිත්‍රට ඇසෙන ලෙස කීවේ ය. මිත්‍ර ගෙල හරවා සිරිනාග දෙස බැලුවා පමණි. ඔහුගේ ගෙලට එල්ල වූ කඩු පහරින් කිසිදු හඬක් නොනඟා ම ඔහු කුටිය අභියස ඇද වැටුණේ ය. එම කඩුවෙන් ම තමාගේ උරහිසට පහරක් ගසාගත් සිරිනාග කෑ ගසාගෙන එළියට දිව්වේ ය. "කිසිවකුට පලා යන්නට ඉඩ දෙන්නට එපා. මිත්‍ර සෙනෙවිතුමාගේ කුටියේ සැඟ වී සිටි සතුරෙක් කඩුවෙන් කෙටුවා." කෑ ගසමින් සිරිනාග වැටුණේ ය.**

පුණ්ණා ද මව ද ශබ්දය ඇසී වහා එහි පැමිණියහ. නිල කාමරය අභියස මිත්‍රගේ හිස කඳින් වෙන් වන තරමට කැපී තිබිණි. ආලින්දයේ සිහි නැතිව වැටී සිටි සිරිනාගගේ උරහිසින් ලේ ගලමින් තිබිණි. ආරක්ෂක භටයෝ දිව ආ හ. ඝාතකයා අල්ලා ගන්නට නොහැකි විය. පුණ්ණා වෛද්‍යවරයා වහා කැඳවා සිරිනාගට ප්‍රතිකාර කරන්නට කටයුතු කෙරිණි.

"තුවාලය ටිකක් දරුණුයි. කම්පනයට සිහි නැති වෙලා. ආලින්දයේ වූ සෝපාවක සතපන ලද ඔහුට බෙහෙත් ගල්වා ප්‍රතිකාර කෙරිණි. ලේ වහනය වීම තදින් සිදු වූ නිසා සිහිය එන්නට හෝරාවක් පමණ ගතවිය. සමන්ති මාතාවත්, පුණ්ණා දියණියත් එතැනට ම වී සිටියහ.

ආරක්ෂක භටයෝ මන්දිරය තුළත්, ඉන් පිටතත් පරික්ෂා කළහ. සැඟවුණු කිසිවෙක් නොවීය. මහා මැදුරේ මුළුතැන් ගෙයට ආසන්නයේ බිත්තිය අසල දර කොට දෙකක් ද ඒ අසල ගෙවී ගිය මිරිවැඩි සඟලක් ද විය. බිත්තියේ වූ පා පහරවල් කිහිපය මිනීමරුවා එතැනින් පලාගිය බවට සලකුණු විය.

ලේ ගැලීම නවතා තුවාලයට බෙහෙත් බැඳ පියවි සිහිය ලබා දී රෝගියා නිවසට ගෙන ගොස් විවේකය ලබා දෙන ලෙසට වෛද්‍යවරයා නියම කළේ ය. එහෙත් සමන්ති මැණියන්ගේ අදහස වූයේ වෛද්‍යවරයා මේ මැදුරේ ම රැඳී සිටිමින් රෝගියා රැක බලා ගත යුතු බවයි.

දීඝජන්තු මහා සෙනෙවි ද පැමිණියේ ය. තවත් අඩ හෝරාවකින් පමණ එළාර මහා රජතුමා ද පැමිණියේ ය. සෙනෙවි මැදුර වටා ආරක්ෂාව තර කෙරිණි.

ආරක්ෂක සෙබළුන් නොමැති අවස්ථාවක් බලා, මිනීමරුවා මිත්‍ර සෙනෙවිතුමාගේ නිල කුටියට වැදී සැඟවී සිට, සෙනෙවිතුමා ඝාතනයට සැලසුම් කළ ද සිරිනාගගේ පැමිණීම නිසා එයට බාධා පැමිණියේ ය. රාත්‍රී භෝජනය සඳහා පිට වී යන මහ සෙනෙවිතුමාට ඔහුගේ කඩුවෙන් කෙටූ ඝාතකයා, සිරිනාග සෙනෙවිගෙන් බේරී පලායාම සඳහා එම කඩුවෙන් ම කොටා පිටුපස තාප්පයෙන් පැන පලා ගොස් ඇත. එහෙත් සැමගේ ම පුදුමයට හේතු වූයේ පලා ගිය තැන වූ මිරිවැඩි සඟල සුමන මහා සිටුතුමාගේ මිරිවැඩි සඟලක් බව හඳුනා ගැනීම ය.

සිරිනාග එන්නට ප්‍රමාද වූ නිසා තමන්ගේ මුර සෙබළුන් දෙදෙනකු සමග පැමිණි ජයනාථ සිටුතුමා සිදුව ඇති දෙය දැක පුදුමයට පත්විය. සිරිනාග ඒ වන විටත් ප්‍රකෘති සිහිය ලබා සිටි බැවින් තම නිවසට කැඳවාගෙන යාමට රජතුමාගේ අවසරය ලබා ගත හැකි විය. සිරිනාගගේ ඉල්ලීම මත වෛද්‍යවරයා ද තම අස්රියෙන් ම වෙද මැදුරට යැවීමට මහා සිටුතුමා එකඟ විය.

පසුදා අනුරාධපුරය පුරාම ප්‍රචාරය වූයේ කිසියම් සාහසිකයකු විසින් මිත්‍ර මහා සෙනෙවිතුමා මරා දමා සිරිනාග සෙනෙවිතුමාට ද තුවාල කර පලා ගොස් ඇති බව ය.

රාජ්‍ය ගෞරවය සහිත ව සිංහල මහා සෙන්පති මිත්‍රගේ ආදාහන කටයුතු රාජ්‍ය ගෞරවය සහිත ව සිදු කෙරිණි.

හිස් වූ සෙනෙවි තනතුරට යුද්ධ මණ්ඩලයේ අනුමැතියෙන් සිරිනාග පත් කරනු ලැබිණි.

යුද්ධ සම්මන්ත්‍රණ ශාලාවේ දුටුගැමුණු මහරජතුමා ද සහභාගී වන යුද්ධ මණ්ඩල රැස්වීම හවස යෙදී තිබියදී මහා සෙනෙවිවරු කිහිප දෙනෙක් රැස්වීම් ශාලාව අභියස සිට කතා කරමින් සිටියහ. මහත් අසහනයෙන් කතා බහ කරන ඔවුන්ට දැන ගන්නට ලැබුණේ රජතුමා මාළිගාවේ නැති බව ය.

"රජරට යටත් කර තුන් සිංහලය එක්සේසත් කිරීමේ සටන නැවතත් කල් දමන්නට සිදුවෙලා"

"අභ්‍යන්තර අරගල දිග් ගැහුණොත් අපේ සටන ආරම්භ කිරීම තවත් ප්‍රමාද වන්නට පුළුවන්."

"කඩොල් ඇතු දුටුගැමුණු රජතුමාට සිටි මංගල හස්ති රාජයා. විහාරමහා දේවිය සිටිය යුත්තේ මාගම. ඇය අපේ සටනේ උපදේශිකාවක්. ජාතියේ වීර මාතාව දිගාමඩුල්ලේ රඳවාගෙන සිටින්නට සද්ධාතිස්ස කුමාරයාට කිසිම අයිතියක් නැහැ."

"දුටුගැමුණු මහා රජතුමා මව් බිසවත්, කඩොල් ඇතුත් එවන ලෙසට දන්වා දූතයන් අත කිහිපවරක් ම හසුන්පත් යවා ඇතත් තිස්ස කුමාරයා ඒ ගැන තැකීමක් කර නැහැ. මේ නිසා දුටුගැමුණු රජතුමා කෝපයට පත්වෙලා."

මහා සෙනෙවිවරුන් තුළ ඇති අසහනයත්, කලකිරීමත් නිසා ම සේනාංක තුළ ඇතිවිය හැකි පසුබට වීමත් කාගේත් පසුතැවීමට හේතු වී ඇත. මේ අවස්ථාවේ දී ඉතාම සැලකිලිමත් ව කටයුතු කිරීමේ වැදගත්කම මහා සෙනෙවිවරු තේරුම් ගත්හ.

"තිස්ස කුමාරයාට රජතුමාගේ අසාධ්‍ය තත්ත්වය දන්වා යැවීමට කිසිවකුත් උනන්දු නොවුයේ ඇයි "

"අප වැඩි දෙනකු රජතුමාගේ අභාවය ගැන දැන ගත්තේ ආදාහන දවසේ ම යි. ඇතැම් අය දැනගත්තේ එයිනුත් දවස් කිහිපයකට පසුවයි."

"කාවන්තිස්ස රජතුමාගේ ආදාහන උත්සව කටයුතුවල මූලිකත්වය ගෙන කටයුතු කළ යුතු ව තිබුණේ දුටුගැමුණු රජතුමා යි. එතුමා නොසිටීමේ වාසිය ලබා ගන්නට තිස්ස කුමාරයා මෙහෙය වූයේ කවුරුන් ද?"

"දුටුගැමුණු කුමාරයා ගෙන්වා මාගම රාජ්‍ය භාර දී තමාට හිමි යුවරජ තනතුර ලබා ගෙන තිස්ස කුමාරයා දිගාමඩුල්ලට ගියා නම් කොපමණ අගේද? විහාර මහා දේවිය මෙහිදී කිසියම් පියවරක් නොගත්තේ ඇයි ?"

"කිසිවකුටත් හිතා ගන්නට බැරි වී තිබෙන ගැටලුවත් ඒකම තමයි. රජතුමා මියගිය පසුව විහාරමහා දේවිය ඉතාමත් දුකටත්, කලකිරීමටත් පත්ව සිටි බව සිතා ගන්නට පුළුවන්."

"තිස්ස කුමාරයා කිසිවකුටත් නොදන්වා රාජ සම්පත් සහිත ව මංගල හස්ති රාජයාත්, මව් බිසවුන් වහන්සේත් රැගෙන යාම අනියමින් මාගම රාජ්‍ය ලබා ගැනීමක් නොවේ ද?"

" දෙසොහොයුරන් ඔවුනොවුන් භේද නොවන බවට මහා සංඝයා ඉදිරියේ දිව්රුම් දී තිබියදීත් තිස්ස කුමාරයා කර ඇත්තේ එම ප්‍රතිඥාව බිඳීමක් නොවේද ?"

"ප්‍රතිඥාව බිඳලා . දැන් සූදානම් වෙන්නේ යුද්ධයකට. මෙය කාගේ හෝ මෙහෙයවීමක්."

"සෙනෙවිවරුන් අතර කතාබහ දිග්ගැස්සෙන්නේ ඔවුන් අතර ද මතභේද සහිතව යැයි නන්දිමිත්‍රට හැඟිණි. රජතුමාගේ පැමිණීම ප්‍රමාද ය. වේළුසුමන ද පැමිණ නැත. දාඨාසේන මහනෙළ යුද්ධ සමමිත්‍රණ ශාලාවේ යුද්ධ මණ්ඩල රැස්වීමට කටයුතු සූදානම් කරති.

"දැන් අතුරුපස වේලාව. කවුරුත් භෝජන ශාලාවට එන්න." සමන්තා කුමරියගේ ආරාධනයෙන් කවුරුත් බොජුන් හලට එකතු වූහ. මහිලා සීවලී කුමරියෝ ද එහි වූහ.

"අද යුද්ධ මණ්ඩල රැස්වීම නැහැ. අතුරුපසින් පසු කවුරුත් සන්නිපාත ශාලාවට එන්න. යුද්ධ සම්මන්ත්‍රණ ශාලාවට පැමිණ සිටින අයත් දැන් මෙහි ඒවි. කෙටි සාකච්ඡාවකින් පසු විසිර යන්නට පුළුවන්". සුරනිමල කීවේ ය.

අයන්ති විතාන

**ජීවාට...... මොකක්දෝ වේගෙන එනවා වගේ දැනෙනවා. "මං හරි අකීකරු ළමයෙක්. මට අම්මාවයි තාත්තාවයි දෙන්න ම පෙන්නන්න බෑ. ඒකට හේතු මගෙන් අහන්න එපා. ඒගොල්ලොයි මායි නො ගැළපෙන චිත්තිය විතරක් මම දන්නවා. මට ඉගෙන ගන්න එපා වෙලා.**

අම්මලාට ඕන මට උගන්වන්න. ඒකෙන් ඒ ඒගොල්ලො බලාපොරොත්තු වෙන්නෙ මොනව ද කියලා මට තේරෙන්නෙ නෑ. මට කැම්පස් යන්න ඕනෙ නැහැ. ඒත් ඒ ගොල්ලන්ට ඕන. මට බයෝ කරන්න ඕන නෑ. ඒත් එයාලට ඕන. මේවා නිසා ද මන්දා මට ඒ ගොල්ලො එපා වෙලා තියෙන්නෙ. කොහොම වුණත් මගේ කාමරේ අපිරිසුදුයි කියන එක මං පිළිගන්නවා. ඒක එහෙම නො වී තියාගන්න මං ආසයි. ඒත් ඒකට හැමදාම කාලෙ නාස්ති කරන්න මට බැහැ. කාමරේට දූවිලි එන හින්ද මං ජනෙල් වහළ තිබුණා. ඊට පස්සෙ කාමරේ ම ගඳයි. මට මකුළුවන් මරන්න බෙහෙතක් කියන්න. උන් දැල් බඳිනවා. ඉවරයක් නැහැ....."

තමන්ගේ ලියුම මහ මෝඩයකුගේ එකක් කියලා ජීවාට හිතුණා. ඒත් කියන දේ අවංකව කියන ගතියක් ජීවා තුළ තිබුණා.

"ගෙදර යුද්ධෙ පටන් අරං, මල්ලි කෑගහනවා එයාගෙ හෝම්වර්ක් කරපු පොත නෑ කියලා. තාත්තට බත් එක පරක්කු වෙලා. මට එපා වෙන්නෙ මේ වෙලාවට තමයි. මං ඉස්කොලෙ යන්නැති හින්ද හොඳයි. අම්මාට වේලාසන උයන්න තිබුණෙ නැද්ද...."

ජීවා කුස්සියට ගියා වතුර එකක් බොන්න. පිගන් රාක්කෙ තමන්ගෙ කෝප්පෙ නැති චිත්තිය දැක්කාම ජීවටත් කේන්තියි.

'කෝ අම්මා මගේ කෝප්පෙ....?'

'බලන්නකො ටිකක් මං ගත්තැයි' අම්මා තාත්තාගේ බත් පෙට්ටිය හෝදන ගමන් කිව්වා. මල්ලි සපත්තු අඩි පොළොවෙ ගහ ගහා කුස්සියට ආවා.

'මං ඉස්කෝලෙ යන්නෑ. අද මගේ පොත නෑ'

'කොහොද ඒක ඔයා තිබ්බෙ....?.'

'මං දන්නවා නම් ඒක අම්මගෙන් අහනවාද?'

'මල්ලි ටී. වී. බලපු තැන ගිහින් බලන්න. ජීවා කේන්තියෙන් කිව්වා ම මල්ලි කරබාගෙන එළියට ගියා.

'ෂි.... කෝප්පෙ කුඹි පිරිලා'


# ජීවාගේ ලෝකය

**බටුවන්ගල රාහුල හිමි ලියන යොවුන් නවකතාව**

**3 කොටස**



# මං හරි අකීකරු ළමයෙක්



'ඉතින් ළමයො මගෙ වරදක් ද? ඔයා උදේ බීපු කිරි එකේ ඉතිරි ටිකමනේ ඔය'

ජීවාට තමන් ගැන ඇති වුණේ කෝපයක්. කුඹි ටිකත් එක්කම ජීවා සින්ක් එකේ ටැප් එකට කෝප්පය අල්ලුවා. කුඹි ටික වතුරට අහුවෙලා ජීවිතේ බේරගන්න දඟලද්දි ජීවා කෝප්පෙට වතුර එකක් පුරවාගෙන ඒකත් අරං කාමරේට යන්න හැරුණා විතරයි ජීවාගේ යටිපතුලෙ ඇලුණු ලුණු ලෙල්ල නිසා පය දෙතුන් පාරක් පොළවෙ උලන්න සිදු වුණා. ලුණු ලෙල්ල ගසන්න පය උස්සන කොටයි දැක්කෙ තමන්ගෙ යටිපතුල්වල ගෑවිල තියෙන දැලි පාර 'මල ජරාව ටයිල්වල' ජීවා අප්පිරියෙන් එතනින් ඉවත් වෙලා බාත්රූම් එක ඇතුළට ගිහිං ආපහු යටි පතුල් හෝදගෙන කාමරේට ගියා. කාමරේට යන අතර රෙදි පාපිසි දෙකක ජීවා දෙපතුල් ඇතිල්ලුවා.

ජීවා ටික වෙලාවකට පස්සෙ නැවතත් පරිගණකෙ ළඟට ගියා. ආපහු ලියුම් පෙට්ටිය ඇරලා බැලුවා. ලියුම්... ඔව් සීමන්ගෙන් ආපහු විද්‍යුත් ලිපියක්.

නව ක්‍රමවේද අත්හදා බැලීමක්

'ජීවා.... ඔයාට ගොඩක් ස්තුති කරන්න කැමතියි මට ලිව්වාට. ඔයා යමක් පිළිගන්න ලෑස්ති බවත් මට දැනෙනවා. ඒත් ජීවා සමාවෙන්න. ඔයාගෙ කාමරේ මකුළු දැල් බඳින මකුළුවො මරන්න ක්‍රමයක් මං කියා දේවි කියලා හිතන්න එපා. ඒත් ඔයාට ආයි ඔය කාමරේ මකුළු දැල් කවදාවත් දකින්න ලැබෙන එකක් නෑ....


ඔයාට පරිසරය පිරිසුදුව තියා ගන්න එකේ වැදගත්කම තාම හරියට ම තේරුණේ නැත්නම් බලන්න ඔයාගෙ යටිපතුල් දිහා. ඔයා දැන් ඩිංගකට ඉස්සෙල්ලා බාත්රූම් එකට ගිහින් ඔය යටිපතුල් සබන් දාලා හෝද ගෙන නේද ආවෙ. ඒත් දැන් බලන්න."

"අනේ සීමන් කියන්න ඔයා ළඟ පාතක ද ඉන්නෙ...?" ජීවා හයියෙන් කිව්වා. මේ සිදුවීම වෙලා කොච්චර අඩු කාලයක් ද ගත වුණේ? කොහොම ද එයා ඒක දන්නෙ? ජීවා ඊළඟට යටිපතුල් බැලුවා. ඒ යටිපතුල් කළු පාටයි.

"ජීවා ඔයාගෙ යටිපතුල් දෙක හරි ලස්සනයි. සුදුයි. මොළකැටියි. ඒත් ඒක තියන තැන් හරි අපිරිසුදුයි. ඔයාගෙ ඔය මොළකැටි යටි පතුල් දෙකට කොච්චර අසාධාරණයක් ද කරන්නේ?"

'අනේ සීමන් මට තේරෙනවා......... මට කියා දෙන්න.

ඔයා අහලා තියෙනවා ද? එස් පහ ගැන. ඒක ගැන මං ඔයාට කියලා දෙන්නයි හදන්නෙ.



# සැනසුම ඇති තැන

මනු දිවි මල් උයනේ
පියකරු කුසුමක්වී
සුවඳ දසත පතුරා
අකුසල් සිතිවිලි මළ
සිතින් මුදා හැර

බුදු මග යනු මැනවී
සැදැහැ සිතින් පිබිදී

නෙත රැඳි සොඳුරු දසුන්
ලොබින් තුරුළු කරලා
සතු කර ගන්න ද
ගෙන යනු බැරි වේ
භවයෙන් භවයට

බුදු මග යනු මැනවී
සැදැහැ සිතින් පිබිදී

පියාසලන විහඟකු සේ
අත්හළ විට නො ඇලී
සුරැකුම හා සැනසුම
එහි වේ සැම කල්
පරම සුවය වූ
නිවනට මග වේ

බුදු මග යනු මැනවී
සැදැහැ සිතින් පිබිදී

ආචාර්ය
රත්නපාල වික්‍රමසිංහ



# මගේ ලෝකයේ වීරයා

**මෙවර ජයග්‍රාහී රචනාව**

මගේ ලෝකයේ වීරයන් වහන්සේ ඒ භාග්‍යවත් වූ අරහත් වූ සම්මා සම්බුදුරජාණන් වහන්සේ ය. ඒ වීරයන් වහන්සේ මගේ ලෝකයේ පමණක් නොව, අනන්ත සක්වල අතරේ සිටින දෙවියන්, මරුන්, බඹුන් සහිත මේ මිනිස් ප්‍රජාව අතර වැඩ සිටින අසම සම වූ වීරයන් වහන්සේ ය. උන්වහන්සේ රාග, ද්වේෂ, මෝහ දුරු කළ නිසා මගේ ලෝකයේ වීරයාණන් වහන්සේ වන සේක.

වෙසක් සඳ පායා ආ පෝ දිනෙක සියලු කෙලෙස් නසා, මරුන් පරදවා දස දහසක් සක්වල කම්පා කරවමින් සම්මා සම්බුද්ධත්වයට පත් වූ සේක. දෙවියෝ ද, බඹහු ද මහා වීරයන් වහන්ස කියා උන්වහන්සේට වන්දනා කළහ. අතීතයේ ද, වර්තමානයේ ද, අනාගතයේ ද මහ විරුවන්, මහා යෝධයන්, ශක්තිවන්තයන්, උගතුන්, නුවණැත්තන් ඇ සියලු පිරිස් අතරින් මාගේ බුදුරජාණන් වහන්සේ ඒකාන්තයෙන් ම මහා වීරයාණන් වහන්සේ වන සේක.

**රිදීමාලියද්දේ සුසන්ත හිමි**
සීලසමාහිත යෝගාශ්‍රමය
බෙලිහුල්ල



# සදහම් අරණ

සංස්කරණය - **නයනා නිල්මිණී**

## ලෝක නාථයාණනි

පින්බර මවක බිහි කළ සිදුහත් කුමරා
ගිහි ගෙය හැර ගියේ පිහිටක් සදනු තියා
ලෝ සත කෙරෙහි අනුකම්පාවෙන් රජිදා
බුදු බව ලැබුවේ බෝ රුක මුල මරු පරදා

වැඩම කළේ පන්සාළිස් වසක් පුරා
ලෝ සත නිවන්නට අම දම් නිවන සදා
රහල් පුතුට මෙන් දෙව්දත් තෙරට එදා
පෑවේ මහා මෙත් කරුණා ගුණ කන්දා



**ආර්.ඒ. හෝෂිනි තරුෂිකා**
10 ශ්‍රේණිය
ශ්‍රී ධර්මාරාම දහම් පාසල, තිල්දණ්ඩාහින්න

## විහාර මහා දේවි



දුටුගැමුණු රජුගේ මව විහාර මහා දේවියයි. විහාර මහා දේවියගේ පියාගේ නම කැලණි තිස්ස ය. මුහුද ගොඩ ගැලූ අවස්ථාවේ විහාර මහා දේවිය මුහුදට බිලි වී රට බේරා ගත්තා ය.

ඇය රට එක්සේසත් කිරීමට තම පුත් ගැමුණු කුමාරයාට සහාය වූවා ය. විහාරමහා දේවිය රට, ජාතිය, භාෂාව, ආගම ගැන ඇඩි ඇල්ම ඇත්තා වූ වීර කාන්තාවක් ලෙස ගරුසරු ලබයි. විහාර මහා දේවියගේ ප්‍රතිමා ඉදිකර ඇත. කොළඹ ඇති සිගිති උයන, පාසල්, ආදියට විහාර මහා දේවියගේ නම යොදා තිබේ.

**ගොඩකවෙල සුමිත්ත හිමි**
03 වසර
ශ්‍රී සුමණ සාමණේර ආයතනය
වෙහෙරයාය

## පියගුණ කවි

නැගිටිමින් අලුයම
කටයුතු අරඹමින් තව
කළ හැම මෙහෙවර
උදක් පැතුවේ එ දරු සැපතම

උදයේ පිටව ඔබ
අඳුරේ ය ආවේ මොබ
නිදා සිටි අප සිඹ
සැනසුණා දරු සෙනෙහසක් ලැබ

**මහආරගම සුදස්සන හිමි**
2 වසර
ශ්‍රී විමල පුස්තකාලය
හඳපානාගල


## මගේ අප්පච්චි

මා දන්න විදිහට හැමෝගෙ ම ලෝකයේ වීරයෙක් ඉන්නවා. ඒ වගේ ම ඒ අය එයාට ආදරේ කරනවා. හැම දෙනාට ම වීරයෙක් ඉන්නවා වගේ මගේ ලෝකයේත් වීරයෙක් ඉන්නවා. ඒ, මගේ ආදරණීය තාත්තා. මගේ අප්පච්චි මට පණටත් වඩා ආදරේ කරනවා. මට එය දැනෙනවා. අප්පච්චි මට ආදරේ කරනවා වගේ ම මමත් අප්පච්චිට ආදරෙයි. ඒක මම කියන්නේ හරිම ආඩම්බරයෙන්, ගෞරවයෙන්, සෙනෙහසකින්.

"මගේ අප්පච්චිට මම අහස තරම් ආදරෙයි."

**ඩී.එම්.යශ්මි සංචනා**
9 ශ්‍රේණිය
ගලේවෙල මහ විදුහල
ගලේවෙල

## වලාකුළේ



වලාකුළේ වලාකුළේ කොයි යන්නේ
හිමින් සැරේ
මහ මුහුදින් වතුර ටිකක් අරගන්නයි
මම යන්නේ
වලාකුළේ වලාකුළේ වතුර අරන්
කොහි යන්නේ
අපේ රටේ වැව් පුරවා වැහි දෙන්නයි
මම යන්නේ

**කැළිපානාවෙල විරාගධම්ම හිමි**
1 වන ශ්‍රේණිය,
ගැමුණු මහා විහාරය
වෙහෙරයාය

## බුදුසරණ සදහම් අරණ ළමා සමාජය

**සම්පූර්ණ නම** :- ..................................................
**පාසල / දහම් පාසල** :- ..................................................
**ඉගෙනුම ලබන ශ්‍රේණිය** :- ..................................................
**ලිපිනය** :- ..................................................
**දුරකථන අංකය** :- ..................................................

**අව අටවක, අමාවක, පුර අටවක, පසළොස්වක පෝය දිනකම ඔබේ නිර්මාණ සදහම් අරණ පිටුවේ පළවේ. සංස්කාරිකා, සදහම් අරණ ළමා සමාජය, බුදුසරණ කර්තෘ මණ්ඩලය, ලේක්හවුස්, කොළඹ.**

## පැණ විසඳුම්

දයාවංශ ජයකොඩි සහ සමාගම


**පහත සදහම් ප්‍රශ්නයට පිළිතුර පැහැදිලි ව ලියා අප වෙත එවන්න.**

**බුදුරජාණන් වහන්සේගේ කරුණාව**
යන මාතෘකාව පිළිබඳ
කෙටි රචනාවක් නිර්මාණාත්මක ව ලියා
අපවෙත එවන්න.

..........................................................................................

ජයග්‍රාහී දරුවකුට දයාවංශ ජයකොඩි සහ සමාගමෙන් දහම් පඩුරක් පිරිනැමේ.

## ළමා ප්‍රහේලිකා අංක 26



**ප්‍රථම ජයග්‍රාහකයා සඳහා බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුවේ ත්‍රිපිටක ග්‍රන්ථ සම්පාදක මණ්ඩලයේ ලේකම් කේ.කේ. සුගතපාල මහතාගේ අනුග්‍රහයෙන් වටිනා ත්‍යාගයක් පිරිනැමේ.**


### හරහට

1. මහාභද්‍ර කල්පයෙහි පළමුවන බුදුන් වහන්සේගේ නමයි
4. සංඝයා යන අරුත දෙන පදයකි
6. ඕල්කොට් තුමා ලංකාවට ගොඩබැස්සේ මෙම වරායෙනි
7. වරද කළ අයට මේවා පැමිණවීම පැරණි දඬුවම් ක්‍රමයකි
8. උඩරට නැටුම් ක්‍රමයෙහි දී ගායනා කරන මෙනම් ප්‍රබන්ධ දහඅටකි

### පහළට

2. පරලොව යහපත සඳහා පින්කම් කර මේවා රැස්කරගත යුතුය
3. සංඛ්‍යාවෙන් දෙකක්ය යන අරුත දෙන පදයකි
5. දඹදිව තිබූ සොළොස් මහ ජනපදයන්ගෙන් එකකි
6. වැඳුම් කිරීමේදී කියවනු ලබන පාලි පද්‍ය ප්‍රබන්ධය මෙනමින් හැඳින්වෙයි
7. මුගලන් හිමියන් මෙම පාර්ශ්වයට අනුගත ශ්‍රාවක ලෙස දක්වනු ලැබේ.

## ජයග්‍රාහී ළමා ප්‍රහේලිකා අංක 25



### ප්‍රහේලිකා ජයග්‍රාහකයෝ

**විශ්ව ප්‍රසාද් අනුරාධ**
9 ශ්‍රේණිය
මහින්ද රාජපක්ෂ විදුහල - හෝමාගම


**ඩබ්.ඒ.පහන් පින්සර**
4 ශ්‍රේණිය
ශ්‍රී දේව රක්ෂිත ආදර්ශ කනිටු විදුහල
පල්ලේවෙල

# ආදරය සෙනෙහස ලැබෙන්නේ මේ වගේ දරුවන්ටයි



## ලොවට පිපෙන මල්

01 කොටස



**ආදරණීය දුවේ, පුතේ,
අද සිට අපි ඔබට මහා කාරුණික බුදුපියාණන් වහන්සේ පුංචි ඔබට දැක් වූ දයාව, කරුණාව, සෙනෙහස, ආදරය ගැන ලස්සන කතා ටිකක් කියලා දෙන්නයි පෑන අතට ගත්තේ. සතුටුයි ද?**

මේ කතා තනියම කියවා ගන්න අපහසු නම් අම්මා, අප්පච්චි, අත්තම්මා, සීයා, අක්කා, අයියා ඔබට උදව් කරාවි. විවේක තිබුණොත් ගුරුතුමියගෙනුත් ඔබට උදව් ලැබේවි.

ඔබ පෝයට පන්සල් ගිහින් දෝත පුරා මල් අරගෙන බුදුපියාණන්ට පූජා කරනවා නේද? එතකොට බුදුපියාණන් කරුණාවෙන් හිනා වෙනවා ඔබ දැකලා ඇති. ඇයි දන්නවද හිනා වෙන්නේ? උන්වහන්සේ ත් ඔබ වගේම පුංචි දරුවෙක් වෙලා හිටියා. උන්වහන්සේගේ අම්මගේ නම මහාමායා දේවිය. තාත්තා ශුද්ධෝදන රජතුමා. එතුමාගේ නම සිද්ධාර්ථ. රජ පවුලක නිසා සිද්ධාර්ථ කුමාරයා කියලා ප්‍රසිද්ධ වුණා. රජකම් කළත් ශුද්ධෝදන රජතුමා හොඳ ගොවියෙක්. නමේ තේරුමත් ඒකනෙ. ශුද්ධ වූ ලෙසට පිරිසුදු ලෙසට බත උපදවා ගන්නා ගොවියා.

කුඹුරට වස විෂ කෘමිනාශක දාන්නේ නැතිව ගොවිතැන් කරලා. ශුද්ධ වූ පිරිසුදු වූ අස්වැන්න ගෙට ගෙනාපුව ම ඒ බත් කන අපිට ලෙඩ රෝග හැදෙන්නේ කලාතුරකින්. ඒත් අපේ වැරැදි පුරුදු නිසා අපිව නිතර නතර ලෙඩ කරවනවා.

පුතාලට දුවලාට නම් දානකොට අම්මයි අප්පච්චියි හුඟක් කල්පනා කරලා තේරුමක් ඇතිව නේ නමක් දාන්නේ. සිද්ධාර්ථ නමත් ඒ වගේ තේරුමක් ඇතිව දාපු නමක්. ලෝකයට යහපතක් කරන්නා, හොඳ ගුණදහම් ඇතිව, වටිනාකමක් ඇතිව ජීවත් වෙන්නා කියන තේරුම සිද්ධාර්ථ නමේ තිබෙනවා. අපි සිද්ධාර්ථ කුමාරයාට සිදුහත් කුමාරයා කිව්වත් තේරුම එකම යි.

පුංචි ඔබ මල් පූජා කරනකොට බුදුපියාණන් හිතනවා ඇති අනේ මමත් මේ වගේ පොඩි ළමයෙක් වෙලා හිටියා. හොඳට ඉගෙන ගත්තා. පුංචි අම්මටයි තාත්තටයි කීකරුව හැදුණා. සතකුටවත් හිංසා කළේ නැහැ. එහෙම හොඳට හැදුණ නිසා මට පුළුවන් වුණා සියලු සත්වයින්ගේ යහපතට හේතුවන ධර්මයක් හොයා ගන්න. මේ පුංචි දරුවෝ මට මල් පූජා කරලා හිතනවා ඇති අපිට හොඳට ඉගෙන ගන්න පුළුවන් වෙන්න ඕනෙ. හොඳ දරුවන් වෙන්න ඕන කියලත්. දරුවන්ගේ ඒ හොඳ ප්‍රාර්ථනා බුදුපියාණන්ට සතුටක්. හොඳට ඉගෙන ගන්න ළමයි හොඳ මිනිසුන් වෙනවානේ.

දැන් ඔබ හිතනවා ඇති කෝ සිදුහත් කුමාරයාගේ අම්මා. අම්මාට මොකද වුණේ කියලා. කුමාරයා ඉපදිලා ටික දවසකින් මහාමායා දේවිය මිය ගියා. පුංචි දරුවා බලා ගත්තේ, කිරි දුන්නේ පුංචි අම්මා, මහා ප්‍රජාපතී ගෝතමී දේවිය.

කුඩා කාලයේ තමන්ට ලේ කිරි කර දුන් පුංචි අම්මාට බුදු පියාණන් වහන්සේ මහා ගෞරවයකින් සැලකුවා. කෙළෙහි ගුණය දැක්වූවා. දුක සැප සොයා බැලුවා. බුදු වුණත් අම්මාට අප්පච්චිට කළ යුතු සේරම යුතුකම් ඉෂ්ට කළා.

පුංචි පුතාලා කැටපෝල් හදාගෙන බටලී තුවක්කු හදාගෙන, සල්ලි තියෙනවා නම් පිටරටවලින් ගෙන්වන සෙල්ලම් තුවක්කු අතට අරගෙන සමනලයින්ට, පුංචි කුරුල්ලන්ට, ලේන් පැටියන්ට විදිනවා ද? අහිංසක සත්තු තුවාලවෙලා බිම වැටිලා හඬන කොට උන් වටකරගෙන උඩ පැන පැන හිනා වෙනවා ද? නැහැනේ. අපේ දරුවෝ බුදුපියාණන් වහන්සේට ආදරය නිසා ඒ වගේ නරක වැඩ කරන්නේ නැහැ.

ඒත් අපේ සමහර යහළුවෝ ඉන්නවා, සෙල්ලමට කියලා ඒ වගේ නරක වැඩ කරන අය.

සිද්ධාර්ථ කුමාරයාගේ එක යහළුවෙක් හිටියා ටිකක් විතර නරක වැඩ කරන. පොඩ්ඩ වැරදුණාම අනිත් අයට ගහනවා. බනිනවා. ඇඳුම් ඉරලා දානවා. හිරිහැර කරනවා.

යාළුවේ ඔයත් හොඳ ළමයෙක් වෙන්න. නරක වැඩ කරන අයට කවුරුත් ආදරේ නැහැ කියලා සිද්ධාර්ථ කුමාරයා කොච්චර අවවාද කළත් එයා ඒක ඇහුවේ නැහැ.

දවසක් යාළුවෝ ටික එකතු වෙලා පුංචි කැලෑවකට ගියා ඇවිදින්න. සත්තු බලන්න. ගස් නගින්න පලතුරු කන්න. මේ පුංචි කැලෑවේ අලංකාර පොකුණක් තිබුණා. ඕලු, නෙළුම්, මානෙල් , කුමුදු, කෙකටියා, දියබෙරලියා පිරිලා. ඒ වගේ ම පාට පාට ලස්සන මාලු. රතු, කළු, කහ, දුඹුරු, නිල්, සුදුපාට මාළු රංචු එහා මෙහා පිහින පිහින වතුර බොන්න පොකුණට එන සත්තු දිහා බලලා සතුටු වෙනවා.

හාවා, මුවා, මී මින්නා, මුගටියා , මීමා ඌරා වගේ සිව්පාවුණුත් නයා, පිඹුරා, පොලගා, ඇහැටුල්ලා, ලේ මැඩිල්ලා, ගැරඬියා, වගේ උරගයිනුත් වතුර බොන්න එනවා.

අහසේ පියාසලන ගිරවා, පිළිහුඩුවා, කොට්ටෝරුවා, මොනරා, මයිනා, නීල කොබෙයියා වගේ කුරුල්ලන් අතර කොකා, තාරාවා, පාත්තයා, දියකාවා, හංසයා හිටියා.

අත්තෙන් අත්තට පනින වඳුරා, රිලවා, ලේනා නිදහසේ පිනුම් ගැහුවා. මල් පිපුණා. ගෙඩි හැදුණා. ගස්වැල් නිසා කැලෑව හුඟක් ලස්සන වෙලා.

මෙන්න මේ වගේ සුන්දර කැලෑවකට තමයි සිද්ධාර්ථ කුමාරයා සහ යහළුවෝ ගියේ. යහළුවන්ගේ අත්වල දුනු සහ ඊතල සත්තුන්ට හිංසා කරන ඒ වගේ ආයුධ කුමාරයා අතට ගත්තේවත් නැහැ. සත්තු දැක්කා ම සමහර යහළුවන් දුනු ඊතලවලින් උන්ට විඳින්න පටන් ගත්තා. එක යහළුවකුගේ ඊතල පහර වැදුණේ හංසයකුට. හංසයා බිම වැටුණා. සිදුහත් කුමාරයා දැක්කා හංසයා බිම වැටිලා වේදනාවෙන් දඟලන හැටි.


ගස් සෙවණක වාඩිවෙලා කුරුලු ගීත අසමින් සිටි කුමාරයා එක පාරටම නැගිටලා හංසයා ළඟට දිව්වා. හංසයා සිද්ධාර්ථ කුමාරයා දිහා බැලුවේ අනේ කුමාරයාණෙනි, මාව බේරා ගන්න. මම කාටවත් කරදරයක් කරන්නේ නැති අහිංසක කුරුල්ලෙක්. මං මැරුණොත් මගේ අම්මා, තාත්තා දුක් වේවි. හොඳටම හඬාවි. අනේ මා බේරා ගන්න ඔබට පින් සිද්ධ වෙයි. කියා කියන්නා වගේ . සිද්ධාර්ථ කුමාරයා අහිංසක සතා පරෙස්සමෙන් උකුළට අරන් ඊතලය ඇදලා අහකට දැම්මා. හිස, දිග බෙල්ල, පියාපත් කරුණාවෙන් අත ගගා හිතුවා අනේ මේ සතාට කිසිම කරදරයක් වෙන්න එපා. ඉගිලෙන්න පුළුවන් වෙන්න ඕන. හංසයාණෙනි, මම ඔබට මැරෙන්න දෙන්නේ නැහැ. හැම සතෙක් ම ජීවත් වෙන්නයි කැමතියි. මැරෙන්න බයයි. ඔබ ටිකක් දඟලන්නේ නැතිව ඉන්න. ශක්තිය ලැබේවි.

සිද්ධාර්ථ කුමාරයාගේ සත්ව කරුණාව හංසයාට බෙහෙතක් වගේ වුණා. ආයෙත් එයාගේ පියාපත්වලට ශක්තිය ආවා. එයා කුමාරයා දිහා ආදරයෙන් බලලා ඔබට ස්තුතියි. පින් සිද්ධ වෙච්චාවෙ. කියන්නා වාගේ දිග බෙල්ල ටිකක් නමලා එකපාරටම පියාඹන්න පටන් ගත්තා.

මේ අතරේ හංසයාට දුන්නෙන් ඊතලෙන් විද්ද යහළුවා දුරදීම දැක්කා නේ, හංසයා බිම වැටෙනවා. එයා හංසයාව හොය හොයා එනකොට සිද්ධාර්ථ කුමාරයා ළඟ ඉඳලා අහසේ පියඹා ගිය හංසයාව දැක්කා.

***ඊට පස්සෙ මොකද වුණේ අපි ඒ ගැන වප් අව අටවක පෝදු 28 පුවත් පතින් දැනගනිමු .***

ප්‍රවීණ ලේඛිකා
**සෝමා ජයකොඩි**


පානදුර රන්කොත් විහාරය

# බොදු පුනරුදයේ සුවිශේෂී සන්ධිස්ථානයක් සනිටුහන් කළ

## පානදුරාවාදයේ ඉතිහාස කතාව

**සියවස් හතරකට ආසන්න කාලයක් ම පෘතුගීසි, ලන්දේසි, ඉංග්‍රීසි කියන යුරෝපා ජාතීන්ගේ තාඩන පීඩනවලට මුහුණ දෙන්නට ශ්‍රී ලාංකිකයන්ට සිදුව තිබුණා. යුරෝපීයයන්ගේ අරමුණ වුණේ පෙරදිග රටවල වෙළඳාම් කටයුතු සිදු කරමින් අධික ලාභ ඉපයීම පමණක් ම නම් නොවෙයි. තමන් අදහන ආගම් එම රටවල ප්‍රචාරය කිරීම ද ඔවුන්ගේ ප්‍රධාන අරමුණක් වුණා.**

මුලින් ම ලක්දිව මුහුදුබඩ ප්‍රදේශ ද, වර්ෂ 1815න් පසු මුළු ලංකාව ම ද පාලනය කිරීමේ බලය සියතට ගත් මොවුහු තම පාලන ප්‍රදේශවල බුදුදහම ඇතුළු ස්වදේශිකයන්ගේ ආගම් ඇදහීම තහනම් කළා. වෙහෙර විහාරස්ථාන කඩා බිඳ දැමුවා. පල්ලි ඉදි කළා. පූජකවරුන් ලංකාවට කැඳවා ඔවුන්ට අනුග්‍රහ දැක්වූවා. පාසල් ආරම්භ කළේ ඒ පල්ලි ආශ්‍රිතවයි. ඒ සමග ම එතෙක් පන්සල් හා පිරුවන් සමග බැඳී පැවතුණු අධ්‍යාපන ක්‍රමය විනාශ කර දැමුවා. යුරෝපීයයන් ඇරඹූ පාසල් හැඳින්වූයේ මිෂනාරි පාසල් ලෙසයි. එම පාසල්වල අධ්‍යාපනය ලැබූ දරුවන්ට රජයේ ඉහළ තනතුරු සහ වරප්‍රසාද අනිවාර්යයෙන් ම හිමි කර දෙන්නට ද ඔවුන් පසුබට වූයේ නෑ.

ඒ වගේ ම යුරෝපීයයන්ගේ ආගම් වැළඳගත් අය සඳහා රජයේ තනතුරු සහ වරප්‍රසාද පිරිනැමීම නිසා ලාභ සත්කාර අපේක්ෂාවෙන් බොහෝ ස්වදේශිකයෝ බුදුදහම අත් හැර යුරෝපීයයන් ඇදහූ ආගම් වැළඳගන්නට වූවා. යුරෝපීය නම්, ඇඳුම් පැළඳුම්, සිරිත් විරිත් අනුකරණය කළා.

මිෂනාරි පාසල්වල අධ්‍යාපන රටාව සකස් වී තිබුණේ දරුවන්ට නිබඳව ම තම රට පිළිබඳ පිළිකුලක් ඇති වන ආකාරයට යි. සිංහල සිරිත් විරිත් ගර්හාවට ලක්වන ලෙසට යි. බුදුදහම පිළිබඳ අපහාසාත්මක ප්‍රකාශ සිදු කොට යුරෝපීය ආගම් සහ සිරිත් විරිත් පිළිබඳ හැඟීමක් ඇති වන ආකාරයට යි. මෙම පාසල්වලට දරුවන් නොයවන මව්පියන්ට දඩ ගැසීමේ පිළිවෙතක් ද වුණා. ඒ අතර පූජකවරුන්ට නොමඳ රාජානුග්‍රහය ද ලැබුණා. ඔවුන් ප්‍රසිද්ධ දේශනා පවත්වමින්, බුදු දහම පිළිබඳ බොරු මතවාද සමාජගත කළා.

ලංකාවට ට මුද්‍රණ ශිල්පය හඳුන්වා දුන්නේ මේ අතරයි. ඒ සමග ම බුදු දහම විකෘති වන අන්දමේ අර්ථකථන සපයා පොත් මුද්‍රණය කිරීම සහ අත් පත්‍රිකා බෙදා හැරීම සුලභ සිද්ධියක් බවට පත් වුණා. පූජකවරු සිංහල හා පාලි භාෂා ඉගෙන ගනිමින් තම මතවාද ව්‍යාප්ත කිරීමට උත්සුක වුණා.

දුරාතීතයේ පටන් සතර පෝයට පෙහෙවස් සමාදන් වීමට පුරුදු වූ ලාංකිකයන් එයින් දුරස් කරීම සඳහා පොහොය නිවාඩුව පවා අහෝසි කළා. සති අන්ත නිවාඩු හඳුන්වා දුන්නේ ඒ වෙනුවටයි.

වර්ෂ 1815 උඩරට ගිවිසුමට අනුව බ්‍රිතාන්‍යයන් බුද්ධාගම සුරක්ෂිත කිරීමට බැඳීසිටිය යුතු වුණා. එහෙත් ඔවුන් එම වගකීම ඉටු කළේ නෑ. 1818 සහ 1848 නිදහස් සටන් ඇති වන්නේ මෙවැනි කරුණු පදනම් කරගෙනයි. එසේ වුව ද එම නිදහස් සටන් කෲර ලෙස මර්දනය කිරීමට ඉංග්‍රීසිහු සමත් වුණා. ස්වදේශිකයන් තමන්ට වන අසාධාරණකම් පිළිබඳ විටින් විට ඉංග්‍රීසි ආණ්ඩුකාරවරයා දැනුම්වත් කළේ පෙත්සම් යොමු කරමිනුයි. එහෙත් සුබවාදී ප්‍රතිචාර ලැබුණේ නෑ.

වැලිවිට සරණංකර සංඝරාජ හිමියන්ගේ අප්‍රතිහත ධෛර්යය නිසා මෙරට ධර්ම ශාස්ත්‍රාලෝකයක් ඇති වුණා. එහි ප්‍රතිඵල වශයෙන් රට පුරා වියත්, විශාරද මහා සඟ රුවනක් බිහිවුණා. මේ නිසා පාලකයන්ට තම අභිමතාර්ථයන් සාර්ථක කර ගතහැකි වූයේ නෑ.


මිගෙට්ටුවත්තේ ගුණානන්ද හිමි


ජෙරමියෙස් දියෙස් මැතිතුමා

වර්ෂ 1826 ගාල්ලේ මේධංකර නාහිමියන් විසින් පැල්මඩුල්ල රාජමහා විහාර පිරුවන ආරම්භ කිරීම, එම පිරුවනේ ශිෂ්‍යවරයකු වූ වලානේ සිද්ධාර්ථ හිමියන්, රත්මලානේ පරමධම්මචේතිය පිරුවන ආරම්භ කිරීම සේ ම වලානේ මාහිමියන්ගේ ශිෂ්‍යවරුන් වූ හික්කඩුවේ ශ්‍රී සුමංගල නාහිමියන් සහ රත්මලානේ ධර්මාලෝක මාහිමියන් අග්‍රගණ්‍ය ප්‍රාචීන භාෂා සහ බෞද්ධ අධ්‍යයන ආයතන වූ විද්‍යෝදය හා විද්‍යාලංකාර පිරුවන් දෙක පිහිටුවීම මෙරට දෙස, බස, දැය, සමය නැංවීමට මහෝපකාරී වූ සිදුවීම් බවට පත් වුණා.

එසේ ම වැලිතර, දෙඩංදූව ප්‍රදේශ ආශ්‍රිත ව සිදු වූ ධර්ම ශාස්ත්‍රීය ප්‍රබෝධය ද අමතක කළ නොහැකියි. පැල්මඩුල්ල සුදර්ශන ධර්ම ශාලාවේ පැවති විනය සංගායනාව ද මෙම යුගයේ බොදු පුනරුදයට ඉමහත් දායකත්වයක් සැපයූවා. එම යුගයේ ජාත්‍යන්තර සම්බන්ධතා අතින් පොහොසත් ව සිටි බුලත්ගම සිරි ධම්මාලංකාර සුමනතිස්ස මාහිමිපාණන් වහන්සේ ලංකෝපකාර මුද්‍රණාලය පිහිටුවා ප්‍රථම බෞද්ධ පුවත්පත වූ ලංකාලෝකය පුවත්පත ආරම්භ කළා. දෙඩංදූවේ පියරතන තිස්ස නාහිමිපාණන් වහන්සේ විසින් ජිනලබ්ධි විශෝධනී නමින් ලක්දිව ප්‍රථම බෞද්ධ පාඨශාලාව ආරම්භ කරනු ලැබුවේ ද ගිහි බෞද්ධ දරුවන්ට අධ්‍යාපනය ලබා දීමටයි.

ක්‍රිස්තියානි ආගමිකයන් ප්‍රසිද්ධ දේශන පවත්වා බුදු දහමට සිදු කළ නිගාවන්ට පිළිතුරු සැපයීමට බෞද්ධ භික්ෂූන් වහන්සේලා සංවිධානාත්මක අන්දමින් ඉදිරියට පැමිණීම 1860 දශකය වන විට දකින්නට ලැබුණා. මෙහිදී බෞද්ධයන්ගේ අසහාය කථිකයා ලෙස ඉදිරියට පැමිණියේ මිගෙට්ටුවත්තේ ගුණානන්ද මාහිමිපාණන් වහන්සේ යි. මිගෙට්ටුවත්ත ග්‍රාමය මොහොට්ටිවත්ත ලෙස ද හඳුන්වා ඇති නිසා මොහොට්ටිවත්තේ ගුණානන්ද නමින් ද උන්වහන්සේ හැඳින්වෙනවා. බුදු සමය මෙන් ම ක්‍රිස්තියානි ධර්මය පිළිබඳ මනා අධ්‍යාපනයක් ලබා සිටි ගුණානන්ද මාහිමිපාණන් වහන්සේට භාෂා රැසක නිපුණත්වයක් වූවා. එසේ ම සුවිශේෂ කථන හැකියාවෙන් ද පරිපූර්ණ වුණා. අන්‍යාගමිකයන් සිදු කළ වැරැදි සහගත දෙසුම් සඳහා පිළිතුරු වශයෙන් ගුණානන්ද හිමියන් දේශනා හාර දහසක් පවත්වා ඇති බව කියැවෙනවා. එසේ ම පොත් පත් රාශියක් රචනා කොට, පුවත්පත් රාශියක් ද ආරම්භ කරවා තිබෙනවා.

33 පිටුවට ...

ගුණානන්ද මාහිමියන් වඩාත් ප්‍රසිද්ධ වන්නේ උන්වහන්සේගේ නායකත්වයෙන් සිදුවූ පංචමහා වාදය හේතුවෙනුයි. වර්ෂ 1865 වරාගොඩ වාදය සහ බද්දේගම වාදය, 1866 උදම්මිට වාදය, 1871 ගම්පොළ වාදය යන වාදයන්ට පසුව 1873දී වඩාත් ප්‍රසිද්ධ පානදුරා වාදය පවත්වන්නට යෙදුණා.

වර්ෂ 1873 ජූනි මස 12 වැනිදින පානදුරේ වැස්ලියන් දේවස්ථානයේ ඩාවිත් ද සිල්වා දේවගැතිතුමා සිදු කළ දේශනාවට පිළිතුරු වශයෙන් පානදුරේ විසූ ජෙරමියෙස් දියෙස් මැතිතුමා සහ කොරනේලිස් ප්‍රේරා කරුණාරත්න මැතිතුමා මුල් වී ගුණානන්ද හිමියන් පානදුරේ ගල්කන්දේ විහාරයට (නූතන රන්කොත් විහාරය) වැඩමවා ජූනි 19 වන දින පිළිතුරු දේශනයක් පැවැත්වූවා. මින් පසු කිතුණුවන් දෙසුමෙහි දායකත්වය දැරූ දායකයන් දෙදෙනාට ලිපියක් යවමින් වාදයක් සඳහා ආරාධනා කළා. බොදු පිළ එම ඇරයුම පිළි ගත්තා.

දෙපිරිසෙහි ම දායකවරු එකතු වී වාදය සඳහා වර්ෂ 1873 අගෝස්තු 26 සහ 28 වශයෙන් දින නියම කළා. වාදය කට වචනයෙන් සිදු කිරීමට, පවසන කරුණු මූලාශ්‍ර සහිත ව පෙන්වා දීමට , පිරිස සාමකාමී ව හැසිරවීමට කොන්දේසි සම්මත කරවා ගෙන තිබෙනවා. වාදය සඳහා මුදල් වියදම් කෙළේ ජෙරමියෙස් දියෙස් මැතිතුමා. ඔහුට අයත් පානදුර පට්ටියේ දෙඹගහවත්ත නම් ඉඩමෙහි සරසන ලද මඩුවක් තනා එහි උතුරු පස බෞද්ධයන් සඳහා ද, දකුණු පස කිතුණුවන් සඳහා ද වෙන් කරවූවා. යම් ලෙසකින් සාමය කඩවීමක් වුවහොත් පාලනය කිරීමට පොලිස් භට කණ්ඩායම් ද කැඳවා තිබුණා.

අගෝස්තු 26 වැනි දින පෙරවරුවේ 14 දෙනකුගෙන් යුත් බලඇණියක් සමඟ පොලිස් අණ දෙන නිලධාරියා පැමිණ කලකෝලාහලවලින් තොර ව සන්සුන් ව වාදය සිදු කරන ලෙස දෙපිරිසට ම දැන්වූවා. ක්‍රිස්තියානි පක්ෂය වෙනුවෙන් ජයසිංහ පාදිලිතුමා සහ බෞද්ධ පක්ෂය වෙනුවෙන් බුලත්ගම ධම්මාලංකාර සුමනතිස්ස මාහිමිපාණන් වහන්සේ නැඟී සිට සාමය ආරක්ෂා කරමින් දෙසුම පවත්වන ලෙස පිරිසට දැන්වූවා.

බෞද්ධයන් වෙනුවෙන් කථිකයා ලෙස ඉදිරිපත් වූයේ මිගෙට්ටුවත්තේ ගුණානන්ද හිමියන්. කරුණු සම්පාදනය ආදී සහය පළ කිරීමට හික්කඩුවේ ශ්‍රී සුමංගල නාහිමි, වැලිගම සුමංගල නාහිමි, වස්කඩුවේ සුභූති නාහිමි, රත්මලානේ ධර්මාලෝක නාහිමි, පොතුවිල ඉන්දජෝති මාහිමි, රන්දෙඹේ ධම්මාලංකාර මාහිමි, තලාහේනේ අමරමෝලි මාහිමි, මුල්ලේරියාවේ ගුණරතන මාහිමි, බටුවන්තුඩාවේ පඬිතුමා ඇතුළු සම්භාවනීය පිරිසක් පැමිණ සිටියා. කිතුණු පිළ වෙනුවෙන් ඩාවිත් ද සිල්වා පාදිලිතුමා සහ සිරිමාන්න කතිසේරුතුමා කථිකයන් වූ අතර ගුණවර්ධන, චාර්ල්ස් ද සිල්වා වැනි පාදිලිවරුන් සහයට පැමිණ සිටියා. වාදය පැවැත්වෙද්දී තුණ්ඩු මගින් අවශ්‍ය කරුණු කථිකයන්ට දැනුම් දුන්නා විනා සහයට පැමිණි පඬිවරු කථාවට ඉදිරිපත් නොවූ බවයි සඳහන් වන්නේ.

පෙරවරු අටට ඩාවිත් ද සිල්වා පාදිලිතුමා වාදය ආරම්භ කරමින් පැයක දෙසුමක් සිදු කළා . ඉන් පසු ගුණානන්ද මාහිමිපාණන් වහන්සේ පිළිතුරු දෙසුම සිදු කළා. දිවා විවේකයෙන් පසු සවස තුනට නැවත ඩාවිත් ද සිල්වා පාදිලිතුමන් දෙවැනි දෙසුම සිදු කළ පසු ගුණානන්ද මාහිමියන්ගේ දෙවැනි පිළිතුරු දෙසුම පැවැත්වුණා. මෙදින වාදය අවසන් නොවූ නිසා 28 වැනි දිනට වාදය කල් දමන්නට සිදු වුණා.


අගෝස්තු 28 වැනි දින පෙරවරු 8 ට සිරිමාන්න කතිසේරුතුමා දෙසුම පැවැත් වූ පසු ගුණානන්ද මාහිමිපාණන් වහන්සේ පිළිතුරු දෙසුම පැවැත්වූවා. නැවත අපරභාගයේ ඩාවිත් ද සිල්වා පාදිලිතුමන් සිව්වන දේශනය පැවැත් වූ පසු ගුණානන්ද මාහිමිපාණන් වහන්සේ පිළිතුරු දෙසුම සිදු කළා. බොදුණුවන් වාදයෙන් ජය ගත් බව ප්‍රත්‍යක්ෂ වූයේ මෙම දෙසුම අවසන් වන විටයි. ඒ සමඟ ම පැමිණ සිටි බොදුනුවන් සාධුකාර පැවැත්වූවා. සාධුකාරයෙන් පානදුරය ගිගුම් දුන් බවයි සඳහන් වන්නේ. එ බැවින් හික්කඩුවේ සුමංගල නාහිමියන්ගේ දැන්වීම පරිදි මිගෙට්ටුවත්තේ හිමියන් නැඟී සිට පිරිසට අත් ඔසවා සංඥා කළ හෙයින් සියල්ලෝ ම නිහඬ වූවා. සමකාලීන වාර්තා මගින් පැහැදිලි වන්නේ මෙම වාදය නැරඹීමට දහස් ගණන් පිරිසක් පැමිණ සිටිබවයි.

සෑම දේශකයකු විසින් ම ම පැයක කාලයක් දේශන සිදු කරනු ලැබුවා. වාදය වාර්තා කිරීමට ද බොහෝ පිරිසක් ඉදිරිපත් ව සිටියා.

කෝට්ටේ එඩ්වඩ් පෙරේරා මහතා ලවා වාද කථා ඉංග්‍රීසියට පරිවර්තනය කරවා තම පුවත්පතේ පළ කිරීමටත් සම්පූර්ණ වාදය පොතක් වශයෙන් පළ කරවා දෙස් විදෙස්හි බෙදා හැරීමටත් කටයුතු කළේ සිලෝන් ටයිම්ස්පුවත්පතේ කර්තෘ ජෝන් කැපර් මහතා විසිනු යි. මෙම පොත එකල ගාල්ලේ සිටි ජේ. ඇම්. පීබල්ස් මහතාවිසින් අමෙරිකාවට රැගෙන ගොස් බෞද්ධ පක්ෂය ජය ලැබූ බව දක්වා මුද්‍රණය කොට බෙදා හරිනු ලැබුවා.

එම පොත කියවීමෙන් සහ ලොන්ඩන් පියතුමා විසින් ලංකා මිත්‍රයා සඟරාවේ පළ කළ වාර්තාවල පරිවර්තන කියවීමෙන් සත්‍යයට වඩා උසස් ආගමක් නැත යනුවෙන් විශ්වාස කළ පරමවිඥනාර්ථවාදීන් ලෙසින් හඳුන්වන

“ දෙපිරිසෙහි ම දායකවරු එකතු වී වාදය සඳහා වර්ෂ 1873 අගෝස්තු 26 සහ 28 වශයෙන් දින නියම කළා. වාදය කට වචනයෙන් සිදු කිරීමට, පවසන කරුණු මූලාශ්‍ර සහිත ව පෙන්වා දීමට , පිරිස සාමකාමී ව හැසිරවීමට කොන්දේසි සම්මත කරවා ගෙන තිබෙනවා. වාදය සඳහා මුදල් වියදම් කෙළේ ජෙරමියෙස් දියෙස් මැතිතුමා. ”



පානදුරා වාදය දැක්වෙන කොටහේන දීපදුත්තමාරාමයේ සිතුවමක්

ලද අමෙරිකානු ජාතික සෙන්පති හෙන්රි ස්ටීල් ඕල්කට් තුමා සහ එතුමාගේ මිතුරියක වූ හෙලේනා පැට්‍රෝවිනා බ්ලැවැට්ස්කි මැතිණිය පානදුරා වාදයේ පුරෝගාමීන් හමු වීම සඳහා වර්ෂ 1880 දී ලංකාවට පැමිණියා. ඔවුන් ගාල්ලේ වැලිවත්තේ විජයානන්ද පිරුවනේ දී අක්මීමන ධම්මාරාම හිමියන් වෙතින් පන්සිල් සමාදන් ව බොදුනුවන් බවට පත් වූ බව කියැවෙනවා.

පරම විඥනාර්ථ බෞද්ධ සමාගම පිහිටුවීම, සරසවිසඳරැස පුවත්පත ආරම්භ කිරීම, බෞද්ධ පාසල් ආරම්භ කිරීම, වෙසක් පොහොය නිවාඩු දිනයක් බවට පත් කිරීම, බෞද්ධ කොඩිය ප්‍රමිතිගත කිරීම වැනි මෙහෙවර සමූහයක් ඕල්කට්තුමාගේ දායකත්වයෙන් සිදු වුණා. දෙඩන්දූවේ බෞද්ධ පාසල වැනි බෞද්ධ පාසල් මේ වන විටත් ලංකාවේ පැවතුණ ද යුරෝපීයයන්ගේ පාසල් සමග උරෙනුර ගැටීමට හැකි මට්ටමේ ගුණාත්මක අධ්‍යාපනයක් ලබා දිය හැකි ආනන්ද, නාලන්දා, මහින්ද, ධර්මරාජ, විශාඛා, මියුසියස්, මහාමායා වැනි පාසල් බිහි කිරීමේ ගෞරවය ඕල්කට්තුමා වෙත හිමි වෙනවා. ඕල්කට්තුමා ගමින් ගම යමින් දෙසුම් පවත්වද්දී ඒවා සිංහලට පරිවර්තනය කරන ලද්දේ එවක තරුණයකු වූ අනගාරික ධර්මපාලතුමායි. සුදු ජාතිකයකු නිසා ඕල්කට්තුමා හරහා බොදුනුවන් වෙනුවෙන් කළ ඉල්ලීම් වෙනුවෙන් මෙරට ඉංග්‍රීසි ආණ්ඩුකාරවරයා මෙන්ම බ්‍රිතාන්‍යයේ යටත් විජිත භාර ලේකම්වරයා ද යහපත් ප්‍රතිචාර දැක්වූ බවයි පැවසෙන්නේ. වර්ෂ 1892 ගාල්ලේ වැලිවත්තේ විජයානන්ද විහාරයේ ලක්දිව ප්‍රථම ඉරුදින දහම් පාසල ආරම්භ කොට දහම් පාසල් සේවය ආරම්භ කිරීම ද ඕල්කට් තුමාගේ මෙහෙවරට අයත් වෙනවා. පසුකාලීන වාර්තා අනුව හික්කඩුවේ නාහිමි, මිගෙට්ටුවත්තේ නාහිමි, ධර්මපාලතුමා වැනි ස්වදේශික වීරවරයන් ගමන් ගත් මඟින් ඇත්ව ඕල්කට්තුමන් කටයුතු කළ ද මුල් වකවානුවේ එතුමාගේ මෙහෙවර සුවිශේෂී වෙනවා.

මිගෙට්ටුවත්තේ මාහිමියන් අපවත් වීමෙන් පසු උන්වහන්සේගේ ශිෂ්‍ය වූ මිගෙට්ටුවත්තේ ජනානන්ද මාහිමියන්ගේ මූලිකත්වයෙන් ඔරුගොඩවත්තේ දී වාදයක් පවත්වා තිබෙනවා.

බෞද්ධ පුනර්ජීවන ව්‍යාපාරය සම්පූර්ණයෙන් ශක්තිමත් වීම පානදුරාවාදයේ ප්‍රතිඵලය වශයෙන් සඳහන් කළ හැකියි. මිථ්‍යා මත පරාජය කිරීම සේ ම, ප්‍රාචීන අධ්‍යාපනය පුළුල් වීමට ද මෙම වාදයන් හේතු වුණා. බෞද්ධ දානපතීන්ගේ උපකාර ලබමින් බෞද්ධ පොත්, දහම් පත්‍රිකා මුද්‍රණය වෙමින් බුදුදහම සන්නිවේදනය කිරීම වැඩි දියුණු වුණා. දෙස, බස, දැය, සමය පිළිබඳ අභිමානවත් පුරවැසියන් බිහිවීමට පානදුරාවාදය ලබා දුන් දායකත්වය බොහෝ සුවිශේෂී වනවා.

දිමුතු පුන්සර ලියනගේ

02 පිටුවෙන් ...

## චීවර මාසය ඇරඹෙන ...

### වස් එළඹීම

පසුව බුදුරජාණන් වහන්සේ මේ කෙරෙහි දැඩි අවධානයක් යොමු කොට මෙසේ දේශනා කළහ.

අනුජානාමි භික්ඛවෙ වස්සං උපගන්තුං

මහණෙනි, මම වස් එළඹෙන්නට අනු දනිමි. එකල්හි 'කවදා වස් එළඹිය යුතු දැ'යි විමසීමට භික්ෂූන් වහන්සේලාට සිත් වූ හෙයින් එය බුදුරදුන් වෙත සැළකර සිටියහ. එවිට බුදුරදුන් වදාළේ මෙසේ ය.

අනුජානාමි භික්ඛවෙ වස්සානෙ වස්සං උපගන්තුං

මහණෙනි, වස්සාන ඍතුවෙහි වස් එළඹෙන්නට අනුදනිමි.

### දුෂ්කර ගමනක්

පාවා නුවර භික්ෂූන් වහන්සේලා තිස් නමක් සාකේත නුවර වස් වසා සැවැත්නුවර බලා වැඩම වීමේ දී බලවත් දුෂ්කරතාවකට පත් වූ හ. එනම් වැස්සෙන් තෙමී දියෙන් තෙත් ව ගිය සිවුරුවලින් යුතුව ගොහොරු මඩෙහි ගමන් ගැනීමට සිදුවීමයි. සැවැත් නුවර ජේතවනාරාමයට වැඩමවන විට උන්වහන්සේලා ක්ලාන්ත ස්වභාවයක් පෙන්නුම් කළහ.

### කඨින චීවරය

මිත් මතු සියලු ම භික්ෂූන් වහන්සේලාට මෙවන් දුෂ්කරතාවන් හි දී තරමක පහසුවක් ඇති කිරීම සඳහා බුදුරජාණන් වහන්සේ කඨින ස්තරණ විනය කර්මය මෙසේ අනුදැන වදාළහ.

අනුජානාමි භික්ඛවෙ වස්සං වුත්ථානං

භික්ඛූනං කඨිනං අත්ථරිතුං

මහණෙනි, වස් වැස නිම කළ භික්ෂූන්ට කඨින ඇතිරීම අනුදනිමි.

මෙතැන් සිට භික්ෂූන් වහන්සේලා ට අතිරේක චීවරයක් ලෙස කඨින චීවර පරිභෝග කිරීමට අවස්ථාව උදා වුණි. භික්ෂූන් වහන්සේලා සහ සැදැහැවත් ගිහි සමාජ අතර මනා සබැඳියාවක් ඇති වූයේත්, ආරාමික දිවිපෙවෙත ක්‍රමානුකූල පදනමක් ඔස්සේ සංවර්ධනය වූයේත් වස් විසීමේ ප්‍රතිඵලයක් ලෙස යි.

26 පිටුවෙන් ...

## උත්තරීතර පතිදමක ...

ඒ යශෝධරාව තුළ පැවැති අප්‍රමාණ භක්තිය යි. සිද්ධාර්ථ කුමාරයාණන් කුමන ආකාරයේ ජීවිතයක් ගත කරනවා ද? යනුවෙන් ඇය විමසා බැලූ ආකාරය යි. මන්ද්‍රි දේවිය ලෙස සිටි ආත්ම භවයෙහි දී දරුවන් සමඟ වනගත වූවා මෙන් මේ ආත්මයෙහිදීත් රාහුල කුමරා රැගෙන වනගත වූ වා නම්, කළ හැකි හොඳම දෙය වුවත්, එසේ කළ නොහැකි වීම යශෝධරාවට තිබුණ එකම දුකයි. එම නිසා සිද්ධාර්ථ කුමාරා කේශ කලාපය කපා දැමූ පුවත දැනගත් යශෝධරාවෝ තමාගේ කේශ කලාපය ද කපා දැමූවා ය. කසාවත පොරවාගත් බව දැනගත් ඇය ද කසාවත පොරවා ගත්තා ය. ඉතාම රළු ආහාරයෙන් යැපෙන බව දැනගත් ඇය රාජ භෝජනයෙන් ඉවත් ව ඉතාම රළු ආහාරවලට හුරුපුරුදු වූවා ය. ගල් පර්වත ගස් යට නිදන බවට ආරංචිවීමත් සමඟ ඇ සිරියහනෙන් බිමට බැස බිම නිදාගැනීමට තරම් කටයුතු කිරීම තුළින් ස්වාමි දියණියක් ස්වාමිපුරුෂයාගේ ගමනට ධෛර්යය ලබාදුන් ආකාරය කෙතරම් උත්තරීතර ද? යන වග යශෝධරා වත කාව්‍යයෙන් ගෞරවනීය ලෙස දක්වා ඇත.

මෙවැනි දේ කියවමින් රස විඳිනවා නම්, වර්තමාන කාන්තා පරපුර නොමඟ යන්නේ නැත.

ශාස්ත්‍රීය වශයෙන් පිරිහීමක් පැවැති මහනුවර යුගයේ දී කාන්තාවට පවුල් ජීවිතය යහපත් ලෙස ගොඩනගන්නට උපදෙස් දෙන්නට ජන කවියාට යශෝධරා චරිතය හැර වෙනත් මඟක් තිබුණේ නැත. යශෝධරාවගේ චරිතය ජන කාව්‍යයක් ලෙස නිර්මාණය කරන්නට එය හේතුවක් වන්නට ඇත.

25 පිටුවෙන් ...

## වෙසක් පෝදා නිවාඩුව ...

කිතුනු බැතිමතකු වුවත් ඔහු බුදුදහම පිළිබඳ විසාරදයෙක් කිව්වොත් එය වැරැදි නැහැ. ධම්ම පදය ගැන ඔහුට හොඳ දැනුමක් තිබුණා. ඒ වගේ ම භගවත් ගීතාව ගැනත්, බයිබලය ගැනත්, ශුද්ධ වූ කුරාණය ගැනත්, ලක්ෂමන් කදිර්ගාමර් මහතා තුළ තිබූ දැනුම ඉහළයි.

ජනවාර්ගික අර්බුදයට යුද්ධය වෙනුවට සාමය ඇරඹීම සහ සංවර්ධනය සඳහා මෙරටට හිතකර ජාත්‍යන්තර සබඳතා ගොඩනඟා ගැනීමට ඔහු අතිවිශාල මෙහෙයක් කළා.

සාම ක්‍රියාදාමය ඔස්සේ ඔහු කතාබහට ලක් කළ විශේෂ කරුණ වන්නේ ප්‍රජාතාන්ත්‍රවාදී මානව අයිතීන් පිළිබඳව යි. ඔහු ඍජුව ම ප්‍රකාශ කළේ ශ්‍රී ලංකාව තුළ සුළු ජාතීන්ගේ ආරක්ෂාව සුරක්ෂිත වන බවයි. ලක්ෂමන් කදිරගාමර්ගේ විශ්වාසය වූයේ ප්‍රශ්න පිළිබඳ කතා කිරීමේ දී එය සිංහල හෝ දෙමළ ප්‍රශ්න ලෙස නොව ඒවා ලාංකීය ජනතා ප්‍රශ්න බවයි. උතුරු නැගෙනහිර පළාත්, ඒ ප්‍රදේශවල සිටින ජනතාවගේ බවට වූ ප්‍රකාශය ලක්ෂ මන් කදිර්ගාමර් මහතා ප්‍රතික්ෂෙප කළා. ඒ ගැන ඔහුගේ අදහස වූයේ සියලු ජනතාවගේ අයිතීන් නිදහස හා ආරක්ෂාව රටේ සියලු තැනක දී ම රජය විසින් ආරක්ෂා කරදිය යුතු බවයි.

ශ්‍රී ලංකා ආණ්ඩුව හා දෙමළ කොටි සංවිධානය අතර එදිරිවාදිකම් අත්හිටු වීම පිණිස එකඟතා ගිවිසුම් සකස් කිරීමේ දී රටේ ස්වෛරී භාවයට අහිතකර විය හැකි එහි බොහෝ වගන්ති පිළිබඳ පැහැදිලි කරන ලද්දේ ද ලක්ෂමන් කදිර්ගාමර් විසින්.

රට බෙදීමට විරුද්ධ ව කතා කළ කදිරගාමර් මහතා නිරතුරුව ම ඒකීය ශ්‍රී ලංකාවක් යන මතය අන්තර්ජාතික ප්‍රජාව හමුවේ ගෙන යාමට කටයුතු කළා. එයින් උරණ වූ බෙදුම්වාදී ත්‍රස්තවාදීන් විසින් 2005 වසරේ අගෝස්තු 12 වැනි දින ඔහුගේ නිවසේ නාන තටාකයේ සිටි ඔහු ඝාතනය කෙළේ ස්නයිපර් වෙඩි ප්‍රහාරවලින්.

සාමයට දැනදිගු කළ, විශේෂයෙන් බෞද්ධකම එසවීමට කටයුතු කළ අසහාය යුග පුරුෂයකු අපට එලෙසින් අහිමි වුණා.

07 පිටුවෙන් ...

## බුදුරජාණන් වහන්සේ ...

උදය බමුණා –

භවත් ගෝතමයෝ අපගර්භයෝ වෙද්ද?

බුදුරජාණන් වහන්සේ – එසේ ය බ්‍රාහ්මණය. මම "අපගර්භ" වෙමි. ඒ ඔබගේ හැඟීම අනුව නොවේ. යමෙකු මතු මවුකුසක පිළිසිඳ ගන්නා බව එනම්, නැවත භවයෙහි ඉපදීම පහ කළේ ද ඔහුට අපගබ්භ යැයි කියමි. සම්මා සම්බුද්ධත්වයට පැමිණීමෙන් තථාගතයන් වහන්සේ ද මතු මවුකුසක සයනය කිරීම, නැවත භවයෙහි ඉපදීම, පුනර්භවය ප්‍රහාණය කළ සේක. එම නිසා මම අපගර්භ නම් වෙමි. (අයමන්තිමා ජාති නත්ථිදානි පුනබ්භවෝ) මෙසේ බුදුන් කරා එළඹුණු වේරඤ්ජා වැසි බ්‍රාහ්මණයාගේ ඉහත දැක් වූ අටවැදෑරුම් ආක්‍රෝශ වස්තූන් වෙනත් ආකාරයකින් දක්වා නිෂ්ප්‍රභ කළ සේක.

නැවත මහා කාරුණික බුදුරජාණන් වහන්සේ තාදී ගුණය ප්‍රකට කරමින් ඔහුගේ සසර ගමන නිම කිරීමට ආධාර වන පරිදි ධර්ම දේශනා කළහ. බුදුරදුන් විසින් දේශනා ප්‍රශ්න මාලාවක් ඉදිරිපත් කර විසඳමින් විවරණය කරමින් පුබ්බේනිවාසානුස්සති ඤාණය, දිබ්බ චක්ඛු ඤාණය හා ආසවක්ඛය ඤාණය උපදවා සම්මා සම්බුද්ධත්වයට පැමිණි ආකාරය පැහැදිලි කර දුන් සේක. සියලු සර්වඥ ගුණයන් ප්‍රකාශ කොට තමන් වහන්සේගේ ආර්ය ජාතියෙහි ජ්‍යෙෂ්ඨ භාවය හා ශ්‍රේෂ්ඨ භාවය ද වටහා දුන් සේක.

එම ධර්ම දේශනාව ඇසීමෙන් අතිශය ප්‍රීතියට පැමිණි බ්‍රාහ්මණයා බුදුන් වහන්සේට ස්තුති කළේ ය. තෙරුවන් කෙරෙහි පැහැදුණු, දිවි හිමි කොට තෙරුවන් සරණ ගිය උපාසකයෙක් විය. භවත් ගෞතමයන් වහන්ස මේ වේරඤ්ජා නුවර වස් විසීම ඉවසන සේක්වා. තෙමසක් වේරඤ්ජාව ඇසුරු කොට මට අනුග්‍රහ පිණිස වස් විසීම ඉවසන සේක්වායි කළ ආරාධනය බ්‍රාහ්මණයාට අනුග්‍රහ පිණිස තුෂ්නිම්භාවයෙන් ඉවසා වදාළ සේක.

05 පිටුවෙන් ...

## කඨින චීවර පූජාවේ

පෙරවස් විසූ භික්ෂුව එම වස් කාලයෙහි සිහියෙන් ගත කොට සසර කෙළවර කර ගැනීමේ උත්සාහයක යෙදීම ඉතා වැදගත් කරුණක්. මෙහි දී උන්වහන්සේ තමන් වහන්සේ වස් විසූ සෙනසුනෙහි වාසය කරමින් තමන් වහන්සේ මෙලොව පරලොව සුගතිය පිණිස හේතුවන කල්ක්‍රියාවෙන් යුතුව ගත කරමින් ඒ කාලය තුළ දායක පක්ෂය විසින් උන්වහන්සේගේ එම උදාර අරමුණ සඵල කර ගැනීමට ක්‍රියා කරනවා වගේ ම දායක පක්ෂයේ දී මොලොව පරලොව යහපත පිණිස අවවාද අනුශාසනා දෙමින් ක්‍රියා කළ යුතු වෙනවා. අද වෙහෙර විහාරස්ථානවල වස් කාලය තුළ බහුල වශයෙන් සිදු කෙරෙන්නේ බෝධි පූජාවන්ට මුල් තැන දෙමින් ඒ මගින් දායක පක්ෂයේ නම් ගම් කියමින් ඔවුන් ඉස්මතු කොට තබමින් සිදු කරන ක්‍රියාවලියක්. එමෙන් ම ඒ අතර විවිධ පැතුම් ඉටු කර ගැනුමට නම් ගම් කියමින් සිදු කෙරෙන ආශිර්වාද වාක්‍යය ද අපට අසන්නට ලැබෙනවා. සැබවින් ම මේ මගින් සිදු වන්නේ කෙලෙස් සිතිවිලි බහුල කරවීම යි. ඒ තුළින් දායක පක්ෂය විසින් වස් කාලය තුළ ගත කළ යුතු සසර කෙටි කර ගැනීමේ මාර්ගයෙන් බැහැර වීමක් සිදු වෙනවා. ඉතින් මෙහි දී පැහැදිලිව පෙන්වාදිය යුතු වන්නේ කඨින චීවර දායක පිරිසත්, කඨින චීවර ප්‍රතිග්‍රාහක උපසම්පන්න වස් විසූ භික්ෂූන් වහන්සේ ත් යන දෙපක්ෂය ම ඉතා පරිස්සමෙන්, සිහියෙන් යුතුව සිදු කර ගත යුතු තත්වයක පවතින කඨින පින්කමේ ගැඹුර හරි හැටි අවබෝධ කර ගෙන මේ පින්කම සිදු කර ගතහොත් අපගේ සසරදිවිපැවැත්ම සැපවත් කර ගැනුමටත්, කෙලෙස් නසා නිවන් අවබෝධ කර සසර ගමන අවසන් කර ගැනුමටත් හේතු වන බව අවසාන වශයෙන් තේරුම් ගෙන ක්‍රියා කළ යුතු වන බවයි.

09 පිටුවෙන් ...

## පිඬු සිඟා වඩින

භික්ෂුවකට තම නිවෙස් දොර වෙත පිඬුසිඟා වැඩීමට සිත් පහළ වන තරමට ගිහියාගේ හැසිරීම් සමුදාය සකසා ගත යුතු වන අතර ඉහත දැක් වූ කරුණු අනුව ගිහි ප්‍රජාව තම චරිතය දෙස විමසා ඉතා යහපත් ආකාරයෙන් භික්ෂූන්ට සැළකීම හා ගෞරව දැක්වීම ඉමහත් සමාජ මෙහෙවරක් ද වේ. තම තමා පුරනු ලබන යහගුණයන් කෙදිනක හෝ පාරමිතාවක් වී තමාට ම යහපත ගෙන දෙන බව සිත්හි තබා සංඝ රත්නය විෂයයෙහි ගෞරවයෙන් පිළිපැදීමට සියල්ලන් ම කාරුණික විය යුතු ය. එය තමා ම තමාගේ යහපත උදාකර ගැනීමක් වන අතර සාසන ප්‍රතිපදාවේ චිර ජීවනයට ද හේතු වේ.

# මියුරු පද අරුත් අම ගෙන දෙන ලොවට කවුරු සදිසි වෙති මෙලකට එ යතිඳුට

**ජයබාහු කුමරු උපත ලැබුවේ ඉතා කලාතුරකින් එළඹෙන ග්‍රහයෝගයකින්. ඒ, 1408 වසරේ මැයි මාසයේ අට වැනි දා. එකල නක්ෂත්‍ර ආචාරීන්ගේ අනාවැකිය වූයේ, මේ දරුවා ගිහි ව විසුවොත් රජවන බව යි. පැවිදි දිවියට පිවිසුණහොත් ඒ හා සමාන උසස් තත්ත්වයකට පත්වන බව යි. එකල දකුණුලක බාර ව සිටියේ ජයබාහු කුමරුගේ පියාණන්. ඔහු වීරබාහු කුමරුයි. මව ස්වර්ණවතී. සීලවතී දේවිය නමින් වූයේ ද ඇයයි. තම පියා වූ වීරබාහු කුමරුගේ අකල් වියෝවෙන් පසු ජයබාහු කුමරු හැදී වැඩුණේ කෝට්ටේ හයවන පරාක්‍රමබාහු රජු ළඟයි.**

එදා, සත් හැවිරිදි කුඩා දරුවකු ව සිටිය දී ජයබාහු කුමරු සිය මෑණියන් සමඟ හයවන පරාක්‍රමබාහු රජු මුණගැසීමට පැමිණියා. රජු, කුඩා කුමරුගෙන් හා මවගෙන් සැප දුක් විමසුවා. මේ පුංචි දරුවා දුන්නේ අපූරු පිළිතුරක්.

"මා වැනි බිළින්දා -වර වර ළඟට කැන්දා
දුක් සැප කුමන්දා- අසන නිරිඳෝ වෙන කොයින්දා"

සත් හැවිරිදි දරුවකුගෙන් රජු මෙවන් හපන්කමක් කිසිසේත් ම බලාපොරොත්තු වූයේ නෑ. රජු, ජයබාහු කුමරු පුත්‍ර ස්නේහයෙන් හදා වඩා ගැනීමට භාර දෙන මෙන් ස්වර්ණවතී දේවියගෙන් ඉල්ලා සිටියා. කුමරුට පිය සෙනෙහස හා රැකවරණය ද ඇවැසි වුණා. ඒ බව තේරුම් ගත් ස්වර්ණවතී දේවිය ඒ ඉල්ලීමට කැමැති වූවා. දරු සම්පත් තිබුණත් හයවන පරාක්‍රමබාහු රජතුමාට පිරිමි දරුවකු සිටියේ නෑ. දියණියන් දෙදෙනෙක් පමණක් වූවා. රජු තම භාරයට ගත් ජයබාහු කුමරු හදාවඩා ගත්තේ අප්‍රමාණ පුත්‍ර ස්නේහයකිනුයි.

ඒ ක්‍රි. වර්ෂ 1425 වසරයි. එවක ජයබාහු කුමරුගේ වයස අවුරුදු 17 ක්. සිය මෑණියන්ගේ ද ආශිර්වාද ඇතිව ජයබාහු කුමරු පැවිදි වීමට තීරණය කළා. ඒ අනුව දෙමටාටගම වාචිස්සර නමින් උතුම් වූ ප්‍රව්‍රජ්‍යාභාවයට පත් වූයේ කැරගල වනරතන සංඝරාජ හිමියන්ගේ ආචාර්යත්වයෙනුයි. උන්වහන්සේ උතුම් උපසම්පදාවට පත් වූයේ 1438 වසරේදී යි.

වාචිස්සර හිමියන්ගේ මුල් පන්සල වන්නේ ද ස්වකීය මුත්තණුවන් වූ උත්තරමූල රාහුල හිමියන්ගේ මුල් පන්සල වූ ප්‍රතිරාජ පිරිවෙණ බද ගණේගොඩැල්ල විහාරස්ථානයයි. මෙම විහාරස්ථානය ඉදිකොට ප්‍රදේශය දැදියුණු කොට ඇත්තේ දේවපතිරාජ නම් ඇමතිවරයා විසින්. පසුව එම විහාරස්ථානය අනෝමදස්සි හා වේදේහ යන මහ තෙරුන් වහන්සේලා වෙත පූජා කොට තිබෙනවා. වාචිස්සර හිමි ද මෙම විහාරස්ථානයට පැමිණ එම ප්‍රතිරාජ පිරිවෙනින් අධ්‍යාපනය ලැබුවා. සයවන පරාක්‍රමබාහු රජතුමා විසින් වාචිස්සර හිමියන්ට ආධාර පිණිස මෙම ප්‍රදේශයේ තිබූ සශ්‍රීක කුඹුරක් වූ මහවෙල හා ගොඩපිටිය ගම ද උත්තරමූල රාහුල හිමියන්ට පූජා කරනු ලැබුවා. උත්තරමූල හිමියන්ගේ ඇවෑමෙන් තොටගමු පිරිවෙන

> සත් හැවිරිදි දරුවකුගෙන් රජු මෙවන් හපන්කමක් කිසිසේත් ම බලාපොරොත්තු වූයේ නෑ. රජු, ජයබාහු කුමරු පුත්‍ර ස්නේහයෙන් හදා වඩා ගැනීමට භාර දෙන මෙන් ස්වර්ණවතී දේවියගෙන් ඉල්ලා සිටියා.





හා විහාරයේ අධිපතීන් වහන්සේ ලෙස රජතුමා විසින් පත්කරනු ලැබුවේ එවකට ගණේගොඩැල්ල පන්සලේ වැඩ සිටි වාචිස්සර ස්වාමීන් වහන්සේ යි. එම පිරිවෙන රජයේ කීර්තිමත් අධ්‍යාපන ආයතනයක් බවට පත් වන්නේ ද මෙයින් පසුවයි. විජයබාහු පිරිවෙන එකල තෙල්වත්තේ රත්පත් වෙහෙර නමින් ද හඳුන්වා තිබෙනවා.

උත්තරමූල හිමියන්ගේ අපවත්වීමෙන් පසු වාචිස්සර හිමියන් , තම මුත්තණුවන් වූ ශ්‍රී රාහුල හිමියන්ගේ නාමය, ස්වකීය නමට එකතු කර ගත්තා. ඒ වගේ ම තොටගමුවේ පිරිවෙනෙහි වැඩසිටි හෙයින් උන්වහන්සේ තොටගමුවේ ශ්‍රී රාහුල හිමි නමින් ද හැඳින්වූවා.

තොටගමුවේ ශ්‍රී රාහුල හිමියන් සතු මතක ශක්තිය විශ්මයජනක වූවා. ඒ පිළිබඳ අපූරු ජන ප්‍රවාදයක් ද වෙනවා.

"දිනක් වීදාගම හිමි ධර්ම දේශනයකට වැඩම කිරීමට පෙර බලගතු සරස්වතී තෙල් බඳුනකට අශ්ව කෙන්දක් දමා එය සත් වරක් ගසා දමා දිවේ ගා ගන්නා ආකාරය කුඩා රාහුල හිමි බලා සිටියා. වීදාගම ගුරු හිමියන් විහාරයෙන් පිටත් වූ සැනින් රාහුල හිමි කළේ එම තෙල් බඳුන ගෙන පානය කිරීමයි. එය බලවත් ඖෂධයක් වූ බැවින් රාහුල හිමි සිහිමූර්ජා තත්වයට පත්ව ඇද වැටී තිබෙනවා. වහාම මේ බව ගුරුහිමියන්ට දැන්වූයෙන් සැණෙකින් ආපසු පැමිණ උන්වහන්සේ විසින් රාහුල හිමි බෙහෙත් ඔරුවක දමා සුවපත් කරනු ලැබුවා. මේ ඖෂධයේ බලගතුකම නිසා කුඩා රාහුල හිමි මතක ශක්තියෙන් අගතැන්පත් වූ බව මෙම ජනප්‍රවාදයෙන් කියැවෙනවා.

තොටගමුවේ ශ්‍රී රාහුල හිමි ගෞරව සම්මානයට පාත්‍ර වන්නේ

"ෂඩ් භාෂා පරමේශ්වර" යන නාමයෙන්. එයට හේතුව වූයේ සංස්කෘත, ප්‍රාකෘත, මාගධී ෂෛශාචි, සෞරසේනි, අප්‍රභංශ යන භාෂා පිළිබඳ පෘථුල දැනුමක් උන්වහන්සේ සතු වීමයි. ඒ වගේ ම ත්‍රිපිටක වාගීශ්වරාචාර්ය" යන ගෞරව නාමය ද උන්වහන්සේට හිමි වනවා. ශ්‍රී රාහුල හිමි ස්වකීය පාණ්ඩිත්‍යය කාව්‍යශේඛරයේ දී දක්වන්නේ මහත් අභිමානයෙන් යුතුව යි.

ශ්‍රී රාහුල හිමි විජයබා පිරිවෙණෙහි වැඩ වසමින් සිදු කළ ශාස්ත්‍රීය සේවාව මෙරට ට පමණක් සීමා වූවක් නොවේ. නොයෙක් ශාස්ත්‍රයන් හි දැනුමැති විදේශිකයන් අතර පවා උන්වහන්සේ බොහෝ ප්‍රචලිත වූවා. රාහුල හිමියන්ගේ දැනුම් සම්භාරයට සම කළ හැකි අන් කිසිවෙක් මෙරට නොවූ බව යි පැවසෙන්නේ.

ගිරා සංදේශයේ සඳහන් මෙම කවෙන් ම ඒ බව පැහැදිලි වෙනවා.

"ගැඹුරු විජම් පෙළ කිරි සයුර ඇමවිට
සොඳුරු නුවණ වෙර පහරින් සකොබ කොට
මියුරු පද අරුත් අම ගෙන දෙන ලොවට
කවුරු සදිසි වෙති මෙලකට එ යතිඳුට"

ශ්‍රී රාහුල හිමියන්ගේ භාෂා සාහිත්‍ය සේවාව සොයා බැලීමේ දී උන්වහන්සේ විසින් රචනා කරන ලද ග්‍රන්ථ සමූහය ඉතා වැදගත් වෙනවා.

පරෙවි සංදේශය, කාව්‍ය සංදේශය, සැලලිහිණි සංදේශය, පංචිකාප්‍රදීපය, වුත්තමාලාව, යෝගරත්නාකරයයි.

භාෂා සාහිත්‍යයට පමණක් නොව ජ්‍යොතිෂය සම්බන්ධයෙන් ද එකල මූලස්ථානයක් වූයේ තොටගමුව හා වීදාගම යි. ශ්‍රී රාහුල හිමියන්ගේ ශිෂ්‍ය වැත්තෑවේ හිමියන් විසින් ලියූ ගුත්තිල කාව්‍යයට, සිංහල කාව්‍ය ග්‍රන්ථාවලියේ වැදගත් තැනක් හිමි වෙනවා. මෙම කාල වකවානුව තුළ ගිරා සංදේශය ලියා ඇත්තේ ද වැත්තෑවේ හිමියන් බව ද කියැවෙනවා. ශ්‍රී රාහුල හිමියන් සේ ම ශිෂ්‍ය වැත්තෑවේ හිමියන් ද සිංහල සාහිත්‍යයට කළ සේවය ඉතා විශිෂ්ට මට්ටමක පැවති බව මේ අනුව පැහැදිලි වනවා.

තොටගමුවේ ශ්‍රී රාහුල හිමියන් අවසාන කාලය වැඩසිටියේ අම්බන ඉඳුරුගල ලෙන් විහාරය ආශ්‍රිතව යි. උන්වහන්සේ අපවත්වීමෙන් පසු ශ්‍රී දේහය ලෙනෙහි තබා ප්‍රදේශයේ ජනතාව විසින් නිති වැඳුම් පිදුම් කරනු ලැබුවා. උන්වහන්සේ ජීවත් ව සිටිය දී "සිද්ධායුලෝක රසායනය" නමැති තෙලක් භාවිතා කළ හෙයින් ශ්‍රී දේහය වසර 2712 ක් නරක් නොවී තිබිය යුතු බවට විශ්වාසයක් තිබෙනවා. ශ්‍රී රාහුල හිමියන්ගේ දේහය ගෝවට රැගෙන ගිය පසු අම්බන ප්‍රදේශය ම පාලු වී ජන ශූන්‍ය වූ බව ද කියැවෙනවා.

දීපා පෙරේරා




# සම්බුදු පා පහසින් සුපූජනීයවත් වූ මහියංගණ රාජමහා විහාරය

බුදුරජාණන් වහන්සේගේ පළමු ලංකාගමනයේ දී සම්බුද්ධ පාදස්පර්ශයෙන් පූජනීයත්වයට පත් වූ පින් බිමකි මහියංගණ රාජමහා විහාරය. සොළොස්මස්ථාන අතර මුල් තැනට පමිණෙන මේ උතුම් පුණ්‍ය භූමිය පිහිටා තිබෙන්නේ මහවැලි ගඟබඩ පුරාණ බින්තැන්න ජනපදයට අයත් සීමාවේ යි. තැනිතලා බිම් පෙදෙස බිම්තැන්න හෙවත් බින්තැන්න ලෙස හඳුන්වා තිබෙනවා. මහී යනු පොළෝතලය යි. අංගන යනු තැනිතලාව යි. මධ්‍යම කඳුකරයෙන් නැඟෙනහිර දෙස තැනිතලා බිමට පාලියෙන් මහියංගනය ලෙස ව්‍යවහාර කර තිබෙනවා. මහියංගණය, මියුගුණ ලෙස ද හැඳින්වෙනවා.

බුදු රජාණන් වහන්සේ තුන් බෑ ජටිලයන් දමනය කිරීමෙන් පසු මතු කාලයේ සම්බුදු සසුන බබළන ලක්දිවින් යක්ෂ ගෝත්‍රිකයන් බැහැර කිරීමට කටයුතු කරනවා. එදා මනෝරම්‍ය ගංතෙර යොදුන් තුනක් දිගු වූ, යොදුනක් පුළුල් වූ මහා නාග වන උයනෙහි රාත්‍රී කාලයේ යක්ෂයන් එක් රැස් වී සිටියා. තථාගතයන් වහන්සේ එම භූමියට වැඩම කළා. මහියංගන සෑ රදුන් පිහිටි ස්ථානයේ අහසෙහි වැඩ හිඳිමින් යක්ෂ යන් බිය වන අන්දමට වර්ෂා, වාත අන්ධකාර මවා පා යක්ෂයන් බිය වද්දා ගිරි දිවයිනට පළවා හැරියා. මේ බව මහාවංසයේ සඳහන් වෙනවා. තවත් පිරිසක් පවසන්නේ රැස්වීමක් හෝ ප්‍රීති උත්සවයක් ලෙස යි. ඇතැම් වියතුන්ගේ මතය නම් සම්බුද්ධත්වයට පත්, නව අරහාදී බුදු ගුණයන්ගෙන් සපිරි බුදුරජාණන් වහන්සේ යක්ෂයන් බිය වැද්දීම්, පළවා හැරීම් සිදු කළා යැයි පැවසීම මහාවංස කතුවරයාගේ අතිශයෝක්ති කථනයක් බවයි.

යක්ෂ දමනයෙන් පසු බුදුරදුන්ගෙන් බණ අසා සෝවාන් ඵලයට පැමිණි දේවතාවුන් අතර සිටි සෝවාන් වූ සුමන සමන් දෙවිඳුන් පූජනීය වස්තුවක් ඉල්ලා සිටියා. බුදුරජාණන් වහන්සේ හිස පිරිමැද නීලවර්ණ කෙස් අත්ලක් සුමන සමන් දෙවිඳුන්ට පිරිනැමුවා. සුමන සමන් දිව්‍ය රාජයා ස්වර්ණමය කරඬුවක කේශධාතූන් වහන්සේ වඩා හිඳුවා ඉන්ද්‍රනීල මාණික්‍යයෙන් සත් රියන් උසැති මහියංගන දාගැබ තැනවූවා.

සම්බුද්ධ පරිනිර්වාණයෙන් පසු ශ්‍රී දේහය ආදාහනය කළ අවස්ථාවෙහි සැරියුත් තෙරුන්ගේ ශිෂ්‍ය වූ සරභූ මහ රහතන් වහන්සේ දැල්වෙන දර සෑයෙන් බුදුරදුන්ගේ ග්‍රීවා ධාතූන් වහන්සේ රැගෙන ලක්දිවට වැඩම කළා. එම ධාතූන් වහන්සේ මහියංගණ දාගැබෙහි නිධන් කොට මේදෝවර්ණ පාෂාණයෙන් දොළොස් රියන් උසට දාගැබ විශාල කොට බැඳවූවා. එම සෑ රදුන් වට කොට තිස් රියන් උස් චෛත්‍යයක් කරවන ලද්දේ දේවානම් පියතිස්ස රජතුමාගේ සහෝදර උද්ධචූලාභ කුමරු බවයි පැවසෙන්නේ.

සතුරන් මැඩ ත්‍රි සිංහලය එක්සේසත් කිරීම පිණිස දුටුගැමුණු රජතුමා සේනා පිරිවරා මාගම සිට අනුරාධපුරයට පැමිණියා. ඒ යන ගමනේ දී මහවැලි ගඟෙන් එතෙර ව පිහිටි රටට ඇතුළු ව මහියංගණයේ ඡත්‍ර නම් එළාර රජුගේ සෙනෙවියාගේ බලය බිඳ දැමූවා. අසූ රියන් උසැති ව මුල් සෑය වට කොට කංචුක සෑයක් ලෙස මහියංගණ දාගැබ පිළිසකර කරවූයේ ඉන් පසුවයි.


වෝහාරිකතිස්ස රජතුමා මියුගුණ සෑයෙහි කටුකොහොල් අරවා ඡත්‍ර කර්මාන්තාදිය කරවා පෙරහර පැවැත්වූ බව ද ඉතිහාසයේ සඳහන්. ධාතුසේන රජතුමා, දෙවන සේන රජතුමා සහ හතරවන කාශ්‍යප රජතුමා මහියංගණ විහාරයේ අභිවෘද්ධියට කටයුතු කළේ ආදායම් සහිත ගම්වර පුදමින්. පොළොන්නරු යුගයේ මහා විජයබාහු රජතුමා පිළිසකර කළ මහියංගන සෑ රදුන්ගේ ධාතු ගර්භය විසිවන සියවසේ ප්‍රතිසංස්කරණවලදී පුරාවිද්‍යාඥයන්ට හඳුනා ගැනීමට හැකි වුණා. කෝට්ටේ යුගයේ සයවැනි පැරකුම්බා රජතුමා, සෙංකඩගල නගරය පාලන මධ්‍යස්ථානය කොට ගත් වීරවික්‍රම රජතුමා සහ කීර්ති ශ්‍රී රාජසිංහ රජතුමා මහියංගණ සෑයෙහි විවිධ පිළිසකර කිරීම් සහ පුදපූජා පැවැත් වූ අන්දම සඳහන් වෙනවා.

ශ්‍රී මහා බෝධීන් වහන්සේ ලක්දිවට වැඩමවූ පසු පැන නැගි අෂ්ටඵලරුහ බෝධීන් වහන්සේ අතුරින් පඨමක චෛත්‍යස්ථානයේ පිහිට වූ බෝධීන් වහන්සේ ලෙස මහියංගණයේ පිහිටි පෞරාණික බෝධීන් වහන්සේ ජනප්‍රවාදගත ව පවතිනවා. සිංහල බෝධි වංශයේ සදහන් වන්නේ අෂ්ටඵල රුහ බෝධි හට ගැනීමෙන් පසු හට ගත් දෙතිස්ඵලරුහ බෝධීන් වහන්සේ නමක් මහියංගණයේ රෝපණය කර වූ බවයි.

මහියංගණයට නුදුරු ජනපදයක පාලකයා වූ සේලාභය කුමරුන් තම පුතු අනුරාධපුරයේ වෝහාරතිස්ස රජුගෙන් ආරක්ෂා කරනු වස් මියුගුණ වෙහෙරේ බෝ මලුවෙහි පිරිත් මණ්ඩපයෙහි දී පුත් කුමරුගේ මාමා වූ නන්ද හිමියන් වෙත භාර කරවූවා. එළු අත්තනගලු වංසයේ සදහන් වන්නේ සංඝයා වහන්සේලාගේ සහ බෝධීන් වහන්සේගේ ආරක්ෂාවට පත් වූ හෙයින් සංඝබෝධි හෙවත් සිරිසඟබෝ නම් ලද බවයි. බෝ මලුවේ ඇති සෙල්මුවා අසුන එදා සිරිසඟබෝ කුමරුන් තෙරුවනට බාර කළ අසුන ලෙස විශ්වාස කෙරෙනවා.

කීර්ති ශ්‍රී රාජසිංහ රජු දවස සියම් රටින් වැඩම කොට මෙරට උපසම්පදාව පිහිට වූ උපාලි තෙරණුවන් ප්‍රමුඛ හිමිවරුන් මහියංගන මහ සෑය වන්දනා කිරීමට පැමිණ තිබෙනවා.

මහියංගණ රාජමහා විහාරයේ වැඩ සිටින්නේ අස්ගිරි මහා විහාර පරම්පරාවට අයත් මහා සංඝරත්නය යි. ඒ සඳහා විහාරාධිපති හිමි නමක පත් කිරීම සිදු කෙරෙන්නේ රාජ්‍යපස්ථානීය පරමධම්මසභා නම් වූ අස්ගිරි මහා



විහාරාධිපති
**උරුලෑවත්තේ ධම්මරක්ඛිත නාහිමි**

විහාරයේ විංශත් වර්ගික කාරක මහා සංඝ සභාව විසිනු යි. වර්ෂ 1848 පමණ අවධියේ සිට මේ දක්වා ඉඳවලුගොඩ ධම්මපාල නාහිමි, යටවත්තේ චන්ද්‍රජෝති මහ නාහිමි, අඹගස්වැවේ රතනපාල ධම්මපාල මහ නාහිමි, ගුන්නෑපාන සරණංකර මහ නාහිමි, මුල්ලේගම ගුණරතන මහ නාහිමි, උඩුවාවල රේවත නාහිමි, යටවත්තේ ධම්මරතන මහ නාහිමි, උඩුගම රතනපාල මහ නාහිමි, පලිපාන චන්දානන්ද මහ නාහිමි, ගලගම අත්ථදස්සි මහ නාහිමි යන මහ තෙරවරුන් විසින් හෙබවීමෙන් පසු වර්තමානයේ විහාරාධිපති ධුරය දරන්නේ අස්ගිරි මහාවිහාර පාර්ශ්වයේ ජ්‍යෙෂ්ඨ කාරක සංඝ සභික, උපාධ්‍යාය ධුරන්ධර උරුලෑවත්තේ ධම්මරක්ඛිත නාහිමිපාණන් වහන්සේ යි.

බුදුරජාණන් වහන්සේ දඹදිවින් පිටතට වැඩි ප්‍රථම අවස්ථාව මහියංගණයට වැඩමවීම යි. එසේ ම දෙවියකු විසින් මනු ලොව ඉදි කළ ප්‍රථම චෛත්‍යය මහියංගණ සෑරදුන් වහන්සේ යි. රහතන් වහන්සේ නමක් බැඳ වූ එකම සෑරදුන් වහන්සේ ද මහියංගණ සෑයයි. ඓතිහාසික මූලාශ්‍රවල කංචුක සෑයක් පිළිබඳ විස්තර වන ප්‍රථම සෑය ද මෙම සෑරදුන් වහන්සේ යි. විවිධ අමුද්‍රව්‍ය යොදා ගෙන තැන වූ සහ පිළිසකර කළ එකම සෑය ද මෙම සෑරදුන් වහන්සේ යි. මෙවන් අනූන වැදගත්කම්වලින් හෙබි මහියංගණ සෑ රදුන් වහන්සේ මිහිපිට මහානීය පුදබිමක් ලෙස බෞද්ධ ජනතාව අතර වන්දනීයත්වයට පත්වනවා.

වර්ෂ 2021 ක් වූ ඔක්තෝබර් 20 බදාදා කොළඹ ඩී. ආර්. විජයවර්ධන මාවතේ අංක 35 දරණ ස්ථානයේ පිහිටි ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම විසින් මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරන ලදී.